# වාර්ෂික වාර්තාව

## வருடாந்த அறிக்கை

# ANNUAL REPORT

# 2014



ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය

இலங்கை நீதிபதிகள் நிறுவனம்

**SRI LANKA JUDGES' INSTITUTE**

# පටුන


1. අධ්‍යක්ෂවරයාගේ පණිවුඩය
2. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය පිළිබඳ හැඳින්වීමක්
3. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය පිහිටුවීම
4. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ ඓතිහාසික පසුබිම
5. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කළමණාකාරිත්වය සහ කාර්ය මණ්ඩලය
6. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ අරමුදල්
7. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් පවත්වන පුහුණු වැඩසටහන්
8. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කාර්ය සාධනය
9. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කටයුතු
10. ජාත්‍යන්තර සහයෝගීතාව
11. අනාගතයේ දී හඳුන්වා දීමට නියමිත පාඨමාලා
12. අද්විතීය ගිණුම්කරණ ප්‍රතිපත්තිය
13. ඇගයීම
14. ශේෂ පත්‍රය
15. ආදායම් සහ වියදම් ගිණුම
16. මුදල් ගලනය පිළිබඳ ප්‍රකාශය
17. ස්ථාවර වත්කම්
18. 2014 වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාව



## 1. අධ්‍යක්ෂවරයාගේ පණිවුඩය.

2014 වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ වාර්ෂික වාර්තාව සහ අවසානාත්මක විගණන ගිණුම්, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කළමනාකරණ මණ්ඩලය වෙනුවෙන් ඔබ වෙත ඉදිරිපත් කරන්නේ ඉමහත් සතුටිනි. මෙම වාර්ෂික වාර්තාවෙන් පසුගිය 2014 වසර තුළ ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කාර්ය සාධනය සැකෙවින් සඳහන් කරන අතර, ආයතනයේ ප්‍රකාශිත පරමාර්ථ පිළිගත හැකි උපරිම තත්ත්වයකින් සාක්ෂාත් කරගනු ලැබූ ආකාරය මැනවින් විදහා දක්වයි.

විනිශ්චයකාරවරයන්ගේ වෘත්තිමය සංවර්ධනය සහ ඔවුන්ගේ දැනුම වැඩිදියුණු කිරීම පිණිස අඛණ්ඩව ලබාදෙන අධිකරණමය පුහුණුවීම්, පාර්ලිමේන්තුව විසින් පනවන ලද පනතක් මගින් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය පිහිටුවීම කළ අවස්ථාවේ පටන් ම මේ තාක් දක්වා ශ්‍රී ලංකාව තුළ සැලකිය යුතු දීර්ඝ කාලයක් තිස්සේ පැවතගෙන එන කර්තව්‍යයක් බවට පත් වී ඇත. විනිශ්චයකාරවරයන්ගේ ගුණාත්මක කාර්යසාධනය ඉහළ නැංවීම සහ මහජනයා වෙත කාර්යක්ෂම සහ වේගවත් අයුරින් යුක්තියේ පිළිසරණ ප්‍රවේශ කරවීම පිණිස අධිකරණය පිළිබඳ අධ්‍යාපනය, ශ්‍රී ලංකාවේ විනිශ්චයකාරවරුන්ගේ වෘත්තියේ අත්‍යාවශ්‍ය අංගයක් බවට පත් වී ඇත. ශ්‍රී ලංකාවේ මහාධිකරණ විනිශ්චයකාරවරුන්, දිසා විනිසුරුවරුන්, මහෙස්ත්‍රාත්වරුන් සහ කම්කරු විනිශ්චයාධිකාරිවල සභාපතිවරුන් වෙත අධිකරණය පිළිබඳ අධ්‍යාපනය අඛණ්ඩව ම ලබා දීමේ දී ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය ශ්‍රී ලංකාවේ තනි සහ එකම අධිකරණමය ආයතනය වශයෙන් වඩාත් දුර්ලභ ගනයේ වූ සුවිශේෂීත්වයක් පෙන්නුම් කරයි.

2014 වර්ෂය වනාහි ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ පරිපාලනය, පර්යේෂණ සහ අධ්‍යයන කටයුතු සම්බන්ධයෙන් සැලකිය යුතු වෙනසක් ඇති කළ වර්ෂයක් ලෙස හඳුනාගනු ලැබේ. ඇමෙරිකා එක්සත් ජනපදයේ නෙවාඩා දිස්ත්‍රික්කයේ ජෝජ්ථ දිසා විනිශ්චයකාරවරයෙකු වන ගරු ජුඩ්ජ් රොජර් හන්ට් මහතා විසින් ශ්‍රී ලංකාවේ දී පවත්වන ලද විදේශ පුහුණු වැඩසටහන ආයතනය විසින් අත්කරගත් විශිෂ්ට ගනයේ කැපී පෙනෙන ජයග්‍රහණයක් වූ අතර, ඒ අනුව, එතුමා විසින් නඩු කළමනාකරණය සහ සමථකරණ ශිල්පීය ක්‍රම පිළිබඳව සියලූ ම දිසා විනිශ්චයකාරවරුන්ට පුහුණුවක් ලබා දී ඇත. සියලූ ම දිසා විනිවයකාරවරුන් සඳහා මෙම පුහුණු වැඩසටහන සංවිධානය කිරීමට ලැබීම පිළිබඳව සහ ඇමෙරිකා එක්සත් ජනපද ජෝජ්ථ දිසා විනිශ්චයකාරවරයෙකු වන ගරු ජුඩ්ජ් රොජර් හන්ට් මහතාගේ මෙන් ම නඩු කළමනාකරණය සහ සමථකරණය පිළිබඳව පුහුණු සැසිවාර ගණනාවක් ම පවත්වන ලද විනිශ්චයකාරවරයෙකු වන ගරු ක්ලිෆර්ඩ් වොලස් මහතාගේ අත්දැකීම් සහ පළපුරුද්ද අප හා බෙදාහදා

ගැනීමට අපහට මහඟු අවස්ථාවක් ලැබීම පිළිබඳව ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය ඉමහත් ලෙස සතුටට පත් වී ඇත.

සිවිල් නඩු විධාන සංග්‍රහය සංශෝධනය කිරීමට ඉදිරිපත් කළ සංශෝධන, ශ්‍රී ලංකා වාණිජ සමථකරණ මධ්‍යස්ථාන පනත ඉදිරිපත් කිරීම සහ ශ්‍රී ලංකාව තුළ අධිකරණ පදනම් කරගත් අනාගත සමථකරණ වැඩසටහන් සඳහා පළමු වතාවට සමථකරණ රීති සකස් කිරීම ආදී කර්තව්‍යන් වනාහි අනාගත අධිකරණ ප්‍රතිසංස්කරණ විෂයෙහිලා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් තැබූ ප්‍රධාන පෙළේ ඉදිරි පියවර වන බව සැක රහිතව ප්‍රකාශ කරනු කැමැත්තෙමි. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් ඉදිරිපත් කරන ලද නීති ප්‍රතිසංස්කරණ හුදෙක් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන සියලු ම පාර්ශ්වකරුවන්ගේ සැලකිල්ලට බඳුන් වනු ඇති අතර, ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතියේ යහපත උදෙසා එමගින් අවශ්‍ය ප්‍රතිසංස්කරණ ඉදිරිපත් කරනු ඇත.

අධිකරණ නිලධාරින්ගේ පුහුණු අත්පොත පළකිරීම කැපී පෙනෙන වර්ධනීය ප්‍රවනතාවක් වන අතර, මෙම අත්පොත අධිකරණ සේවා කොමිෂන් සභාවේ ඉල්ලීමකට අනුව සකස් කර පළකරන ලදි. මෙම පුහුණු අත්පොත මගින් අධිකරණ පුහුණුවීම්වල අවශ්‍යතාව, එක් එක් විනිශ්චයකාරවරයාගේ තනි තනි අවශ්‍යතාව සහ කාල බාධකය පදනම් කරගෙන, මධ්‍යගත, විමධ්‍යගත හෝ වෙබ් අඩවි පාදක, දූරස්ථ අධ්‍යාපන වැඩසටහන් ඇතුළුව විනිශ්චයකාරවරුන් සඳහා විවිධ මාදිලියේ ඉගෙනුම් වැඩසටහන් ඉදිරිපත් කර ඇත. තව ද, මෙම පුහුණු අත්පොත, ශ්‍රී ලංකාවේ අධිකරණය විසින් මුහුණ දිය යුතු වන අනාගත අභියෝග සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකාවේ අධිකරණ නිලධාරින්ගේ පරිණාම අවශ්‍යතාවන්ට ප්‍රතිචාර දැක්වීම පිණිස සකස් කොට වැඩිදියුණු කරන ලදි.

එමෙන් ම, නඩු කළමනාකරණය, අධිකරණ ශාලාව තුළ තාක්ෂණය භාවිත කිරීම, ඊ=ලිපිගොනු ක්‍රමය, දඬුවම් පැනවීමේ දී අදාළ කරගන්නා නියමු උපදෙස් සහ සමථකරණය වැනි සුවිශේෂී අධිකරණ පුහුණු ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ශ්‍රී ලාංකික විනිශ්චයකාරවරයන් වෙත පුහුණුවීම් ලබාදීම පිණිස කීර්තිමත් විදෙස් අධිකරණ විද්වතුන් සමග මනා සම්බන්ධතාවක් ගොඩනඟා ගැනීම 2014 වර්ෂයේ දී ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය ලැබූ තවත් එක් සුවිශේෂී ජයග්‍රහණයක් වශයෙන් සනිටුහන් කිරීමට කැමැත්තෙමි. ශ්‍රී ලාංකික විනිශ්චයකාරවරයන්ට පුහුණුවීම් අවස්ථා සැපයීම සහ ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය සමග අධ්‍යයනමය සහසම්බන්ධතාවයක් ගොඩනගා ගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය ඉන්දියාවේ ජාතික අධිකරණ ඇකඩමිය, මලයාසියාවේ අධිකරණ සහ නීති පුහුණු ආයතනය, සිංගප්පූරුවේ සිවිල් සේවා විද්‍යාලය, නවදිල්ලි නුවර පිහිටි නවදිල්ලි අධිකරණ ඇකඩමිය සහ ඇමෙරිකා එක්සත් ජනපදයේ ෆෙඩරල් අධිකරණ මධ්‍යස්ථානය වෙත ස්වකීය අවංක ස්තුතිය පළකර සිටිනු ලැබේ.

පසුගිය වසරේ ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් අත්කරගත් යථෝක්ත සමහරක් ජයග්‍රහණ ආයතනයේ කළමනාකරන මණ්ඩලය විසින් මෙන් ම වෙනත් සුවිශේෂී පුද්ගලයන් ගණනාවක් විසින් ලබාදුන් සහයෝගය නිසාම සඵල වූ සැබෑ ජයග්‍රහණ බවට පත් වූ අතර, ඔවුන්ගේ දැක්ම

අධිෂ්ඨානය සහ මාර්ගෝපදේශකත්වය නොතිබෙන්නට නිසැකයෙන් ම එවැනි ජයග්‍රහණ අත්කර ගැනීමට ආයතනයට නොහැකි වනු ඇත. මේ සම්බන්ධයෙන් අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරිය වශයෙන් කටයුතු කළ කමලිනී ද සිල්වා මහත්මිය මෙන් ම අධිකරණ අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය එනම් විශේෂයෙන් ම අධිකරණ අමාත්‍යාංශයේ පාලන අංශයේ සහ ගිණුම් අංශයේ නිලධාරින් විසින් ලබාදුන් අවංක සහයෝගය මෙහිලා විශේෂයෙන් ම සඳහන් නොකළහොත් එය මා විසින් මාගේ රාජකාරිය නිසැකයෙන් ම පැහැර හැරීමක් විය හැකි බැවින් එම සියලු ම නිලධාරින් වෙත මාගේ සුවිශේෂී කෘතඥතාව මෙහිලා පළකර සිටිනු කැමැත්තෙමි.

එමෙන් ම, අනේකවිධ අභියෝගයන් හමුවේ නොසැලී සිටිමින් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ පරමාර්ථ සහ ඉලක්ක සාක්ෂාත් කරගැනීම පිණිස වෙහෙස නොබලා කැපවීමෙන් කටයුතු කළ ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කාර්ය මණ්ඩලය වෙත ද මාගේ අවංක ස්තුතිය පළකර සිටිමි. රාජකාරිය ඉටුකිරීමේ දී කැපවීමෙන් යුක්තව ඉමහත් පරිශ්‍රමයකින්, උත්නඳුවකින් සහ සහයෝගීතාවයකින් කටයුතු කළ ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ සියලු ම නිලධාරින්ට අවසාන වශයෙන් මාගේ හෘදයාංගම සහ කෘතඥතා පූර්වක  ප්‍රණාමය මෙහිලා පළකරනු කැමැත්තෙමි.

අපගේ ආයතනය එළඹෙන වර්ෂයේ දී තවදුරටත් ශක්තිමත් වනු නොඅනුමානය.,

***රුවන් ප්‍රනාන්දු.***
***එල්.එල්.එම්.(වාණිජ නීතිය) කාඩිෆ් විශ්ව විද්‍යාලය - එක්සත් රාජධානිය***
***බුද්ධිමය දේපළ අයිතිවාසිකම් පිළිබඳ පශ්චාත් නීතිඥ ඩිප්ලෝමාව. (ශ්‍රී ලංකා)***
***මහාධිකරණ විනිසුරු සහ ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ අධ්‍යක්ෂ***

## 2. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය පිළිබඳ හැඳින්වීමක්.

### දැක්ම

සියලු දෙනාට ම විශ්වසනීය, අපක්ෂපාතී, ස්වාධීන, පරිශීලක මිත්‍ර සහ ප්‍රවේශ විය හැකි අධිකරණ ක්‍රමයක් සාක්ෂාත් කරගැනීම පිණිස විනිශ්චයකාරවරයන්ගේ වෘත්තීමය විශේෂඥතාව වැඩිදියුණු කිරීම සහ ඔවුන්ගේ දැනුම ප්‍රවර්ධනය කිරීම උදෙසා විනිශ්චයකාරවරයන් විෂයෙහිලා අධිකරණමය පුහුණුවීම් ලබා දීමේ දී සහ ඉතාමත් ඉහළ මට්ටමේ පුහුණුවීම් සහ පර්යේෂණ පහසුකම් සැපයීමේ දී විශිෂ්ට ගණයේ ආයතනයක් වශයෙන් ක්‍රියා කරන්නෙමු.

### මෙහෙවර

විවිධ වැඩසටහන් සහ ක්‍රියාකාරම් හරහා අධිකරණ නිලධාරින්ගේ වාත්තීමය විශේෂඥතාව සහ යුක්තියේ ගුණාත්මකභාවය වර්ධනය කිරීම පිණිස ඉහළ මට්ටමේ දැනුමක් සහ කුසලතාවක් අධිකරණ නිලධාරින්ට ලබාදීම හරහා ආයතනයේ දැක්ම සාක්ෂාත් කර ගැනීමට ක්‍රියා කරන්නෙමු. ඒ අනුව, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් පහත සඳහන් පරමාර්ථ සපුරා ගැනීමට දායක වෙමින් ස්වකීය මෙහෙවර පරිපූර්ණ කර ගැනීමට අපේක්ෂාවෙන් කටයුතු කරයි. එම පරමාර්ථ මෙසේ ය.

- අධිකරණ නිලධාරින් සඳහා අඛණ්ඩ පුහුණුව ලබාදීම ;
- පර්යේෂණ, ප්‍රකාශන පළකිරීම සහ තාක්ෂණික සහාය ලබාදීම හරහා අධිකරණ නිලධාරින්ට සහයෝගිතාව දැක්වීම ;
- අධිකරණ සහ නෛතික කාරණාවන් පිළිබඳව අධිකරණ නිලධාරින් විසින් අදහස් හුවමාරු කරගැනීමට පහසුකම් සැලැස්වීම ;
- අධිකරණ නිලධාරින්ගේ වෘත්තීමය විශේෂඥතාව වැඩිදියුණු කිරීම සහ ඔවුන්ගේ දැනුම සහ කුසලතාවය වර්ධනය කිරීම ඉලක්ක කරගෙන සම්මන්ත්‍රණ, සම්මේලන, දේශන සහ වැඩමුළු සංවිධානය කිරීම සහ පැවැත්වීම ;
- ප්‍රමාදය අවම කිරීමේ දී නඩු කළමනාකරණය සහ නඩු ප්‍රවාහ කළමනාකරණය මගින් වැඩිම යහපත ගෙන දෙන පරිචයන් සාක්ෂාත් කරගැනීම පිණිස මාර්ගෝපදේශ සංවර්ධනය කිරීමට දායක වීම ;
- යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියේ විවිධ අංශ පිළිබඳව පර්යේෂණ කටයුතු ඉටුකිරීම ;
- විනිශ්චයකාරවරයන් ඉලක්ක කරගෙන පුස්තකාල සහ වෙබ් අඩවි පාදක, අධ්‍යාපන පහසුකම් සැපයීම සහ නීතිමය තොරතුරු සහ කාරණාවන් ව්‍යාප්ත කිරීම ;

- අන්තර්ජාතික අධිකරණ ආයතන සමග අන්තර් සහයෝගීතාවය පවත්වාගෙන යාම ;
- අධිකරණ ක්‍රමය තුළ මහජන භාරය සහ විශ්වාසය ආරක්ෂා කිරීම පිණිස නඩු කියන්නන්ට පිරිසරණ සැපයීම සම්බන්ධයෙන් නීති ප්‍රතිසංස්කරණවලට දායකවීම ;
- යුක්තිය පසිඳලීම සහ යුක්තියට ප්‍රවේශ වීම සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්ති සහ කාර්ය පටිපාටි සංවර්ධනය කොට ක්‍රියාත්මක කිරීම උදෙසා දායකත්වය සැපයීම ;

## 3. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය පිහිටුවීම.

පාර්ලිමේන්තුව විසින් පනවන ලද 1985 අංක 46 දරන ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය පනත මගින් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය පිහිටුවන ලදි. විනිශ්චයකාරවරයන්ගේ ආයතනයක් පිහිටුවීම සඳහා ද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා ද මෙම පනතින් විධිවිධාන සලස්වා ඇත.

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය පිහිටුවීමේ පරමාර්ථ පහත දැක්වේ.

1. අධිකරණ නිලධරයන් විසින් අධිකරණමය සහ නෛතික කාරණා සම්බන්ධයෙන් මත සහ අදහස් හුවමාරු කරගැනීම සඳහා පහසුකම් සැලැස්වීම ;
2. අධිකරණ නිලධරයන්ගේ වෘත්තීය ප්‍රවීණත්වය වැඩි දියුණු කිරීමේ සහ ඔවුන්ගේ දැනුම සහ කෞශල්‍යය වර්ධනය කිරීමේ අදහසින්, රැස්වීම්, සම්මේලන, දේශන, වැඩමුළු සහ සම්මන්ත්‍රණ සංවිධාන කිරීම සහ පැවැත්වීම;
3. යුක්තිය පසිඳලීම පිළිබඳ විවිධ අංශ සම්බන්ධයෙන් පුහුණුවීමේ සහ පර්යේෂණ පාඨමාලා සකස් කිරීම සහ පැවැත්වීම ;
4. අධිකරණ නිලධරයන් සඳහා පුස්තකාල පහසුකම් හා වෙනත් අධ්‍යාපනික උපකරණ සැපයීම ;

## 4. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ ඓතිහාසික පසුබිම.

විනිශ්චයකාරවරන්ගේ වෘත්තිමය ප්‍රමිතීන් වැඩිදියුණු කිරීමේ දී ශ්‍රී ලංකා විනිශ්චයකාරවරන්ගේ ආයතනය ශ්‍රී ලංකාව තුළ තනි හා එකම අධිකරණමය ආයතනය වශයෙන් වඩාත් දුර්ලභ ගණයේ සුවිශේෂිත්වයක් පෙන්නුම් කරයි.

ශ්‍රී ලාංකික අධිකරණ නිලධරයන් සඳහා අධිකරණ විෂය පිළිබඳව හැදෑරීමට අවකාශ සැලකීමේ දී, විනිශ්චයාසනය හොබවන විනිශ්චයාකාරවරයා සමීපයෙහි අසුන්ගෙන සති කිහිපයක් පුරාවට අධිකරණ ශාලාවේ කටයුතු නිරීක්ෂණය කිරීම වනාහි, ශ්‍රී ලංකා විනිශ්චයකාරයන්ගේ ආයතනය පිහිටුවීමට පෙර කාලයේ දී අලුත් පත්වීම් ලද අධිකරණ නිලධරයන් අධිකරණ රාජකාරිවල වැඩ භාරගැනීමට පෙර ලැබූ එකම පුහුණුව බවට පත්ව තිබුණි. යුක්තිය පසිඳලීම කරන විනිශ්චයකාරවරයන් ස්වකීය අධිකරණ වෘත්තිය ආරම්භ කිරීමට පෙරාතුව පමණක් නොව, ස්වකීය අධිකරණ වෘත්තිය තියැලෙන සමස්ථ කාලය පුරාම පුහුණුවීම් ලබාගත යුතු බවට දැඩි ලෙස විශ්වාස කරනු ලැබේ. ඒ අනුව, සියලු ම මට්ටමේ අධිකරණ නිලධරයන් විසින් අඛණ්ඩ පදනමක් මත අධිකරණමය පුහුණුව ලබාගන්නා, අධිකරණ නිලධරයන් සඳහා ම වෙන් වූ පරිපූර්ණ සහ අඛණ්ඩ පුහුණු ආයතනයක් සැලසුම් කොට පිහිටුවීම කළයුතු බවට ඉක්බිතිව අවබෝධ කර ගන්නා ලදි.

විනිශ්චයකාරවරයන් සඳහා ආයතනයක් පිහිටුවීම පිළිබඳ අදහස මුල්වරට සාකච්ඡාවට භාජනය කළේ එවකට අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් ධූරය හෙබ වූ පී.බී.හේරත් මහතා විසිනි. ප්‍රංශය තුළ ක්‍රියාත්මක වන එවැනි ආයතනයක් සියැසින් දැක බලා ගැනීමෙන් අනතුරුව 1982 වර්ෂයේ දී ඒ පිළිබඳව එතුමා විසින් ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ පුවත්පත් සගරාවකට පුවත් ලිපියක් ලියන ලදි. නමුත් සුපුරුදු ලෙස ඒ සම්බන්ධයෙන් කිසිවක් සිදු නොකරන ලද අතර, එම කාරණය සාකච්ඡාවට භාජනය කළ ද, ඊට ප්‍රමාණවත් ඇහුම්කන් දීමක් සිදු නොවිය. අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයෙකු වශයෙන් ක්‍රියා කරමින් විනිශ්චයකාරවරයන්ගේ ආයතනයක් පිහිටුවීම පිළිබඳව පළමු වරට සාකච්ඡා කළ පී.බී.හේරත් මහතා එකී ආයතනය පිහිටුවීම දිරිමත් කිරීමේ ස්ථිරසාර ප්‍රබල මූලාශ්‍රයක් වශයෙන් ක්‍රියා කළ අතර, ආයතනයේ ප්‍රබලතම මට්ටමේ හිතෛෂී කොටස්කරුවෙකු බවට පත් විය.

ඒ අනුව, විනිශ්චයකාරවරුන් සඳහා සේවාස්ථ අඛණ්ඩ නීති අධ්‍යාපනයක් සැපයීම පිණිස විනිශ්චයකාරවරයන් සඳහා වන ආයතනයක් පිහිටුවීම පිණිස ඔහු විසින් ක්‍රියා කළ අතර, විනිසුරු ගරු ජේ. එෆ්. සෝසා මැතිතුමා 1984 මැයි මස 22 වන දින ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ අධ්‍යක්ෂවරයා වශයෙන් පත් කරන ලදි. අරමුදල් සැපයීම පිළිබඳ ගැටළුව ආසියානු පදනමේ නේවාසික නියෝජිත ජෝන් ගුයේ මහතා සමග එවන විටත් සාකච්ඡා කර තිබුණි. ආයතනය පිහිටුවීම පිණිස පළමුවෙන් ම කළ යුතුව තිබුණේ ඊට උචිත පරිශ්‍රයක් සොයා බලා තෝරා ගැනීමයි. ඒ අනුව, විවිධ විකල්ප පරිශ්‍රයන් හඳුනා ගැනීමෙන් පසුව, ශ්‍රී ලංකා පදනම් ආයතනයේ උප ගෘහය වසරක කාලයක් සඳහා බද්දට ගන්නා ලද අතර, ඊට අවශ්‍ය ගෘහ භාණ්ඩ සැපයීමට ද කටයුතු කරන ලදි. මෙම සියලු ම කටයුතු ආසියානු පදනමේ මූල්‍ය අනුග්‍රහය හරහා සිදු විය. ඉන් අනතුරුව සමහරක් සම්මන්ත්‍රණ පවත්වන

ලද නමුත්, රජයේ අනුමැතිය ලබාගත යුතු බැවින්, අවස්ථාවෝචිත පරිදි පමණක් වැඩසටහන් දියත් කරන ලදි. ආමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් සකස් කරන ලද නමුත්, රජයේ අනුමැතිය ලබාගත හැකිවේ ද යන්න, පැහැදිලි කාරණයක් නොවිය.

අද්විතිය මට්ටමේ දේශන සමහරක් පවත්වන ලද අතර, එම කතිකාවත් ඉතාමත් ඉහළ මට්ටමේ ප්‍රමිතියකින් යුක්ත ඒවා විය. මෙම දේශනවල ආරාධිත දේශකයා බවට පත් වූයේ ගරු ජුඩ්ජ් ක්ලිපපර්ඩ් වොලස් මහතා වූ අතර, එතුමා නීති ක්‍රම සහ අධිකරණ පරිපාලනය පිළිබඳ ආසියාතු පදනමේ ජ්‍යෙෂ්ඨ උපදේශකවරයා වූ අතර, එක්සත් ජනපදයේ අභියාචනාධිකරණයේ අධිකරණ මණ්ඩල නවයක කීර්තිධර විනිශ්යකාරවරයෙකු විය. ඒ අනුව, විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ සමාරම්භය එලෙසින් සිදු විය.

විශ්පිය ඝණයේ බුද්ධිමතකු සහ පරිකල්පණයේ අද්විතීය මිනිසෙකු වූ ගරු ආචර්ය ඒ.ආර්.බී. අමරසිංහ මැතිතුමා ආයතනයේ කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීමට සැදී පැහැදී උර දී සිටීම භාග්‍යයක් විය. ඔහුගේ නාමය විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ ප්‍රභවය සම්බන්ධයෙන් අවධාරණය කළයුතු වන්නේ ඔහු විසින් දරන ලද උත්සාහයේ ප්‍රතිඵලය 1985 නොවැම්බර් මස 20 වන දින සහතිකය සටහන් කරන ලද 1985 අංක 46 දරන ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය පාර්ලිමේන්තුව විසින් පනතක් මගින් පනවනු ලැබීම නිසාය. විනිසුරු සෝසා මැතිතුමා ආයතනයේ අධ්‍යක්ෂවරයා වශයෙන් 1986 ජනවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි විධිමත් ලෙස පත් කරන ලදි. එතැන් පටන් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් සම්මන්ත්‍රණ, වැඩමුළු, පුහුණු වීම් සහ උපදේශාත්මක සේවාවන් සැපයීම හරහා අධිකරණ නිලධරයන් සඳහා හැකි සෑම අවස්ථාවක දී ම සේවය කර ඇත. තව ද, 1990 වර්ෂයේ දී විනිසුරු ගරු කේ. විග්නරාජා මැතිතුමා ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයා වශයෙන් ද, පී. නෙවිල්. ඒ. ද සිල්වා මහතා අගවිනිසුරු ලේකම් කාර්යාලයෙන් විශ්‍රාම යාමෙන් ඉක්බිතිව ආයතනයේ ලේකම්වරයා වශයෙන් ද සම්බන්ධ වීමෙන් විනිසුරු සෝසා මැතිතුමාට සහාය ලබා දීම ද විශේෂයෙන් අගය කළ යුතුය.

ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන් අතුරින් පත් කරන ජ්‍යෙෂ්ඨත ම විනිශ්චයකාරවරයන් දෙදෙනෙකු සහ නිල බලයෙන් ගරු අග්‍රවිනිශ්චයකාරවරයා සභාපති ධූරය හොබවන කළමණාකාර මණ්ඩලයක් මගින් විනිශ්චයකාරවරයන්ගේ ආයතනය පාලනය වේ. ආයතනයේ පරිපාලනය සහ කළමණාකරණය කළමණාකරණ මණ්ඩලය සතු විය යුතුය.

ආයතනයේ පරමාර්ථ පහත දැක්වේ.

1. අධිකරණ නිලධරයන් විසින් අධිකරණමය සහ නෛතික කාරණා සම්බන්ධයෙන් මත සහ අදහස් හුවමාරු කරගැනීම සඳහා පහසුකම් සැලැස්වීම ;

2. අධිකරණ නිලධරයන්ගේ වෘත්තීය ප්‍රවීණත්වය වැඩි දියුණු කිරීමේ සහ ඔවුන්ගේ දැනුම සහ කෞශල්‍යය වර්ධනය කිරීමේ අදහසින්, රැස්වීම්, සම්මේලන, දේශන, වැඩමුළු සහ සම්මන්ත්‍රණ සංවිධාන කිරීම සහ පැවැත්වීම ;

3 යුක්තිය පසිඳලීම පිළිබඳ විවිධ අංශ සම්බන්ධයෙන් පුහුණුවීමේ සහ පර්යේෂණ පාඨමාලා සකස් කිරීම සහ පැවැත්වීම ;

4. අධිකරණ නිලධරයන් සඳහා පුස්තකාල පහසුකම් හා වෙනත් අධ්‍යාපනික උපකරණ සැපයීම ;

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ පළමු සභාපතිවරයා වූයේ එකී ආයතනය වෙත ඉමහත් උද්යෝගයකින් සහාය පළකළ හිටපු අගවිනිසුරු ගරු එස්. ෂර්වානන්ද මැතිතුමාය. ඉක්බිතිව අග්‍රවිනිශ්චයකාරවර ගරු පාරින්ද රණසිංහ මැතිතුමා සභාපති ධූරයට පත්විය. එතුමා අධිකරණයේ ම සාමාජිකයෙකු වූ අතර, ආයතනයේ කටයුතුලට ස්වකීය අවංක අගනා කැපවීම ප්‍රදර්ශනය කළේය. එතුමා ආයතනයේ සියලූ ම සම්මන්ත්‍රණ සහ ක්‍රියාකාරකම්වලට සහභාගී විය. එතුමා විසින් මෙම සම්මන්ත්‍රණවල දී නීතිඥවරුන් සහ මිනින්දෝරුවරුන් සමග සාකච්ඡා පවත්වන ලද අතර, ගරු විනිශ්චයාසනය සහ නීතිඥ සංගමය අතර සුහද සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීම පිණිස අධීක්ෂණ කමිටු ද පිහිටුවන ලදි.

ඉන් පසුව, කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස ඒවන විටත් සේවය කර තිබූ විනිසුරු ගරු තම්බයියා මැතිතුමා ගරු අග්‍රවිනිශ්චයකාරවරයා විසින් කළමණාකරණ මණ්ඩලයේ සභාපති ධූරයට පත් කරන ලද අතර, ඔහු විසින් ආයතනයේ අභිවෘද්ධිය වෙනුවෙන් ඉතාමත් වැදගත් දායකත්වයක් ඉටු කරන ලදි. එවකට අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා වශයෙන් කටයුතු කළ ඒ. එස්. විජේතුංග මහතා ආයතනයේ පරමාර්ථ සඵල කර ගැනීම පිණිස දැඩි උත්සාහයක් දරමින් ප්‍රමුඛ පෙළේ අනගි භවනීය කාර්ය භාරයක් ඉටු කරන ලදි. අභියාචනාධිකරණයේ සභාපති විනිසුරුවරයා වශයෙන් කටයුතු කළ අවධියේ දී ඔහු විසින් ආයතනයට ඉටු කල චිරස්ථායි මෙහෙවර තවමත් ප්‍රකටය. එතුමාගේ අනුප්‍රාප්තිකයා බවට පත් වූයේ ලාල් පීරිස් මහතාය. ඔහුගේ සහාය වූ එස්. විතානාරච්චි මහතා විසින් ද ආයතනයේ අභිවෘද්ධිය සහ දියුණුව පතා නොපසුබට මෙහෙවරක යෙදුණේය. ආයතනයේ සුභසිද්ධිය උදෙසා ඔවුන් විසින් අභිලාෂවත් සැලකිල්ලක් දක්වා ඇති අතර, ඔවුන් ආයතනයට වැරගැන්වූ ශක්තිමත් ටැඹක් වූවාට නිසැකය.

කලින් ජෝන් ගුයර් මහතා ප්‍රධානත්වය හෙබවූ ද, ඉන්පසුව නික් ලැන්ග්ටන් මහතා ප්‍රධානත්වය හෙබවූ ද, ආසියානු පදනමට ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් සිය ස්තුතිය මෙහි දී පළකර සිටිනු ලැබේ. ආයතනයේ වර්තමාන මනා තිරසාර පැවැත්ම උදෙසා ආසියානු පදනම විසින් ලබාදුන් අගනා සහයෝගයට ආයතනයෙ නොමඳ කෘතඥතාව හිමි විය යුතුය. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය එනාහි ප්‍රමුඛත්වයෙහිලා සැලකිල්ලට භාජනය කළයුතු ආයතනයක් වන අතර, සිය ත්‍යාගශීලීත්වයේ අර්ථලාභියෙකු වන බවට ප්‍රකාශ කරන්නේ ඉතාමත් සාඩම්බරයෙනි. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය පසු අවස්ථාවක අළුත් කඩේ පිහිටි ශ්‍රේෂ්ඨාධිකරණයේ පරිශ්‍රයක පිහිටුවන ලද අතර, නඩත්තු කිරීමේ වියදම් රජය විසින් දරන ලදි.

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් නඩු විභාග කරන විනිශ්චයකාරවරයන් සඳහා පුහුණු වැඩසටහන් සකස් කිරීමේ දී අධිකරණමය කාරණාවන් සම්බන්ධයෙන් වන විටක දී අභියාචනා අධිකරණ බලය ඇති අධිකරණවල ජ්‍යෙෂ්ඨ විනිශ්චයකාරවරයන්ගේ විශේෂඥතාව සහ පළපුරුද්ද ද, පරිපාලනමය

කාරණාවන් සම්බන්ධයෙන් වන විටක දී අධිකරණ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරින්ගේ සහයෝගය ද ලබාගෙන ඇත. 1990 වර්ෂයේ නොවැම්බර් මාසයේ දී කැලිෆෝනියාවේ පිහිටි අධිකරණ අධ්‍යාපනය සහ පර්යේෂණ මධ්‍යස්ථානයේ විධායක අධ්‍යක්ෂ ආචාර්ය පෝල් එම්ලී මහතා ශ්‍රී ලංකාවට ගෙන්වා අධිකරණ විෂය සම්බන්ධ විස්තීර්ණ අධ්‍යාපනික පුහුණු ක්‍රමවේදයක් නෛවසරක තියමු පදනමින් ලබාදීමට ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයට හැකි වීම පිණිස ව්‍යාපෘතියක් සකස් කරන ලදි. එම ව්‍යාපෘතියේ සුවිශේෂී අංග ලක්ෂණ පහත දැක්වේ.

1. ශ්‍රී ලංකාවේ අධිකරණයට අලුතෙන් පත්වන අධිකරණ නිලධරයන්ගේ අධිකරණමය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම සහ කෞශල්‍යය යාවත්කාලීන කොට ප්‍රගුණ කරගනිමින් ඉදිරියටත් ස්වකීය අධ්‍යාපනය නොකඩවා ම කරගෙන යාම පිණිස අර්ධ වාර්ෂික වෘත්තීය අධ්‍යාපන වැඩසටහන හඳුන්වා දීම ;

2. දිසා අධිකරණ සහ මහාධිකරණවලට අලුතෙන් උසස්වීම් ලබන විනිශ්චයකාරවරයන් සඳහා වෙන් වෙන් වූ මාසික සේවාස්ථ සමාරම්භක වැඩ සටහන් දියත් කිරීම ;

3. නව නෛතික ප්‍රවනතාවන්, පොදු සහ සුවිශේෂී අධිකරණ ගැටලු විසඳීම සහ දේශීය අධිකරණ පරිචයන්, කාර්ය පටිපාටි ප්‍රමිතිගත කිරීම පිළිබඳ නූතනමය අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි සකස් කිරීමේ දී පිළිවෙලින් මහෙස්ත්‍රාත්වරයන්ට, දිසා විනිසුරුවරයන්ට, අභියාචනාධිකරණ විනිශ්චයකාරවරයන්ට සහාය ලබා දීම පිණිස වාර්ෂික සේවාස්ථ අඛණ්ඩ අධ්‍යාපන සම්මන්ත්‍රණ පැවැත්වීම ;

4. අධිකරණ කළමනාකරණය, සන්නිවේදන කෞශල්‍යය, කාන්තාවන් සහ සුළු ජනවාර්ගික කොටස් සඳහා අධිකරණ ශාලාව තුළ සාධාරණත්වය ඉටු කිරීම, අධිකරණ විෂය ගවේෂක, තීරණ ගැනීම, සහ නීති ශාස්ත්‍රය, මනුෂ්‍යත්වය, පවුල් නීතිය, ළමා අධිකරණ නීතිය, අපරාධ නීතිය, සිවිල් නීතිය, ප්‍රොබේට් සහ මානසික සෞඛ්‍යය පිළිබඳ නීතිය, ඉඩම් සහ බෙදුම් නඩු නීතිය, මෙන් ම මානව අයිතිවාසිකම් පිළිබඳ නීතිය වැනි ඉතා වැදගත් අධිකරණ විෂයන් පිළිබඳව කාලීනව සති එකක උසස් අධිකරණ අධ්‍යාපන වැඩ සටහන් හඳුන්වා දීම ;

5. ශ්‍රව්‍ය සහ දෘශ්‍ය වශයෙන් පටිගත කළ අධ්‍යාපන කරුණු. (අධිකරණවල දී විනිශ්චයකාරවරයන් සඳහා මූලික පුස්තකාල පහසුකම්) ඇතුළුව අධිකරණ සඳහා විස්තීර්ණ දෛනික වැඩ මෙවලම් අංග (විනිශ්චයාසන පොත්, කතිත වචනයෙන් සහ ලිඛිත ආකාරයෙන් පරීක්ෂණ ලැයිස්තු, අත්පොත් සහ වෙනත් පරිශීලන පොත්පත්) හඳුන්වා දීම ;

6. විනිශ්චයකාර ගුරු ඇදුරන් සඳහා කාර්යක්ෂම අධිකරණ පීඨ සංවර්ධන වැඩසටහන් හඳුන්වා දීම ;

7. අධිකරණ මෙහෙයුම් ක්‍රියාවලිය වැඩි දියුණු කිරීමට, අධිකරණ නඩු ප්‍රමාදය මැඩලීමට සහ විනිශ්චයකාරවරයන් සඳහා අවාර විද්‍යාත්මක පැවැත්ම සහ මහජන වගකීම වැඩිදියුණු කිරීමට සිදු කරන පර්යේෂණ, ඉඩම් සංවර්ධන වැඩසටහන් හඳුන්වා දීම ;

8. යථෝක්ත අධිකරණ ක්‍රමය දියත් කිරීම පිණිස සුදුසු පංති කාමර, කාර්යාල, ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ සහ වෙනත් සම්පත් සැලසුම් කිරීම, කුලියට ගැනීමේ හැකියාව සලකා බැලීම හෝ අනාගතයේ ඉදිකිරීමට පියවර ගැනීම :

මෙම ව්‍යාපෘතියේ අරමුණු වන්නේ යුක්තියේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සහ නීතියේ ආධිපත්‍ය සවිබල ගැන්වීමයි. මක්නිසාද යත්, සාධාරණ, වේගවත් සහ කාර්යක්ෂම ලෙස යුක්තිය පසිඳලීම පිණිස අධිකරණයේ සාමාජිකයන් තමන්ට පැවරී ඇති භූමිකාව සහ වගකීම් ඉටු කිරීමට මැනවින් සන්නද්ධ වී සිටීම අවශ්‍ය වේ. මෙම අරමුණු සඵල කරගැනීම පිණිස අලුතින් පත්වීම් ලබන විනිශ්චයකාරවරයන්ට සිය ධුරවල වැඩ භාර ගැනීමේ දී විධිමත් පුහුණුවක් ලබාදීම අවශ්‍ය වනවාක් මෙන් ම ඔවුන් සිය ධුරය හොබවන සමස්ථ වෘත්තිය කාලය පුරාම සිය අධ්‍යාපනය නොකඩාව ම කරගෙන යාම අවශ්‍ය වේ. යුක්තියේ ගුණාත්මකභාවය විනිශ්චයකාරවරයන් කොපමණ ප්‍රමාණයකට යහපත් මට්ටමින් පවතින්නේ ද යන කාරණය මත රඳා පවතී. පසිඳලන යුක්තිය එය පසිඳලන විනිශ්චයකාරවරයාගේ තරමට ම හුදකලා විය යුතුය. නීතියේ ආධිපත්‍යයට කැපවී සිටින ලෝකයේ සියලූ ම තැනැත්තන් මෙම තත්වය වටහා ගෙන තිබෙන අතර, විනිශ්චයකාරවරයන් සඳහා පුහුණු වීම් සහ අධ්‍යාපන වැඩසටහන් පවත්වාගෙන යනු ලැබේ.

මෙම කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය ශ්‍රේෂ්ඨාධිකරණ පරිශ්‍රයේ අංක 1308 දරන කාමරයේ ස්ථාපිත කරන ලදි. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කළමණාකරණ මණ්ඩලය විසින් අභියාචනාධිකරණයේ විශ්‍රාමික විනිශ්චයකාරවරයෙකු වූ ගරු කේ. විග්නරාජා මැතිතුමා ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා ලෙස පත් කරන ලද අතර, විනිසුරු ගරු ජේ.එෆ්.ඒ.සෝසා මැතිතුමා විසින් අධිකරණ නිලධරයන් සඳහා සේවාස්ථ පුහුණු වැඩසටහන් පවත්වන ලදි. කේ.විග්නරාජා මැතිතුමා ආයතනයේ සිය ධුරයෙන් නික්ම ගිය ඉක්බිතිව අභියාචනාධිකරණයේ විශ්‍රාමික විනිසුරුවරයෙකු වූ ගරු එස්. ජේ. ඩී. ද සිල්වා විජේරත්න මැතිතුමා 1986 වර්ෂයේ දී ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා වශයෙන් වැඩ භාරගන්නා ලදි. ඉන්පසුව අභියාචනාධිකරණයේ විශ්‍රාමික විනිශ්චයකාරයෙකු වූ ගරු පී. එච්. කේ. කුලතිලක මැතිතුමා 2002 වර්ෂයේ දි ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා වශයෙන් පත් කරන ලද අතර, නීතිපති දෙපාර්තමේන්තුවේ සාමාජිකයෙකු වශයෙන් ද, මහාධිකරණ විනිශ්චයකාරවරයකෙු වශයෙන් ද, අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද, කටයුතු කිරීමෙන් ඉක්බිතිව එතුමා ලබා තිබූ හසල දැනුම සහ පළපුරුද්ද ශ්‍රී ලංකා විනිශ්චකාරවරයන්ගේ ආයතනයට මහගු සම්පතක් වූ අතර, එතුමා අධිකරණ නිලධරයන්ට ගුරු ඇදුරුතුමෙකු විය.

අගවිනිසුරුවරයෙකු වූ ගරු ජී. පී. එස්. ද. සිල්වා මැතිතුමා විශ්‍රාම යාමෙන් පසුව විනිසුරු ගරු සරත් එන්. සිල්වා මැතිතුමා 2000 වර්ෂයේ දී අග්‍ර විනිශ්චයකාර ධූරයට පත් කරන ලදි. අග්‍ර විනිශ්චයකාර ගරු සරත්. එන්. සිල්වා මැතිතුමා විනිශ්චයකාරවරුන්ගේ ආයතනයේ ප්‍රගමනයේ දී වැරගැත් වූ සවිමත් ටැඹක් බවට පත්විය. කොළඹ -07 විජේරාම මාවතේ පිහිටි එතුමාගේ නිල නිවාසය විනිශ්චයකාරවරයන්ගේ ආයතනය වශයෙන් භාවිතා කිරීමට එතුමා විසින් අවසර ප්‍රදානය කරන ලද අතර, අධිකරණ නිලධරයන් සඳහා වන පුහුණු වැඩසටහන් පවත්වාගෙන යාම පිණිස නීති සහ අධිකරණ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියේ අරමුදල් ලබා ගැනීමට අවස්ථාව උදා කර දෙන ලදි.

අධිකරණ, නීති ප්‍රතිසංස්කරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ නීති සහ අධිකරණ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියේ සහයෝගිතාව ඇතිව අධිකරණ නිලධරයන් සඳහා විදේශීය ශිෂ්‍යත්ව ක්‍රමය ආරම්භ කිරීම මගින් ගරු අගවිනිසුරු සරත් එන්. සිල්වා මැතිතුමා විසින් දිගුකාලීන අධිකරණ පුහුණු වැඩසටහන ආරම්භ කිරීමට මුල පිරිය. කාර්යක්ෂමව සහ ප්‍රවීණත්වයකින් යුතුව ආරවුල් විසඳීමට හැකි නූතන අධිකරණ පද්ධතියක් පිහිටුවීම මෙම ව්‍යාපෘතියේ එක් අරමුණක් බවට පත් වී තිබුණි. වාණිජ නීතිය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් අලුතින් පත්වීම් ලද සහ සේවාස්ථ විනිශ්චයකාරවරයන් යන දෙකොටස ම ආවරණය වන පරිදි පුහුණු වැඩසටහන් සඳහා අරමුදල් සැපයීම සහ විස්තීරණ පුහුණු වැඩ සටහන් සංවර්ධනය කිරීම මෙම ව්‍යාපෘතියේ ඒකාබද්ධ අංගයක් විය. මෙම ඉලක්කය සාක්ෂාත් කර ගැනීම පිණිස වසරකට අධිකරණ සාමාජිකයන් තිදෙනෙකුට එල්.එල්.එම්. උපාධිය ලබා ගැනීම සඳහා සමස්ථ අධ්‍යයන පිරිවැය සඳහා එනම්, උපකාරක පංති, ප්‍රවාහන වියදම්, නවාතැන් පහසුකම් සහ සාධාරණ යැපුම් දීමනාවක් සඳහා මෙම ව්‍යාපෘතියෙන් අරමුදල් සම්පාදනය කරන ලදි.

අග්‍රවිනිශ්චයකාර ගරු සරත් එන්. සිල්වා මැතිතුමා විසින් අධිකරණ නිලධරයන් සහ උසාවි කාර්ය මණ්ඩලය සඳහා පරිගණක පුහුණු වැඩසටහනක් එවකට කොළඹ -07 විජේරාම මාවතේ පිහිටි එතුමාගේ නිල නිවසේ දී ආරම්භ කරන ලදි. මෙම කාලපරිච්ඡේදය තුළ දී අධිකරණ අමාත්‍යාංශය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකරන ලද අතර, ඒ අනුව, විනිශ්චයකාරවරයන්ගේ ආයතනය සඳහා එම ගොඩනැගිල්ලේ 5 වන මහල ද, 4 වන මහලේ කොටසක් ද විනිශ්චයකාරවරයන්ගේ නවාතැන් ගැනීම සඳහා වෙන් කරන ලදි. අග්‍රවිනිශ්චයකාර ගරු සරත් එන්. සිල්වා මැතිතුමා විසින් ආයතනයට ලබාදුන් අනුග්‍රහය පිළිබඳව ආයතනය විසින් සිය කෘතඥතාව පළකර සිටින අතර, අග්‍රවිනිශ්චයකාර ධූරය හෙබ වූ 2000 සිට 2009 වර්ෂය තුළ ආයතනයේ කටයුතු සම්බන්ධයෙන් එතුමා විසින් අවංක සේවාවක් ඉටු කරන ලදි.

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ ආරම්භක අධ්‍යක්ෂවරයා වූ විනිසුරු ගරු ජේ. එෆ්. ඒ. සෝසා මැතිතුමා ආයතනයේ අධ්‍යක්ෂකවරයකෙු වශයෙන් වසර 21ක අගනා  සේවයකින් පසුව වර්ෂ 2008 වර්ෂයේ දී විශ්‍රාම ගන්නා ලදි. එතුමා විසින් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයට මෙන් ම අධිකරණ නිලධරයන් සඳහා ද ප්‍රශංසනීය සේවාවක් ඉටු කරන ලදි.

විනිසුරු ගරු ජේ. එෆ්. ඒ. සෝසා මැතිතුමා විශ්‍රාම යාමෙන් පසුව ශ්‍රේෂ්ඨාධිකරණයේ විශ්‍රාමික විනිශ්චයකාරයෙකු වූ ගරු නිශ්ශංක උදාලාගම මැතිතුමා 2008 වර්ෂයේ දී ආයතනයේ අධ්‍යක්ෂවරයා වශයෙන් පත් කරන ලද අතර, එතුමා 2011 වර්ෂය වන තෙක් ආයතනයේ අධ්‍යක්ෂවරයා වශයෙන් සිය රාජකාරි කටයුතු ඉටු කරන ලදි. මෙම කාලපරිච්ඡේදය තුළ විනිසුරු ගරු නිශ්ශංක උදාලගම මැතිතුමා විසින් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ පළමු වෙබ් අඩවිය ආරÈභ කරන ලදි. ශ්‍රේෂ්ඨාධිකරණයේ, අභියාචනාධිකරණයේ සහ මහාධිකරණයේ විනිශ්චයකාරවරයන්ගේ සහයෝගිතාව ඇතිව අධිකරණ නිලධරයන් සඳහා අපරාධ, සිවිල්, වාණිජ කාරණාවන්, නඩු කළමනාකරණය සහ විකල්ප ආරවුල් විසඳීම පිළිබඳ පාඨමාලා ග්‍රන්ථ 10 කට අධික ප්‍රමාණයක් පළකිරීමේ දී විනිසුරු ජේ. එෆ් .ඒ. සෝසා මැතිතුමා විනිසුරු උදලාගම මැතිතුමා සහ විනිසුරු පී.එච්.ඒ.කුලතිලක මැතිතුමා විසින් අතිශයන් ම

එළදායි කර්තව්‍යයක් ඉටු කරන ලදහ. විනිසුරු නිශ්ශංක උඩාලගම මැතිතුමණි, ආයතනය වෙනුවෙන් ඔබ කළ මෙහෙවරට අප සිය හෘදයාංගම ප්‍රණාමය පළකරන්නෙමු.

අග්‍රවිනිශ්චයකාර ගරු සරත් එන්. සිල්වා මැතිතුමා විශ්‍රාම යාමෙන් පසුව විනිසුරු ගරු අශෝක ද සිල්වා මැතිතුමා 2009 වර්ෂයේ දී අග්‍රවිනිශ්චයකාරවරයා වශයෙන් පත් කරන ලදි. එතුමාගේ ධූරකාලයේ දී විනිසුරු ගරු පී.එච්.කේ.කුලතිලක මැතිතුමා 2009 වර්ෂයේ දී ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ අතිරේක අධ්‍යක්ෂවරයා වශයෙන් පත් කරන ලදි. 2011 වර්ෂයේ දී එතුමා ශ්‍රේෂ්ඨාධිකරණයේ විශ්‍රාමලත් විනිසුරු ගරු ටී.බී.වීරසූරිය මැතිතුමා සමග සම අධ්‍යක්ෂවරයා වශයෙන් පත් කරන ලදි. විනිසුරු ගරු ටී.බී.වීරසූරිය මැතිතුමා සහ විනිසුරු ගරු පී. එච්. කේ. කුලතිලක මැතිතුමා ආයතනයේ අභිවෘද්ධිය වෙනුවෙන් අගනා සේවයක් කරන ලද අතර, ඔවුන් උපරිමාධිකරණවල සේවය කිරීමෙන් ලත් අගනා පළපුරුද්ද සහ හසල දැනුම උපයෝගි කර ගනිමින් සිවිල් සහ අපරාධ අධිකරණවල සේවය කරන විනිශ්චයකාරවරයන් පුහුණු කිරීමට අගනා මෙහෙවරක් ඉටු කර ඇත. ශ්‍රී ලංකාවේ විනිශ්චයකාරවරයන්ගේ ආයතනයට මෙන් ම අධිකරණයට ඔවුන් විසින් ඉටු කළ සුවිසාල සේවය නිසා එතුමන්ලා වෙත බුහුමන් ප්‍රණාමය පුද කිරීම පිණිස ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය මෙය විශේෂ අවස්ථාවක් කොට ගනියි. අප විසින් එතුමන්ලා අපගේ කෘතහස්ත ගුරු ඇදුරන් වශයෙන් සැමවිටකදී ම සිහියට නැගිය යුතුව ඇත.

අග්‍රවිනිශ්චයකාර ගරු අශෝක සිල්වා මැතිතුමා අධිකරණ විෂය පිළිබඳ අධ්‍යාපනය හා පුහුණු වීම් කෙරෙහි සුවිශේෂී අවධානයක් යොමු කළේය. ගරු අශෝක සිල්වා මැතිතුමා ආයතනයේ සහාය ලබාගෙන පුහුණු වැඩසටහන් සහ පුහුණුවල අන්තර්ගත කරුණු ප්‍රතිව්‍යුහගත කිරීමට ක්‍රියා කළේය. ඒ අනුව, මහාධිකරණ විනිශ්චයකාරවරයන් සහ අධිකරණ නිලධරයන් ඉලක්ක කරගෙන වැඩමුළු සම්මන්ත්‍රණ ගණනාවකට පෞද්ගලිකව ම සහභාගී වී ආයතනයේ කටයුතුවලට සහාය ලබාදුණි. මෙම කාලයේ දී පුහුණු අත්පොත් ගණනාවක් පළකරන ලද අතර, අධිකරණ පුහුණුවීම් පවත්වාගෙන යාම පිණිස සම්පත් දායකයන් වශයෙන් සේවාස්ථ විනිශ්චයකාරවරයන්ගේ මෙන් ම විශ්‍රාමික විනිශ්චයකාරවරයන්ගේ සේවාව ලබාගැනීමට ද අග්‍රවිනිශ්චයකාරවර ගරු අශෝක සිල්වා මැතිතුමා කටයුතු කළේය.

මෙම කාලයේදී ම විනිශ්චයකාරවරයන්ගේ ආයතනය අධිකරණ අමාත්‍යාංශයේ නව ගොඩනැගිල්ලේ ස්ථාපිත කරන ලදි. නව ශ්‍රවණාගාරයක්, පරිගණක විද්‍යාගාරයක්, පුස්තකාලයක් සහ විනිශ්චයකාරවරයන් සඳහා නේවාසිකාගාර සහිතව විනිශ්චයකාරවරයන්ගේ ආයතනය පිහිටුවීමට අවශ්‍ය පියවර ගැනීම සම්බන්ධයෙන් එවකට අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් කටයුතු කළ සුහද ගම්ලත් මහතාට විනිශ්චයකාරවරුන්ගේ ආයතනය සිය කෘතඥතාව පළකර සිටියි. එබැවින්, අධිකරණ නිලධරයන් සඳහා නව විනිශ්චයකාරවරයන්ගේ ආයතනයක් ලබාදීමට එතුමා දරන ලද උත්සාහය පිළිබඳව ආයතනය විසින් නිබඳව ම සිය මතකය අවදි කරයි. විනිශ්චයකාරවරයන්ගේ ආයතනය සඳහා අවශ්‍ය පරිගණක විද්‍යාගාරය, ශ්‍රවණාගාරය, පුස්තකාලය සහ ගෘහ භාණ්ඩ ඇතුළු සියලු ම උපකරණ සැපයීමට ක්‍රියා කිරීම පිළිබඳව එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනට ආයතනය විසින් සිය ගෞරවය ප්‍රදානය කර සිටියි.

අග්‍රවිනිශ්චයකාර ගරු අශෝක සිල්වා මැතිතුමා විශ්‍රාම ගැනීමෙන් පසුව විනිසුරු ගරු ශිරානි ඒ. බණ්ඩාරණායක මැතිණිය 2011 වර්ෂයේ දී අග්‍රවිනිශ්චයකාර ධුරයට පත් කරන ලද අතර, එතුමිය ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සභාපතිනිය ලෙස පත් වූවාය. විනිසුරු ගරු ටී. බී. වීරසූරිය මැතිතුමා සහ විනිසුරු පී. එච්. කේ. කුලතිලක මැතිතුමා ද 2012 මැයි මාසය වන තෙක් ආයතනයේ සම අධ්‍යක්ෂවරුන් වශයෙන් කටයුතු කළහ. ඉන් අනතුරුව ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් මහාධිකරණ විනිසුරු ධුරය හොබවන ගරු රුවන් ප්‍රනාන්දු මැතිතුමා 2012 ජූනි මාසයේ දී විනිශ්චයකාරවරුන්ගේ ආයතනයේ අධ්‍යක්ෂවරයා වශයෙන් පත් කරන ලද අතර, මහෙස්ත්‍රාත්වරයෙකු වශයෙන් කටයුතු කරන විජයවීර මැතිතුමා ඒ ආයතනයේ අධ්‍යයන සම්බන්ධීකාරක වශයෙන් පත් කරන ලදි.

අග්‍රවිනිශ්චයකාර ගරු ශිරානි ඒ. බණ්ඩාරනායක මැතිනිය ප්‍රධානත්වය දරන ලද ආයතනයේ කළමනාකරණ මණ්ඩලය ආයතනයේ කටයුතු සඳහා සහයෝගය ලබා දුන් අතර, ආයතනයේ අභිවෘද්ධිය පතා ඉතා වැදගත් දායකත්වයක් සපයන ලදි. මෙම කාලයේ දී අධිකරණ සේවා කොමිෂන් සභාවේ ගණකාධිකාරිවරයා වැඩ බැලීමේ පදනම මත විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ ගණකාධිකාරි වශයෙන් පත් කරන ලදි. එමෙන් ම විනිශ්චයකාරවරයන්ගේ කාර්යය සහ කර්තව්‍ය කාර්යක්ෂමව ඉටු කිරීම පිණිස අධිකරණ රෙජිස්ට්‍රාර්වරයෙකු සහ කළමණාකාර සහකාරවරුන් තිදෙනෙකුද පත්කරන ලදි. එවකට අධිකරණ අමාත්‍යාංශයේ සේවයේ නියුතුව සිටි කනිෂ්ඨ නිලධාරීන් දෙදෙනෙකු විනිශ්චයකාරවරයන්ගේ ආයතනයට පත්කිරීමට කටයුතු කළ එවකට අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් ධුරය හෙබවූ සුහද ගම්ලත් මහතාට මෙහි දී ආයතනය විසින් සිය කෘතඥතාව පළකර සිටියි.

2012 වර්ෂයේ දී විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ සංයුක්ත සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන ලද අතර, විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ මූල්‍ය රෙගුලාසිවලට යටත්ව ආදායම සහ වියදම සම්බන්ධයෙන් බලය පැවරීම පිණිස අනුමැතිය ද ලබාගෙන ඇත. ආයතනය විසින් සිය වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදි. එමෙන් ම ආයතනයේ සේවක සංඛ්‍යාව සකස් කරන ලද අතර, ආයතනයේ පුහුණු වැඩසටහන් කමිකරු විනිශ්චයාධිකාරිවල සභාපතිවරු දක්වා ව්‍යාප්ත කරන ලදි. එමෙන් ම මනාව සංවිධිත නූතන පුහුණු වැඩසටහන් සහ පර්යේෂණ පහසුකම් සහිත ආයතනයක් බවට පත් කිරීම පිණිස මෙම කාලයේ දී පුහුණු වැඩසටහන් ප්‍රතිව්‍යුහගත කිරීම ආරම්භ කරන ලද අතර, ආයතනයේ පහසුකම් නවීකරණය කිරීමට ද පියවර ගන්නා ලදි.

මෙම කාලයේ දී ආයතනයේ ලේකම් කාර්යාලය පිහිටුවීම පිණිස සුදුසු ස්ථානයක් සොයා ගැනීම පුහුණු වැඩසටහන් ව්‍යාප්ත කිරීම, *Wi-Fi* පහසුකම සඳහා මනාව සැදුම්ලත් පරිගණක විද්‍යාගරයකින් සංගෘහිත පුස්තකාලයක් පිහිටුවීම පිණිස පුස්තකාල පහසුකම් වැඩිදියුණු කිරීම, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ සහාය ඇතිව වෙබ් අඩවිය නැවත සක්‍රිය කිරීම, උපරිමාධිකරණවල වාර්තා නොකළ නඩු රැස් කිරීම, විනිසුරුවරයන් සඳහා ආයතනය තුළ නේවාසික පහසුකම් ලබාදීම, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ ඉල්ලීමට අනුව අධිකරණ නිලධරයන් සඳහා පුහුණු අත්පොතක් වැඩිදියුණු කිරීම පිණිස වැඩ කටයුතු ආරම්භ කිරීම, අවශ්‍ය කාර්යමණ්ඩලය බඳවා ගැනීම, පරිගණක

සේවය වැනි අවශ්‍ය භෞතික සම්පතක් සැපයීම, පරිගණක මුද්‍රිත පිටපත් සහ ඡායා පිටපතක් පහසුකම ආරම්භ කිරීම සහ රාජ්‍ය පරිපාලන සහ මූල්‍ය චක්‍රලේඛවල නියමයන්ට අනුකූලව පරිපාලන කාරණාවන් සම්බන්ධව ක්‍රියා කිරීම සඳහා ප්‍රමුඛස්ථානය ලබා දීම සිදු වී ඇත.

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය මේ සම්බන්ධයෙන් ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් වෙත සිය ප්‍රණාමය පළ කර සිටින අතර, මේ සම්බන්ධයෙන් ඉටු කළ සේවය සඳහා ආයතනයේ අධ්‍යයනය සම්බන්ධීකාරක මහී විජේවීර මහතාට මෙන් ම ආයතනයේ රෙජිස්ට්‍රාර්වරයා වශයෙන් කටයුතු කළ ඥාණපාල මහතා ඇතුළුව ආයතනයේ සමස්ථ කාර්ය මණ්ඩලයට සිය අවංක කෘතඥතාව පළ කර සිටිනු ලැබේ.

2013 ජනවාරි මාසයේ දී ගරු මොහාන් පීරිස් මැතිතුමා ශ්‍රී ලංකාවේ අග්‍රවිනිශ්චයකාරවරයා වශයෙන් පත් කිරීමෙන් අනතුරුව, එතුමා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සභාපතිවරයා බවට පත් විය. අග්‍රවිනිශ්චයකාර ගරු මොහාන් පීරිස් මැතිතුමා මුල පටන් ම ආයතනයේ කටයුතුවලට සිය අවංක කැපවීම සහ දායකත්වය පෙන්නුම් කළ අතර, ආයතනයේ ප්‍රගතිය තකා නොසෙල්වී කටයුතු කළ සවිමත් ටැඹක් බවට පත්විය. 2013 අප්‍රේල් මාසයේ දී ආයතනයේ කාර්යාලය පවත්වාගෙන යාම පිණිස අධිකරණ අමාත්‍යාංශයේ නව ගොඩනැගිල්ලේ නව කොටසක් හිමි වූ අතර, ඒ සඳහා සපයන ලද දායකත්වය සම්බන්ධයෙන් ආයතනය විසින් අග්‍රවිනිශ්චයකාර ගරු මොහාන් පීරිස් මැතිතුමාට ස්තුතිය ප්‍රකාශ කර සිටිනු ලැබේ. ආයතනයේ කාර්යාලය වශයෙන් භාවිත කිරීමට අධිකරණ අමාත්‍යාංශයේ නව ගොඩනැගිල්ලක් කොටසක් සැපයීම සම්බන්ධයෙන් අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරිය වශයෙන් කටයුතු කළ කමලිනි ද සිල්වා මහත්මියට ආයතනයේ සිය ස්තුතිය පළ කර සිටිනු ලැබේ. අග්‍රවිනිශ්චයකාර ගරු මොහාන් පීරිස් මැතිතුමා ආයතනයේ සේවක සංඛ්‍යාව සේවකයන් 09 සිට 23 දක්වා වැඩි කරන ලද අතර, විනිශ්චයකාරවරයන් සමග ස්වකීය දැනුම සහ අත්දැකීම් බෙදා හදාගැනීම පිණිස විවිධ ක්ෂේත්‍රවල ප්‍රවීණතාවක් ලබා ඇති විශිෂ්ඨයන් සහ වෘත්තීමය වශයෙන් සුදුසුකම් ලබා ඇති නීති ක්ෂේත්‍රයේ විශිෂ්ඨයන්, විද්වතුන් සහ විශේෂඥවරුන් වෙත ආරාධනා කරන ලදි. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ දී විනිශ්චයකාරවරුන් ඇමතීම පිණිස විදේශීය විනිශ්චයකාරවරුන්ට සහ නීති ක්ෂේත්‍රයේ විශේෂඥයන්ට නිතිපතා ආරාධනා කිරීමට අග්‍රවිනිශ්චයකාර ගරු මොහාන් පීරිස් මහතා අමතක නොකළේය. ආයතනයේ මෙන් ම විවිධ ස්ථානවල පවත්වන ලද බොහෝ සම්මන්ත්‍රණ, දේශන සහ විවිධ වැඩසටහන් සඳහා අග්‍රවිනිශ්චයකාර ගරු මොහාන් පීරිස් මැතිතුමා පෞද්ගලිකව ම සහභාගි වූ අතර, ඔහුගේ දැනුම සහ පළපුරුද්ද විනිශ්චයකාරවරයන් සමග බෙදා හදා ගැනීම කළේය.

මෙම කාලය තුළ සාක්ෂි නීතිය සහ සිවිල් නීති ප්‍රතිසංස්කරණ පිළිබඳ විනිශ්චයාසන පොත යාවත්කාලීන කිරීම පිණිස කමිටු දෙකක් පත් කරන ලදි. කීර්තිමත් සහ කෘතහස්ථ විදේශීය විනිශ්චයකාරවරුන්ගේ සහාය ඇතිව සිද්ධි අධ්‍යයනය පිළිබඳ ක්ෂේත්‍රය තුළ සිවිල් අධිකරණ පද්ධතිය සම්බන්ධයෙන් නීති ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියෙහි වැදගත්කම අවධාරණය කරන ල සිවිල් අධිකරණ පද්ධතිය සඳහා අවශ්‍ය නීති ප්‍රතිසංස්කරණ ගෙන ඒම සම්බන්ධයෙන් අග්‍ර විනිශ්චයකාර ගරු මොහාන් පීරිස් මහතා දැක්වූ පරිශ්‍රමයට ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය සිය ප්‍රශංසාව පළ කර සිටිනු ලැබේ.

අග්‍රවිනිශ්චයකාර ගරු මොහාන් පීරිස් මැතිතුමා සිය ධුරයෙහි වැඩ භාර ගැනීමෙන් පසුව විශේෂයෙන් ම නඩු කළමණාකරණය, අධිකරණ කළමණාකරණය, අධිකරණ ආචාර ධර්ම පිළිබඳව විනිශ්චයකාරවරුන් දෙසීයකට අධික පිරිසකට මලයාසියාව, ඉන්දියාව, සිංගප්පූරුව වැනි රටවල විදේශ පුහුණුව ලබා දී ඇත. මෙම කාලය තුළ දී ආයතනයේ අධ්‍යයන සම්බන්ධීකාරකවරයා වශයෙන් ලක්මාල් වික්‍රමසූරිය මහතාගේ සේවය ලබා ගන්නා ලද අතර, එතුමා විනිශ්චයකාරවරුන් සඳහා විදේශීය පුහුණු අවස්ථා සොයා ගැනීම පිණිස කැපවී කටයුතු කරන ලද අතර, ඒ අනුව, ආයතනය විසින් දියත් කරන ලද විදේශීය පුහුණු වැඩසටහන් සියල්ලක් ම සංවිධානය කරන ලදි. එබැවින් ආයතනය වෙනුවෙන් සියලු ම විදේශීය පුහුණු වැඩසටහන් සංවිධානය කිරීමේ දී සහ සම්බන්ධීකරණය කිරීමේ දී ඒ මහතා විසින් දක්වන ලද කැපවීමට සහ සේවාවට ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය ඒ මහතාට ස්තූතිය පළ කිරීමට මෙය අවස්ථාවක් කරගනු ලැබේ. අග්‍රවිනිශ්චයකාර ගරු මොහාන් පීරිස් මහතා සිය ධුරය හෙබවූ කාලය තුළ ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය වේගවත් ප්‍රගතියක් ලැබූ බව සාඩම්බරයෙන් සිහිපත් කරනු කැමැත්තෙමි.

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනයේ ප්‍රගතිය පිණිස සම්පත් දායකයන් වශයෙන් කටයුතු කළ සම්පත් දායකයන් වශයෙන් මෙන් ම ආයතනයේ අනෙකුත් වැඩ කටයුතු වලට නිරන්තරයෙන් ම දැක්වූ සහයෝගයට උපරිමාධිකරණ සහ මහාධිකරණ විනිශ්චයකාරවරුන්ට, අධ්‍යයනය ප්‍රජාවට මෙන් ම විවිධ වෘත්තිකයන්ට ආයතනය සිය අවංක කෘතඥතාව පළ කර සිටිනු ලැබේ. එමෙන් ම ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනයේ පුහුණු වැඩසටහන්වලට සහයෝගය ලබා දීමේ දී ප්‍රධාන පෙළේ භූමිකාවක නිරත වෙමින් ඉමහත් සෙතක් සලසන ලද අධිකරණ සේවා කොමිෂන් සභාවේ හිටපු ලේකම් සිසිර රත්නායක මහතා මෙහි දී විශේෂයෙන් ම සඳහන් කළයුතුව ඇත.

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය වර්තමානයේ දී අධිකරණ පුහුණුව සඳහා වන අන්තර්ජාතික ආයතනයේ සාමාජිකයෙකු වශයෙන් කටයුතු කරයි. අධිකරණ නිලධාරින් සඳහා නීති සහ අධිකරණ තොරතුරු ප්‍රචලිත කිරීම අරබයා වෙබ් අඩවියක් සහ ඊ- පුස්තකාලයක් අද වනවිට ආයතනය සතුව පවතී. එමෙන් ම යාපනය, තංගල්ල මෙන් ම අග්‍රවිනිශ්චයකාරවරයාගේ නිල මැදිරිය ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයට සම්බන්ධ කරන දෘෂ්‍ය සම්මේලන පහසුකම ද ආයතනය සතුව පවතී. එමෙන් ම පළමු අන්තර්ජාතික දත්ත සංහිතාව වන මනුපත්‍ර නමැති ඉන්දියාවේ වෙබ් අඩවිය ද ආයතනය විසින් මිලදී ගෙන තිබෙන අතර, මෙම වෙබ් අඩවිය නිසා ඉන්දියානු ශ්‍රේෂ්ඨාධිකරණය, මහාධිකරණය, ඇමරිකා එක්සත් ජනපදයේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කරන ලද නඩු තීන්දු මෙන් ම සාමී මන්ත්‍රී මණ්ඩලයේ නඩු තීන්දුවලට ප්‍රවේශ වීමට ද අවස්ථාව උදාකරගෙන ඇත. ශ්‍රී ලංකාවේ අධිකරණ නිලධරයන් පුහුණු කිරීමේ දී සහ ශ්‍රී විනිශ්චයකාරවරයන්ගේ ආයතනයට ඉලෙක්ට්‍රොනික පුහුණු මෙවලම් ඇතුළුව පුහුණු අත්පොත් ලබා දීම සම්බන්ධයෙන් ඇමරිකා එක්සත් ජනපදයේ ෆෙඩරල් අධිකරණ මධ්‍යස්ථානය, මලයාසියාවේ, සිංගප්පූරුවේ සහ ඉන්දියාවේ අධිකරණ විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් ලබා දුන් සහයෝගය ආයතනය විසින් වාර්තා කරගෙන ඇත.

අවසාන වශයෙන් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ ප්‍රගතිය අපේක්ෂාවෙන් ඉමහත් දායකත්වයක් ලබා දුන් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කළමණාකරණ මණ්ඩලයට, අධිකරණ අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරිය ප්‍රමුඛ කාර්ය මණ්ඩලයට, ආසියානු පදනමට, ආසියානු සංවර්ධන බැංකුවට සහ අනෙකුත් මූල්‍ය නියෝජිතායතන වෙතට සහ ආයතනයේ කාර්ය මණ්ඩලයට ආයතනය විසින් ස්වකීය අවංක ස්තූතිය පළ කර සිටිනු ලැබේ. (1985 සිට 1991 දක්වා ඓතිහාසික (තොරතුරු මූලාශ්‍රය - Courtesy Judgers' Journel )

## 5. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කළමනාකරණය සහ කාර්ය මණ්ඩලය.

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය වනාහි අවිච්ජින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් වන අතර, එහි පරිපාලනය සහ කළමණාකරණය කළමණාකරණ මණ්ඩලය වෙත පවරනු ලැබේ. ආයතනය, අග්‍රවිනිශ්චයකාරවරයාගෙන් සහ ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන් දෙදෙනෙකුගෙන් සමන්විත වන අතර, අග්‍රවිනිශ්චයකාරවරයා මණ්ඩලයේ සභාපතිවරයා වේ. ආයතනයේ ප්‍රතිව්‍යුහගත සැලැස්මෙන් පසුව ආයතනයේ ආයතනික ව්‍යුහය පහත දැක්වේ.

### කළමනාකරණ මණ්ඩලය

2014 ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සංයුතිය පහත දැක්වේ.

ශ්‍රී ලංකාවේ අග්‍රවිනිශ්චයකාරවරයා සහ අතිගරු ජනාධිපතිවරයා විසින් පත් කරන ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන් දෙදෙනෙකුගෙන් සමන්විත වේ..

අගවිනිසුරු ගරු මොහාන් පීරිස් මැතිතුමා , (ජනාධිපති නීතිඥ ) සභාපති

ගරු විනිසුරු සලීම් මර්සූෆ් මැතිතුමා, මණ්ඩල සභික

ගරු ශිරාණි තිලකවර්ධන මැතිනිය මණ්ඩල සභික (2014 අප්රේපල් දක්වා )

ගරු කේ. ශ්රීිපවන් මැතිතුමා, මණ්ඩල සභික 2014 මැයි සිට )

## ආයතනයේ කාර්ය මණ්ඩලය.

ආයතනයේ පරමාර්ථ ඉටු කර ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම පිණිස ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් ආයතනයේ අධ්‍යක්ෂවරයා සහ අනෙකුත් නිලධාරීන් පත් කරන අතර. කළමනාකාරණ මණ්ඩලය විසින් ආයතනයේ අධ්‍යක්ෂවරයා නිලධාරීන් සහ සේවකයන් සම්බන්ධයෙන් විනය පාලනය (සේවයෙන් පහ කිරීමේ බලතල ඇතුළුව) ක්‍රියාත්මක කිරීම ද ඉටු කරනු ලැබේ. ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ, නිලධාරීන්ගේ සහ සේවකයන්ගේ වැටුප් සහ වේතන සහ සේවා කොන්දේසි තීරණය කිරීමේ බලය ද ආයතනයේ කළමනාකාර මණ්ඩලය වෙත පැවරී ඇත.

| | |
|---|---|
| 1. අධ්‍යක්ෂවරයා | - රුවන් ප්‍රනාන්දු මහතා |
| 2. උපදේශකවරුන් | - ගරු රංජිත් රතරාජා මැතිතුමා, |
| | විනිසුරු ශිරානි තිලකවර්ධන මැතිනිය. |
| 3. අධ්‍යයන සම්බන්ධීකාරක | - ලක්මාල් වීරසූරිය මහතා. |
| 4. ගණකාධිකාරී | - ලක්ෂිකා චතුරානි මෙනවිය. |
| 5. කළමණාකරණ සහායකවරුන් | - කපිල ජයසිරි මහතා, |
| | දිලිනි ගන්නොරුව මහත්මිය, |
| | එස්. සී. පී. ලක්මාලි මෙනවිය, |
| | කේ. ඒ. සී. පී. පී. ගුණවර්ධන මහත්මිය. |
| 6. පුස්තකාලාධිපති | - නිලන්තිකා ලක්මාලි මහත්මිය. |
| 7. සුළුසේවක කාර්ය මණ්ඩලය | - ඩී.ලක්ෂාන් වැලිකල මහතා, |
| | ආර්. එල්. ඒ. පී. මලින්ද මහතා, |
| | එච්. කේ. ටී. එම්. සෙනෙවිරත්න මහතා, |
| | ඩබ්ලිව්. ඒ. මේනකා පද්මසිලි මහත්මිය |
| | යූ. ඒ. නදීපා චතුරංගනී මහත්මිය. |
| 8. රියදුරු | - ජී. ඩබ්ලිව්. රංජිත්. |




## 6. ආයතනයේ අරමුදල්.

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයට ම හිමි, ආයතනයේ කළමණාකරණ මණ්ඩලය විසින් පරිපාලනය කරන, අරමුදල් තිබේ. ආයතනයේ ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් පියවා ගැනීම සඳහා අධිකරණ අමාත්‍යාංශය හරහා ගලනය වන මහා භාණ්ඩාරගාර ප්‍රදානවලින් ප්‍රධාන වශයෙන් ම ආයතනයේ මූල්‍ය කටයුතුවලට අවශ්‍ය මුදල් සම්පාදනය කරගනු ලැබේ. මෙම වියදම් සඳහා අධිකරණ අමාත්‍යාංශය / මහා භාණ්ඩාගාරය උපරිම වියදම් සීමා පනවන අතර, මෙම සීමාවන් ඇතුළත ක්‍රියාත්මක වීමට ආයතනයට සිදුවී ඇත.

1985 අංක 46 දරන ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය පනතෙහි විධිවිධාන ප්‍රකාරව ජනාධිපතිවරයා විසින් අනුමත කරන යම් කවර ම මූලාශ්‍රවලින් ලැබෙන පරිත්‍යාග, තෑගි සහ ප්‍රධාන භාර ගැනීමට ආයතනයට බලය තිබෙන අතර, එවැනි යම් කවර ම වූ මූලාශ්‍රවලින් ආයතනයට ලැබෙන පරිත්‍යාග, තෑගි, සහ දීමනා ආයතනයේ අරමුදලට ගෙවිය යුතු වේ. ආයතනයේ පරිපාලනය සහ

කළමණාකරණය සම්බන්ධයෙන් දරන සියලු ම වියදම් (පඩිනඩි ගෙවීම ද ඇතුළුව) ආයතනයේ අරමුදලින් ගෙවා පියවා දැමිය යුතුය.

මහා භාණ්ඩාගාරය විසින් අධිකරණ අමාත්‍යාංශය හරහා 2014 වර්ෂය සඳහා ප්‍රාග්ධන වියදම් වශයෙන් රුපියල් මිලියන 07 ක් ද, පුනරාවර්තන වියදම් වශයෙන් රුපියල් මිලියන 19 ක් ද, ප්‍රදානය කර ඇත.

## 7 පුහුණු වැඩසටහන්.

1985 වර්ෂයේ දි ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය ආරම්භ කළ අවස්ථාවේ පටන් ආයතනය තුළ පුහුණු පාඨමාලා සහ වැඩසටහන් ගණනාවක් ම පවත්වා ඇත. කෙසේ වුව ද, 2013 වර්ෂයේ දි ආයතනය වඩ වඩාත් පුළුල් කිරීමත් සමග ම ආයතනය විසින් දියත් කරන ලද වැඩසටහන් නිසා මහාධිකරණ විනිශ්චයකාරවරයන්, කම්කරු විනිශ්චයාධිකාරිවල සභාපතිවරුන්, කාති උසාවිවල විනිශ්චයකාරවරයන් සහ අධිකරණ රෙජිස්ට්‍රාර්වරයන් සඳහා ද සේවයක් ඉටු වී ඇත. මෙහි ඉහත සඳහන් කරන ලද ආයතනයේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම, අධිකරණය පිළිබඳ අධ්‍යාපනය, කුසලතා සංවර්ධනය ඇතුළුව ශක්‍යතාව සවිබල ගැන්වීම, ආකල්පමය වෙනසක් ඇති කිරීම සහ සමාජමය කැපවීම අරමුණු කරගෙන සකස් කරන ලද වැඩසටහන් හරහා අධිකරණ කාර්ය සාධනයේ ඉහල ප්‍රමිතියක් සහතික කිරීම උදෙසා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය කැපවී ක්‍රියා කරයි. තව ද, අධ්‍යාපනය සහ පර්යේෂණ හරහා වැඩිදියුණු කළ අධිකරණ පරිපාලනය සහ කළමනාකරණය තවදුරටත් සංවර්නය කොට ස්ථාපිත කිරීම පිණිස ද, විනිශ්චයකාරවරයන්ගේ ආයතනය කැපවීමෙන් යුක්තව සිය සේවය ඉටු කරමින් සිටියි. අධිකරණ සේවාවේ විෂය පථය තුළ සිටින මුල් අවස්ථා අධිකරණවල විනිශ්චයකාරවරයන් සහ කම්කරු විනිශ්චයාධිකාරිවල සභාපතිවරුන්ගේ පුහුණු අවශ්‍යතාවයන් සපුරාලීම පිණිස කටයුතු කිරීමට විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් දියත් කරන පුහුණු වැඩසටහන්වලින් තිබඳව ම අපේක්ෂා කරයි.

ආයතනයේ පුහුණු වැඩසටහන්වලට සහභාගී වන සියලු ම විනිශ්චයකාරවරයන්ට අදාල වන පොදු පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක වුව ද, පුහුණු අත්පොත් සහ පුහුණුවට සහභාගිවන්නන්ගේ ස්වභාවය මත පුහුණු අවශ්‍යතාවන් වෙනස් වේ. පුහුණුවේ ස්වභාවය සහ අධිකරණ නිලධරයාගේ පළපුරුද්ද හෝ ඔහු විසින් පුහුණු සැසිවාරවල මුල් අවස්ථාවේ දි අත්කරගෙන ඇති දැනුම මත පුහුණු වැඩසටහනක් විධානාත්මක, ස්වේඡා, හෝ වෛකල්පික විය හැකිය. අදාල පුහුණු වැඩසටහන පාලනය කිරීමේ බලය ඇති තැනැත්තා කවරෙක් ද යන වග සහ පුහුණු වැඩසටහන්වලට අරමුදල් සම්පාදනය කරන්නේ කෙසේ ද යන කාරණය සහ පුහුණුවේ ඉලක්කගත කණ්ඩායම් සහ පුහුණුවට ගතවන කාලය යන ගැටළු, පුහුණු වැඩසටහනින් ම ආවරණය කරනු ලැබේ.

ශ්‍රී ලංකාව තුළ අධිකරණ නිලධරයන්ගේ සමස්ථ වෘත්තීය ජීවිතය පුරාම ඔවුන්ගේ වෘත්තීමය විශේෂඥතාව ඉහල නැංවීම සහ ඔවුන්ගේ දැනුම වැඩිදියුණු කිරීම ඉලක්ක කරගෙන අනිවාර්ය සේවාස්ථ පුහුණු වැඩසටහනට සහභාගී වන ලෙස නියම කරනු ලැබේ. ඒ අනුව, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් ආයතනය තුළ එක් එක් සෙනසුරාදා දිනවල දි පවත්වන සේවාස්ථ පුහුණු වැඩසටහන්

වලට සහභාගී වන ලෙස මෙම අධිකරණ නිලධරයන්ට නියම කරන අතර, සහභාගී වීමට නොහැකි වූ අවස්ථාවක දී එවැනි අනිවාර්ය සේවාස්ථ පුහුණු වැඩසටහන්වලට සහභාගී වීමට නොහැකි වීමට බලපෑ හේතුව නිසි බලධරයන් වෙත දැනුම් දීමට නියම කරනු ලැබේ.

අලුතෙන් ම පත්වීම් ලබන පුහුණුවන අධිකරණ නිලධරයන් ඉලක්ක කරගෙන දෛනික පදනමක් මත හැඳින්වීමේ සහ මූලික පුහුණු වැඩසටහන් පවත්වනු ලබන අතර, එම පුහුණු වැඩසටහන්වලට සහභාගී වීම අනිවාර්ය වේ. විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් පවත්වන එවැනි පුහුණු සැසිවාරවලට සහභාගී නොවීමට එම අධිකරණ නිලධරයන්ට නොහැකි වේ. තව ද, සේවාස්ථ අධිකරණ නිලධරයකු වැඩිදුරටත් පුහුණු වීම සඳහා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයට අනුයුක්ත කිරීමට අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් තීරණයක් ගෙන ඇති අවස්ථාවක දී, අනෙක් පුහුණු අවශ්‍යතාව පැන නගිනු ලැබේ.

## පුහුණු වැඩසටහන් සඳහා තිබෙන සම්පත් සහ පහසුකම්.

මෙම වාර්තාවෙන් හඳුනා ගන්නා පරිදි අධිකරණ පුහුණු පාඨමාලා පැවැත්වීම පිණිස ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයට පහත සඳහන් අති නවීන පහසුකම් ඇත.

1. අති නවීන පහසුකම් සහිත ශ්‍රවණාගාරය.

2. *Wi-Fi* පහසුකම් සහිත, සඳුදා සිට සෙනසුරාදා දක්වා විවෘතව පවතින අති නවීන පන්නයේ පුස්තකාලය.

3. වෙබ් අඩවිය.

4. වීඩියෝ සම්මේලන පහසුකම.

5. ඡායාස්ත පිටපත් සහ මුද්‍රිත පිටපත් ලබා ගැනීමේ පහසුකම.

6. පරිශීලනය පිණිස නීති පොත් ලබාගැනීම.

7. පුහුණු පාඨමාලා අත්පොත්.

8. පරිශීලන අත්පොත්.

9. නීති වාර්තා.

10. වාර්තා නොකළ නඩු තීන්දු.

11. නේවාසික පහසුකම්.

12. නීති තොරතුරු ඇතුළත් දත්ත සංහිතාව.

## පුහුණු පාඨමාලාවල ඉලක්ක සහ පරමාර්ථ

1. යුක්තිය පසිලීමේ දී ගෞරවනීය අධිකරණ නිලධරයා හා විනිශ්චයකාරවරුන්ගේ භූමිකාව අවබෝධ කර ගැනීම.

2. අධිකරණ නිලධරයන්ගේ අධිකරණමය සහ බාහිර අධිකරණමය කටයුතුවල දී මහජන විශ්වාසය ගිලිහී යාම අවම කර ගැනීම පිණිස යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියේ දී අධිකරණ නිලධරයන් සඳහා ආචාර ධර්ම සංග්‍රහයක වැදගත්කම අවබෝධ කරගැනීම.

3. නඩුකියන්නන් සහ මහජනතාව සැක කිරීම අභිබවා පෞද්ගලික කටයුතුවල පාලනය පිණිස මූලික නියමයන් අවබෝධ කරගැනීම.

4. අධිකරණ චර්යාව සහ අධිකරණ ශිල්පය පාලනය සහ අධිකරණවල නිලධාරින් නඩුකියන්නන් සහ මහජනතාව අවබෝධ කරගැනීම.

5. අධිකරණ නිලධරයන් සඳහා ආචාර ධර්ම සංග්‍රහය සංවර්ධනය කිරීම. (ලිඛිත අචාර ධර්ම සංග්‍රහය හෝ ස්වයං පැනවුම් චර්යා ධර්ම සංග්‍රහය)

## සේවාස්ථ පුහුණු පාඨමාලාවල අඩංගු කරුණු.

1. අධිකරණ චර්යාව, ආචාර ධර්ම සහ පැවැත්ම.

2. කේන්ද්‍රිය නීතිමය දැනුම. (හරවත් සහ කාර්ය පටිපාටික නීතිය - අපරාධ, සිවිල්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා, නීතිය, වාණිජ නීතිය, අපරාධ සහ සිවිල් නඩු විධාන කාර්ය පටිපාටිය, සාක්ෂි නීතිය ආදිය. )

3. විශේෂ නීති සහ පනත්.

4. පෞද්ගලික නීති.

5. මානව අයිතිවාසිකම්.

6. දූෂණ විරෝධී නීති.

7. පරිගණක සාක්ෂරතාව සහ තොරතුරු තාක්ෂණය.

8. බුද්ධිමය දේපළ.

9. අධිකරණ පරිපාලනය සහ අධිකරණ කළමනාකරණය.

10. නඩු කළමනාකරණය සහ සිද්ධි ගලන කළමනාකරණය.

11. ගිණුම් සහ මුදල්.

12. විනය කාර්ය පටිපාටිය.

13. ළමා යුක්තිය.

14. යුක්තියට සහ නීති අධාරවලට ප්‍රවේශය.

15. වෝහාරික (අධිකරණ) විද්‍යාව සහ වෝහාරික වෛද්‍ය විද්‍යාව.

16. නඩු තීන්දු ලිවීම.

17. දඬුවම් පැනවීමේ ප්‍රතිපත්තිය සහ ක්‍රියාත්මක කිරීම.

18. පර්යේෂණ ක්‍රමවේදය සහ පරිගණකය ඇසුරින් පර්යේෂණ සහ ක්‍රම වේදය.

19. විකල්ප ආරවුල් විසදීම.

20. පෞරුෂත්වය සහ කුසලතා සංවර්ධනය.

21. සෞඛ්‍ය සංවර්ධනය සහ ආතති කළමනාකරණය.

22. ප්‍රායෝගික පුහුණුව. නඩු තීන්දු ලිවීමේ අභ්‍යාස, විසඳනාවන් කෙටුම්පත් කිරීම, චෝදනා සකස් කිරීම, පෙරෙට්ටු හඳුනා ගැනීම, හදිසි මරණ පරීක්ෂණ පැවැත්වීම, පාපොච්චාරණ සහ ප්‍රකාශ වාර්තා කිරීම, ස්ථානීය පරීක්ෂණ සටහන් සකස් කිරීම.

## පුහුණු ක්‍රමවේද

1. කේන්ද්‍රීය සම්මුඛ ක්‍රමවේදය.

2. කේන්ද්‍රීය / ප්‍රත්‍යන්ත පාදක සම්මුඛ ක්‍රමවේදය.

3. අධිකරණ පාදක උපදේශක ක්‍රමවේදය.

4. පත් කළ උපදේශකවරුන් මගින් කරන කේන්ද්‍රීය උපදේශක (පත් කරන සම්පත් දායකයන්)

5. තනි තනි නිලධරයන් සඳහා රේඛිත

6. තොරතුරු තාක්ෂණය සහ වෙබ් අඩවි පාදක දුරස්ථ අධ්‍යාපන ක්‍රම වේදය.

7. දෛනික වැඩ මෙවලම්, විනිශ්චයාසන පොත්, ශ්‍රව්‍ය සහ දෘශ්‍ය පටිගත අධ්‍යාපන මෙවලම්.

8. මොඩියුලර්.

9. පාඨමාලා අත්පොත්.

10. පරිශීලන මෙවලම්.

11. පර්යේෂණ මෙවලම්.

12. වීඩියෝ සම්මේලන.

13. ප්‍රායෝගික ක්‍රමවේද.

14. සමායනය.

15. ඉදිරිපත් කිරීම.

16. රචනා ලිවීම.

17. පර්යේෂණ වැඩ.

18. තනි පුද්ගල පාඨමාලා මෙවලම් සකස් කිරීම.

19. විදේශීය පුහුණු ක්‍රමවේදය.

20. උපදේශකත්වය.

උපදේශක පුහුණු පාඨමාලාව දෙයාකර වැඩසටහන්වලින් සමන්විත වේ. එනම්, අග්‍රවිනිශ්චයකාරවරයා විසින් පවත්වන අධිකරණ පාදක උපදේශන වැඩසටහන සහ සම්පත් දායකයන් විසින් මෙහෙයවන කේන්ද්‍රීය උපදේශක වැඩසටහන වශයෙනි. ශ්‍රී ලංකාවේ දී උපදේශකත්වය යම් කවර ම නිල හඳුනා ගැනීමකින් තොරව පෞද්ගලික මට්ටමක දී පුහුණුවක් වශයෙන් භාවිත කරනු ලැබේ. කෙසේ වුව ද, අලුත් පුහුණු අත්පොත මගින් උපදේශක පුහුණු වැඩසටහනක් හඳුන්වා දෙන අතර, ඒ අනුව, ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විශ්‍රාමලත් කෘතහස්ත සම්පත් දායකයන් දෙදෙනෙකු විසින් අධිකරණ නිලධරයන්, මහාධිකරණ විනිසුරන් සහ කම්කරු විනිශ්චායාධිකාරිවල සභාපතිවරුන් වෙත උපදෙස් දීම කරනු ලැබේ. උපදේශකවරුන් විසින් පහත සඳහන් කාර්යයන් ඉටු කරයි.

1. අපරාධ නීතිය සහ සාක්ෂි - මුල් අවස්ථා සහ අභියාචනා- ශ්‍රේෂ්ඨාධිකරණය හෝ අභියාචනාධිකරණයේ විශ්‍රාමලත් උපදේශක.

2. සිවිල් නීතිය සහ කම්කරු නීතිය - මුල් අවස්ථා සහ අභියාචනා - ශ්‍රේෂ්ඨාධිකරණය හෝ අභියාචනාධිකරණයේ විශ්‍රාමලත් උපදේශක.

මෙවැනි ස්වභාවයේ පුහුණු වීම් ප්‍රධාන වශයෙන් ම පූර්ව සැලසුම්ගත දුරකථන කුට්, ඊමේල්, වෙබ් අඩවි පාදක ක්‍රම වේද මෙන් ම පූර්ව සැලසුම්ගත සම්මුඛ ආයතනික සැසිවාර හරහා පවත්වනු ලැබේ.

## 21. විද්‍යුත් පුස්තකාලය

විද්‍යුත් පුස්තකාලය මගින් පහත සඳහන් පහසුකම් සළසනු ලබයි.

| | | | | |
|---|---|---|---|---|
| පාඨමාලා මෙවලÈ | චක්‍රලේඛ | වාර්තා නොකළ නඩු තීන්දු | විනිශ්චයකාරවරයන්ගේ ජර්නල | 2008 සිට පනත්, |
| දත්ත සංහිතාව | ශ්‍රී ල.වි.ආ. පුහුණු අත්පොත් -2013 | වාර්තා | පුහුණු සටහන් | සම්පත් දායක පිවිසුම |
| පුහුණු මොඩියුලර් | විදේශ නඩු තීන්දු | විද්‍යුත් පුස්තක | ලිඛිත් භාෂිත | පුහුණු වන විනිශ්චයකාරවරුන් |
| ගැසට් පත්‍ර | ඉදිරිපත් කිරීම් | | | |

## 8. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කාර්ය සාධනය.

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ සේවක සංඛ්‍යාව කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති අතර, එය පහත දැක්වේ.



බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කිරීමෙන් පසුව ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය සඳහා බඳවා ගන්නා ලද නව කාර්ය මණ්ඩලය පහත දැක්වේ.

අංක 30/2006 දරන කළමනාකරණ චක්‍රලේඛය යටතේ සකස් කරන ලද ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ සංශෝධිත සේවක සංඛ්‍යාව.

අධ්‍යක්ෂ.

උපදේශකවරුන් (තනතුරු02)

නියෝජ්‍ය අධ්‍යක්ෂ (තනතුරු01)

අධ්‍යයන සම්බන්ධීකාරක (තනතුරු01)

සහකාර ගණකාධිකාරී (තනතුරු01)

ලේකම් (තනතුරු01)

කළමනාකාර සහකාර (තනතුර01)

කළමනාකාර සහකාර (තනතුරු04)

පරිගණක දෘඩාංග/ මෘදුකාංග තාක්ෂණ ශිල්පී (තනතුරු02)

පුස්තකාලයාධිපති (තනතුරු01)

කාර්යාල කාර්ය සහයක (තනතුරු 01)

රියදුරු (තනතුරු 03)

කාර්යාල කාර්ය සහයක (තනතුරු 03)

ගෘහ පාලක (තනතුරු 01)

බඳවා ගැනීමේ කාර්ය පටිපාටිය කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලදි.

| පත් කළ දිනය. | තනතුරු නාමය. | බඳවා ගන්නා ලද නිලධාරින් සංඛ්‍යාව. |
|---|---|---|
| 2014.03.10 | කාර්යාල කාර්ය සහයක (කොන්ත්‍රාත් පදනම) | 02 |
| 2014.07.10 | ගෘහ පාලක (කොන්ත්‍රාත් පදනම) | 01 |
| 2014.10.01 | පුස්තකාලයාධිපති (ස්ථිර) | 01 |
| 2014.11.03 | සහකාර ගණකාධිකාරී(ස්ථිර) | 01 |

2. පුස්තකාලායාධිපති, සහකාර ගණකාධිකාරී සහ රියදුරු තනතුරු සඳහා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ කාර්ය පටිපාටිය අනුමත කරන ලදි.

3. විනිශ්චයකාරවරයන්ගේ පරිශීලනය සඳහා මනුපුත්‍ර නීති දත්ත සංහිතාව මිලදී ගෙන ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ ස්ථාපිත කරන ලදි.

4. විනිසුරු ආචාර්ය ගරු ඒ.ආර්.බී අමරසිංහ මැතිතුමා විසින් ලියන ලද ආචාර ධර්ම සංග්‍රහය පිළිබඳ පුස්තක 52ක් මිලදී ගෙන විනිශ්චයකාරවරයන් අතර බෙදා දෙන ලදි.

5. ආයතනයේ පුස්තකාලය සඳහා නව නීති පොත් මිලදී ගන්නා ලදි.

6. ඊ පුස්තකාලය ක්‍රියාත්මක කරන ලදි.

**ඊ පුස්තකාල සේවාව**



**සපයනු ලබන සේවාවන්**




## පර්යේෂණ කටයුතු

නඩු කළමනාකරණය සහ සමථකරණය පිළිබඳ කෙටුම්පත් කළ යෝජනා.

1. නඩු කළමනාකරණය සහ සමථකරණය පිළිබඳව සිවිල් නඩු විධාන සංග්‍රහයේ සංශෝධන කෙටුම්පත් කිරීම : අධිකරණ නඩු කළමනාකරණය පිළිඹිබු කිරීම සහ පූර්ව නඩු විභාගය සඳහා සම්මේලන උපලේඛනගත කිරීමට ආකෘති දෙකක් හඳුන්වා දී ඇත. අදාළ යෝජනා අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා සමග සාකච්ඡා කර ඇත. (ඇමුණුම 01 බලන්න)

2. ශ්‍රී ලංකාවේ සමථ කරණ රීති කෙටුම්පත. (ඇමුණුම 02 බලන්න.)

3. ශ්‍රී ලංකාවේ වාණිජ සමථකරණ මධ්‍යස්ථානය පනත සංශෝධනය කිරීම පිළිබඳව කෙටුම්පත (ඇමුණුම 03 බලන්න

## 9. 2014.01.01 සිට 2014.12.31 දක්වා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කටයුතු

### 1.සේවාස්ථ විනිශ්චයකාරවරයන් සඳහා සෙනසුරාදා දින වැඩසටහන්.

මහාධිකරණ විනිශ්චයකාරවරයන් 67 දෙනෙකු, අධිකරණ නිලධරයන් 216 දෙනෙකු කම්කරු විනිශ්චයාධිකාරවල සභාපතිවරුන් 37 දෙනෙකුගේ සහභාගිත්වයෙන් 2014.01.01 දින සිට 2014.12.31 දක්වා සෙනසුරාදා දින සම්මන්ත්‍රණ පවත්වන ලදි. 2014 වර්ෂය සඳහා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් ඉටු කරන ලද ප්‍රධාන පෙළේ කාර්යයන් පහත දැක්වේ.

මහේස්ත්‍රාත්වරුන් සහ දිසා විනිසුරුවරුන් සඳහා පවත්වන ලද සෙනසුරාදා දින සම්මන්ත්‍රණ 30 පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| අනුක්‍රමික අංකය | දිනය | දේශකයා | මාතෘකාව | සහභාගි වූ විනිසුරුව න් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | 2014.01.18 | ආචාර්ය බී.එම්.එස්.බටගොඩ මහතා. මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්. | මූල්‍ය පාලනය සහ මූල්‍ය රෙගුලාසි සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරයේ භූමිකාව සහ කාර්යභාරය. | 65 |
| 02 | 2004.01.25 | ගරු රංජිත් රණරාජා මැතිතුමා, අභියාචනාධිකරණයේ විශ්‍රාලත් විනිසුරු | කම්කරු විනිශ්චයාධිකාරවල නඩු කළමනාකරණය සහ නඩු ගලන කළමනාකරණය. | 34 |
| 03 | 2014.02.01 | විනිසුරු කේ.ශ්‍රී පවන් මැතිතුමා | අභියාචනාධිකරණ (ඇපැල් කාර්ය පටිපාටිය ) රීති | 67 |
| 04 | 2014.02.08 | ආචාර්ය බී.එම්.එස්.බටගොඩ මහතා. මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් | මූල්‍ය පාලනය සහ මූල්‍ය රෙගුලාසි සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරයේ භූමිකාව සහ කාර්යභාරය. | 65 |
| 05 | 2014.02.22 | ජයන්ත ජයසූරිය මහතා, අතිරේක සොලිසිටර් ජනරාල් | පරිගණක අපරාධ පනත | 55 |
| 06 | 2014.03.01 | මහාචාර්ය ෂර්යා ෂරෙන් ගුයිවෙල් | පවුල් නීතිය සහ ජාත්‍යන්තර ප්‍රමිතීන් | 46 |

| | | | | |
|---|---|---|---|---|
| 07 | 2014.03.08 | ජයන්ත ජයසූරිය මහතා, අතිරේක සොලිසිටර් ජනරාල් | පරිගණක අපරාධ පනත | 54 |
| 08 | 2014.03.15 | සර්වෙස්වරන් මහතා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සහ පාඨමාලා අධ්‍යක්ෂ, පවුල් හා තුලනාත්මක නීති දෙපාර්තමේන්තුව, කොළඹ විශ්ව විද්‍යාලය. | සේවා ගිවිසුම සහ මෑතකාලීන සංවර්ධන ප්‍රවණතා | 34 |
| 09 | 2014.03.22 | මහාචාර්ය ෂර්යා පරෙන් ගුයිවෙල් | පවුල් නීතිය සහ ජාත්‍යන්තර ප්‍රමිතීන් | 45 |
| 10 | 2014.04.26 | ආචාර්ය වික්‍රම වීරසූරිය මහතා | රක්ෂණ නීතිය. | 43 |
| 11 | 2014.05.10 | ආචාර්ය වික්‍රම වීරසූරිය මහතා | රක්ෂණ නීතිය | 42 |
| 12 | 2014.05.24 | විනිසුරු රෝහිනි මාරසිංහ මැතිණිය | දඩුවම් පැනවීමේ ප්‍රතිපත්තිය | 55 |
| 13 | 2014.06.07 | විනිසුරු රෝහිනි මාරසිංහ මැතිණිය | දඩුවම් පැනවීමේ ප්‍රතිපත්තිය | 55 |
| 14 | 2014.06.21 | ආචාර්ය ඩී.එම්.කරුණාරත්න මහතා | බුද්ධිමය දේපළ | 51 |
| 15 | 2014.07.05 | සර්වෙස්වරන් මහතා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සහ පාඨමාලා අධ්‍යක්ෂ, පවුල් හා තුලනාත්මක නීති දෙපාර්තමේන්තුව, කොළඹ විශ්ව විද්‍යාලය. | කම්කරු විනිශ්චයාධිකාරවල සාධාරණ සහ යුක්ති සහගත අධිකරණ බලය | 34 |
| 16 | 2014.07.26 | විනිසුරු කේ.ශ්‍රී පවන් මැතිතුමා | පළාත්බද මහාධිකරණවල රිට් අධිකරණ බලය | 37 |
| 17 | 2014.08.02 | වෛද්‍ය රුවන් ඉලේපෙරුම | අපරාධ යුක්ති ක්‍රමය තුළ ඩී.එන්.ඒ.තාක්ෂණය | 58 |
| 18 | 2014.09.06 | වෛද්‍ය අජිත් තෙන්නකෝන් | අපරාධ යුක්ති ක්‍රමය තුළ අධිකරණ වෛද්‍ය නිලධාරිවරයාගේ භූමිකාව | 58 |
| 19 | 2014.09.13 | විනිසුරු කේ.ශ්‍රී පවන් මැතිතුමා | පළාත්බද මහාධිකරණවල රිට් අධිකරණ බලය | 31 |
| 20 | 2014.09.20 | වෛද්‍ය අජිත් තෙන්නකෝන් | අපරාධ යුක්ති ක්‍රමය තුළ අධිකරණ වෛද්‍ය නිලධාරිවරයාගේ භූමිකාව | 60 |

| | | | | |
|---|---|---|---|---|
| 21 | 2014.09.27 | ජේ.එම්.ආර්.ජයසුන්දර මහතා | සැක කටයුතු ලේඛන පරීක්ෂාව | 44 |
| 22 | 2014.10.04 | ජේ.එම්.ආර්.ජයසුන්දර මහතා | සැක කටයුතු ලේඛන පරීක්ෂාව | 43 |
| 23 | 2014.10.11 | ජනාධිපති නීතිඥ උදිත ඉහලගේවා | පරිබාහිර මූලාශ්‍රකරණය | 36 |
| 24 | 2014.10.18 | විනිසුරු රෝහිනී මාරසිංහ මැතිණිය | දඬුවම් පැනවීමේ නියාමන | 70 |
| 25 | 2014.10.25 | විනිසුරු රංජිත් සිල්වා මැතිතුමා | දිසා අධිකරණ වල පශ්චාත් නඩු විභාග කාර්ය පටිපාටිය | 46 |
| 26 | 2014.11.01 | සරත් ජයමාන්න මහතා, අතිරේක සොලිසිටර් ජනරාල් | වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරිම | 60 |
| 27 | 2014.11.15 | විනිසුරු ප්‍රියසාද් ඩෙප් | සාක්ෂි ඇගයීම සහ මහාධිකරණවල දී විනිශ්චයකාවරයාගේ භූමිකාව | 70 |
| 28 | 2014.11.22 | සරත් ජයමාන්න මහතා, අතිරේක සොලිසිටර් ජනරාල් | වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරිම | 61 |
| 29 | 2014.11.29 | විනිසුරු පී.ඒ.රත්නායක මැතිතුමා | අද්මිරාල්ති අධිකරණ බලය | 67 |
| 30 | 2014.12.13 | විනිසුරු රංජිත් සිල්වා මැතිතුමා | දිසා අධිකරණවල පශ්චාත් නඩු විභාග කාර්ය පටිපාටිය | 50 |




**(ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය විසින් පවත්වන ලද ළමා යුක්තිය පිළිබඳ පුහුණු වැඩසටහන)**

## 2. වැඩමුළු

1 "මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව; මහ බැංකුවේ නියාමන සහ අධීක්ෂණ කාර්යය" පිළිබඳ 2014 ජනවාරි 31 වන දින ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනයේ ශ්‍රවණාගාරයේ දී අධිකරණ නිළධාරින් 51 දෙනෙකු සඳහා වැඩමුළුවක් පවත්වනු ලැබිණි.

2. "යුක්තිය පසිඳලීම ප්‍රමාද වීම සහ ඊට පිළියම්" පිළිබඳව විනිසුරු ගරු ජේ. එෆ්. ඒ. සෝසා අනුස්මරණ දේශනය ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනයේ ශ්‍රවණාගාරයේ දී අධිකරණ නිළධාරින් 41 දෙනෙකුගේ සහභාගිත්වයෙන් පවත්වනු ලැබිණි.




**(විනිසුරු ගරු ජේ.එෆ්.ඒ සෝසා අනුස්මරණ දේශනය ජනාධිපති නීතිඥ ෆායිස් මුස්තාෆා මහතා විසින් පවත්වන අයුරු)**

**3. විදේශීය විනිශ්චයකාරවරුන් සහ විදේශීය සම්පත් දායකයන් විසින් පවත්වනු ලැබූ ආරාධිත දේශන.**




**(විනිසුරු ගරු රොගජර් හන්ට් මහතා නඩු කළමනාකරණය සහ සමථකරණය පිළිබඳ පුහුණු වැඩසටහනක් පවත්වමින් )**

1. ඇමරිකා එක්සත් ජනපදයේ නෙවාඩාහි ජ්‍යෙෂ්ඨ දිසා විනිසුරු ගරු රොජර් හන්ට් මැතිතුමා විසින් "නඩු කළමණාකරණය සහ සමථකරණය" පිළිබඳව 2014 ජූලි 24 සහ 25 යන දිනවල දී හික්කඩුව ලෝන්ග් බීච් හෝටලයේ දී දකුණු පළාත් විනිසුරුවරුන් අමතා දේශනයක් පවත්වන ලදි.

2. "නඩු කළමනාකරණයේ නව ප්‍රවනතා සහ නූතන යුගයේ අධිකරණ චර්යාවන්" පිළිබඳ ආරාධිත දේශනය එක්සත් ජනපදයේ අභියාචනාධිකරණ ජ්‍යෙෂ්ඨ විනිශ්චයකාර සහ ප්‍රධාන විනිශ්චයකාර ගරු ජෝන් ක්ලිෆර්ඩ් වොලස් මහතා විසින් පහත සඳහන් දිනවල දී පවත්වන ලදි.

| දිනය | ප්‍රදේශය / දිස්ත්‍රික්කය | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|
| 2014.01.27 | කොළඹ | 51 |
| 2014.01.28 | හපාලොන්නරුව, නුවරඑළිය, මහනුවර, මාතලේ, අනුරාධපුරය | 34 |
| 2014.01.29 | කොළඹ, ගාල්ල, මාතර, ගම්පහ සහ කළුතර | 60 |

3. "නඩු කළමනාකරණය සහ සමථකරණය" පිළිබඳ වැඩමුළුව උතුරු පළාතේ විනිශ්චයකාරවරුන් සඳහා 2014 අගෝස්තු 4 සහ 5 යන දිනවල යාපනයේ, තල්සෙවණ හොලිඩේ රිසෝට්හි දී පවත්වනු ලැබිණි. එහි දී ඇමරිකා එක්සත් ජනපදයේ, නේවාඩාහි ජෝර්ජ් දිසා විනිසුරු ගරු රොජර් හන්ට් මහතා විසින් වැඩමුළුව මෙහෙයවන ලදි.



4. "නඩු කළමනාකරණය සහ සමථකරණය " පිළිබඳ වැඩමුළුව නැගෙනහිර පළාතේ විනිශ්චයකාරවරුන් සඳහා 2014 අගෝස්තු 23 සහ 24 යන දිනවල පාසිකුඩාහි අමායා බීච් හොලිඩේ රිසෝට්හි දී පවත්වනු ලැබිණි. එහි දී ඇමරිකා එක්සත් ජනපදයේ, නෙවාඩාහි ජෝජ්ය දිසා විනිසුරු ගරු රොගර් හන්ට් මහතා විසින් වැඩමුළුව මෙහෙයවන ලදි.

5. "නඩු කළමනාකරණය සහ සමථකරණය" පිළිබඳ වැඩමුළුව උතුරු මැද සහ මධ්‍යම යන පළාත්වල විනිශ්චයකාරවරුන් සඳහා 2014 ජූලි 30 සහ 31 යන දිනවල අනුරාධපුර, හෙරිටේජ් හෝටලයේ දී, පවත්වනු ලැබිණි. එහි දී, ඇමරිකා එක්සත් ජනපදයේ නෙවාඩාහි ජෝජ්ය දිසා විනිසුරු ගරු රොජර් හන්ට් මහතා විසින් වැඩමුළුව මෙහෙයවන ලදි.

6. ඇමෙරිකා එක්සත් ජනපදයේ ජෝජ්ය දිසා විනිසුරු ගරු රොජර් හන්ට් මහතා විසින් "විනිශ්චයාසනය සහ නීතිඥවරුන්ගේ භූමිකාව" පිළිබඳව අධිකරණ නිලධාරින් සඳහා කරුණු ප්‍රදර්ශනය කිරීමක් 2014 ජූලි මස 23 වන දින මහනුවර උසාවි සංකීර්ණයේ දී පවත්වන ලදි.



**(විනිශ්චයකාර ගරු ක්ලිෆර්ඩ් වොලස් මැතිතුමා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ දී කරුණු ප්‍රදර්ශනය කරමින්)**

## 4. විදේශීය පුහුණු වැඩසටහන්

1. "අධිකරණ ආචාර ධර්ම සහ ඵලදායි අධිකරණ සහ සිද්ධි කළමණාකරණය" සම්බන්ධයෙන් මැලේසියාවේ අධිකරණ සහ නීති පුහුණු ආයතනයේ දී 2014ජනවාරි 19 සිට 25 දක්වා විනිශ්චයකාරවරුන් 40 දෙනෙකු පුහුණුවක් ලබා දෙන ලදී.

2. "අධිකරණ ප්‍රතිසංස්කරණ සහ විශිෂ්ඨත්වය" සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීම සඳහා 2014 අප්‍රේල් මස 07 සිට 11 දක්වා සිංගප්පූරුවේ සිවිල් සේවා පාසැල සහ අනුබද්ධ උසාවි වෙත අධ්‍යයන චාරිකාවක් සිදු කරන ලදී. මෙම වැඩසටහන සිංගප්පූරුවේ රාජ්‍ය අධිකරණ සහ සිංගප්පූරුවේ සිවිල් සේවා පාසැල එක්ව සංවිධානය කර තිබුණි. මහාධිකරණ විනිසුරුවරුන් 15 දෙනෙකු ඇතුළු, අධිකරණ නිලධාරීන් 24 දෙනෙකු පාඨමාලාවට සහභාගී වූ අතර, එහි දී ඔවුන්ට යහපාලනයේ මූලිකාංග සහ එය ප්‍රතිපත්ති බවට පරිවර්තනය කර ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳ සමස්ත දැක්මක් ලබා දෙන ලදී.

3. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය මගින් සම්බන්ධීකරණය කරනු ලැබූ 2014 අප්‍රේල් මස 7 වන දින සිට අප්‍රේල් මස 11 දක්වා මැලයාසියාවේ අධිකරණ සහ නෛතික පුහුණු කිරීමේ ආයතනයේ පවත්වනු ලැබූ" අධිකරණ ආචාර ධර්ම, ඵලදායි අධිකරණ සහ නඩු කළමනාකරණය" පිළිබඳ පාඨමාලාව. එම වැඩසටහනේ දී පහත දැක්වෙන මාතෘකා සාකච්ඡා කරන ලදී.

- විනිශ්චයකාරවරුන් සම්බන්ධයෙන් පවතින ආචාර ධර්ම පද්ධතිය - 2009
- අධිකරණ නිලධාරීන් සම්බන්ධයෙන් ආචාර ධර්ම පද්ධතිය.
- මලයාසියානු අධිකරණයන්හි මානව සම්පත් කළමණාකරණය.
- අධිකරණ මධ්‍යස්ථතාව.
- විනිශ්චය සඳහන් කිරීම.
- ලේඛන සම්පූර්ණ කිරීම
- නඩු නියම කිරීම සහ පැවරීම.
- අභියාචනා අධිකරණයේ සහ නඩු විභාග කරනු ලබන අධිකරණයේ අධිකරණ ලිත් වර්ෂය කළමනාකරණය කිරීම.

4. ශ්‍රී ලාංකීය විනිශ්චයකාරවරුන් සඳහා අධිකරණ කළමනාකරණය, නඩු කළමනාකරණය, සිවිල් නීති ප්‍රතිසංස්කරණය සහ පවුල් නීති ප්‍රතිසංස්කරණය පිළිබඳ පුහුණු වැඩසටහන 2014 අප්‍රේල් මස 16 වන දින සිට සිට 19 දින දක්වා ඉන්දියාවේ නවදිල්ලි නුවර අධිකරණ අධ්‍යාපන ආයතනයේ දී පවත්වනු ලැබිණි. මෙම වැඩසටහන මගින් විනිසුරුවන්ට නීති විෂයේ පහත දැක්වෙන අංශ සම්බන්ධයෙන් පුළුල් දැනුමක් ලබාගත හැකි විය.

- විශේෂයෙන් ම පවුල් ආරවුල් සඳහා පිහිටුවන ලද පවුල් අධිකරණ
- අධිකරණ පරිශ්‍රය තුළ ඇති සමථකරණ මධ්‍යස්ථාන.
- අධිකරණ ක්‍රියාවලිය පාලනය කිරීම පිණිස විනිසුරු කේන්ද්‍ර කරගත් පද්ධතියක් යොදා ගැනීම.
- විනිශ්චයකාරවරයන් සඳහා නීති පර්යේෂණ නිලධාරීන් ලබාදීම.



**(ඉන්දියාවේ දී ලබා දුන් විදේශීය පුහුණුව)**

### 5. අධිකරණ රෙජිස්ට්‍රාර්වරුන් සඳහා පුහුණු වැඩසටහන

1. "නවූ ප්‍රවාහ කළමනාකරණයේ දී සහ අධිකරණ පරිපාලනයේ දී අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගේ භූමිකාව" පිළිබඳ වැඩසටහන අධිකරණ රෙජිස්ට්‍රාර්වරුන් සඳහා 2014 ජූලි මස 19 වන දින පවත්වනු ලැබිණි.

## 10. ජාත්‍යන්තර සහයෝගීතාව

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය 2014 නොවැම්බර් මාසයේ දී අධිකරණ පුහුණුව සඳහා වන ජාත්‍යන්තර සංවිධානයේ විධායක කමිටුවේ තීරණය ප්‍රකාරව අධිකරණ පුහුණුව සඳහා වන ජාත්‍යන්තරයේ සාමාජිකත්වය ලබා ගන්නා ලදි. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය, යුරෝපා සංගමයේ සහාය ඇතිව සයිබර් අපරාධ සහ ඉලෙක්ට්‍රොනික සාක්ෂි පිළිබඳ පුහුණු වැඩසටහන් ගණනාවක් පැවැත්වීමට සැලසුම් කරමින් සිටින අතර, ඒ පිළිබඳ මූලික සාකච්ඡා 2014 වර්ෂයේ දී යුරෝපා සංගමයේ නියෝජිත මණ්ඩලය සමග ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ දී පවත්වනු ලැබිණි.



**(ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයට පැමිණි යුරෝපා සංගමයේ නියෝජිත මණ්ඩලය )**

## 11 අනාගතයේ දී පැවැත්වීමට අපේක්ෂා කරන පාඨමාලා.

- නඩු කළමනාකරණය සහ සමථකරණය.
- භාෂා පුහුණුව.
- ඩී.එන්.ඒ සාක්ෂි.
- අධිකරණ වෛද්‍ය විද්‍යාව.
- තැනැත්තන් පිටුවහල් කිරීමේ නීතිය.
- නිපේදනය සහ සමථකරණය.
- අද්මිරාල්ති නීතිය.
- අභියාචනාධිකරණ (අභියාචනා කාර්ය පටිපාටිය) නීති.
- විනිශ්චය සටහන් කිරීම.
- දඬුවම් නියම කිරීමේ මාර්ගෝපදේශ.

## 12. අද්වීතීය ගිණුම්කරණ ප්‍රතිපත්තිය

පිළිගත් ගණකාධිකරණ ප්‍රතිපත්තිවලට අනුකූල වන ආකාරයට මූල්‍ය ප්‍රකාශන සකස් කරනු ලබන අතර, ගණකාධිකරණ සම්මතයන් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ ගණකාධිවරුන් විසින් නියම කරනු ලබයි

# 13. ඇගයීම

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය පහත සඳහන් ආයතනවලින් ලබාදුන් සහයෝගය ඇගයීමට පාත්‍ර කරයි.

1. අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් සහ කාර්ය මණ්ඩලය
2. අධිකරණ සේවා කොමිෂන් සභාව
3. මහා භාණ්ඩාගාරයේ ලේකම් සහ කාර්ය මණ්ඩලය
4. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන
5. විගණකාධිපති සහ ඔහුගේ කාර්ය මණ්ඩලය
6. අධිකාරිවරයා සහ ඔහුගේ කාර්ය මණ්ඩලය
7. ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්
8. අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර්
9. ශ්‍රේෂ්ඨාධිකරණයේ මාපල්

***රුවන් ප්‍රනාන්දු.***

***මහාධිකරණ විනිසුරු සහ***

***අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය.***

# 14. ශේෂ පත්‍රය

**2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ**

**ආයතනයේ මූල්‍ය තත්ත්වය**

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය

2014.12.31 දිනට ශේෂපත්‍රය.

| | සටහන් | 2014 | | 2013 |
|---|---|---|---|---|
| | | රුපි. ශත | රුපි. ශත | රු. ශත |
| **වත්කම්** | 1 | | | |
| ජංගම නොවන වත්කම් | | | 5,478,220.68 | 6,047,338.48 |
| **ජංගම වත්කම්** | | 66,956.40 | | 8,000.00 |
| තොග (කාර්යලීය ලිපිද්‍රව්‍ය) | | 257,376.32 | | 247,300.99 |
| ඉතිරි කිරීමේ ගිණුම 2014.12.31 | | 13,889,048.39 | 14,213,381.11 | 156,217.35 |
| ජංගම ගිණුම 2014.12.31 | | | **19,691,601.79** | **6,458,856.74** |
| **මූල්‍යනය වත්නේ** | | | | |
| සමුච්චිත අරමුදල 2 | 2 | 6,315,212.63 | | 4,302,360.93 |
| | | 12,827,455.45 | 19,142,668.08 | 2,131,220.81 |
| එකතු කළා/(අඩු කළා) : අතිරික්තය / (හිගය) | | | | 6,433,581.74 |
| **ජංගම වගකීම** | | | | |
| විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන | | 261,728.00 | | 24,800.00 |
| මුද්දර ගාස්තු සඳහා ප්‍රතිපාදන | | 475.00 | | 475.00 |
| උපචිත වියදම් | 3 | 143,926.96 | | |
| ගෙවිය යුතු අනෙකුත් ගාස්තු | 4 | 142,803.75 | | |
| | | | 548,933.71 | |
| | | | | **25,275.00** |
| | | | 19,691,601.79 | **6,458,856.74** |

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල වන ආකාරයට සකස් කොට ඉදිරිපත් කර ඇත.

2014 දෙසැම්බර් මස 31 වන දින දක්වා කටයුතු සහ 2014 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන වර්ෂයේ අතිරික්තය පිළිබඳව සත්‍ය සහ සාධාරණ දැක්මක් ඉහත මූල්‍ය ප්‍රකාශනය මගින් ඉදිරිපත් කරන බවට සහතික වෙමු.

සකස් කළේ

.....................................................

කේ.ලක්පිකා චතුරානි.

සහකාර ගණකාධිකාරී

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය.

.....................................................

ගරු.එම්.ආර්.සී.ප්‍රනාන්දු.

අධ්‍යක්ෂ.

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය.

# 15. ආදායම් සහ වියදම් ගිණුම

**<u>2014 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය.</u>**

| | සටහන් | 2014 | | 2013 |
|---|---|---|---|---|
| | | රුපි. ශත | රුපි. ශත | රුපි. ශත |
| **<u>වියදම</u>** | | | | |
| අමාත්‍යාංශ අග්‍රිමය. | **5** | | 25,247,031.84 | 10,303,501.87 |
| ඉතිරි කිරීමේ ගිණුම් වලින් අග්‍රිම ආදායම | | | 10,075.33 | 11,40.32 |
| ඡායා පිටපත් ගාස්තු ආදායම | **6** | | 17,184.02 | 8,592.00 |
| නවාතැන් ගාස්තු | **7** | | 34,000.00 | 4,000.00 |
| ශ්‍රේෂ්ඨාධිකරණයෙන් | | | | 2,000.00 |
| වෙනත් ආයතන මගින් සිදු කළ ගෙවීම් | **8** | | <u>713,548.01</u> | |
| **මුළු ආදායම** | | | 26,021,839.18 | 10,329,564.19 |

| | | | | |
|---|---|---|---|---|
| **අඩු කළා- වියදම්** | | | | |
| වැටුප් හා වේතන | | (1,617,896.50) | | (511,866.57) |
| සේවක අර්ථසාධක අරමුදල සඳහා වියදම් | | (97,695.12) | | - |
| සේවක භාරකාර අරමුදල සඳහා වියදම් | | (24,423.78) | | - |
| සේවක භාරකාර අරමුදල සඳහා අධිභාර වියදම් | | (155.63) | | - |
| අතිකාල | | (260,611.69) | | (70,723.82) |
| නිල ඇඳුම් දීමනා | | (4,000.00) | | (4,000.00) |
| සම්මන්ත්‍රණ සහ පුහුණු වැඩසටහන් සඳහා වියදම් | | (6,174,491.41) | | (3,133,800.00) |
| සම්මන්ත්‍රණ හා වෙනත් වැඩසටහන් සඳහා ආහාරපාන | | (631,437.00) | | - |
| පුවත්පත් සැපයීම | | (14,460.00) | | - |
| තැපැල් ගාස්තු | | (25,473.00) | | - |
| කාර්යාලීය ලිපිද්‍රව්‍ය වියදම් | | (181,730.10) | | (468,890.58) |
| විශ්‍රාමික පාරිතෝශිකය | | - | | (167,800.00) |
| ගමන් වියදම් | | (6,900.00) | | (2,240.00) |
| ඉන්ධන | | (212,471.00) | | (153,915.40) |
| වෙනත් සේවා සහ සැපයුම් | | (766,826.76) | | (126,361.24) |
| වාහන නඩත්තු කටයුතු | | - | | (53,083.25) |
| පිරියත, යන්ත්‍රෝපකරණ හා උපකරණ නඩත්තු කටයුතු | | (421,921.78) | | (151,297.38) |
| දුරකථන සහ අන්තර්ජාල ගාස්තු | | (299,008.95) | | (495,692.68) |
| පිරිසිදු කිරීමේ ගාස්තු | | (403,756.00) | | (2,299,527.00) |
| බැංකු ගාස්තු | | (5,250.00) | | (3,000.00) |
| අවප්‍රමාණ | | (1,279,081.55) | | (556,144.96) |
| විගණන ගාස්තු | | (236,928.00) | | - |
| | | (529,865.46) | | - |

| | | | | |
|---|---|---|---|---|
| විදුලිය සහ ජලය සඳහා වියදම් | | | (13,194,383.73) | (8,198,343.38) |
| **මූළ වියදම්** | | | (12,827,455.45) | (2,131,220.81) |
| සමුච්චිත අරමුදලේ අතිරික්තය/(හිගය) | | | | |

## 16. මුදල් ගලනය පිළිබඳ ප්‍රකාශය.

**2014 දෙසැම්බර් 31 දිනෙන් අවසාන් වන වර්ෂය සඳහා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය.**

| | සටහන් | 2014 | | 2013 |
|---|---|---|---|---|
| | | රුපි. ශත | රුපි. ශත | රුපි. ශත |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්.** | | | | |
| **ලැබීම්** | | | | |
| ආමාත්‍යාංශ අග්‍රිමය | | 25,247,031.84 | | 10,303,501.87 |
| ඉතිරි කිරීම් ගිණුම්වලින් ලැබෙන පොලී ආදායම | | 10,075.33 | | 11,470.32 |
| ශ්‍රේෂ්ඨාධිකරණයෙන් නැවත ගෙවීම් | | - | | 2,000.00 |
| ඡායා පිටපත් ගාස්තු ආදායම | | 17,184.00 | | 8,592.00 |
| නවාතැන් ගාස්තු | | 34,000.00 | | 4,000.00 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් ජනිත වූ මුදල් ප්‍රවාහ | | | 25,308,291.17 | 10,329,564.19 |
| | | (6,174,491.41) | | (3,133,800.00) |
| **ගෙවීම්** | | | | |
| සම්මන්ත්‍රණ සහ පුහුණු | | | | |

| | | | | |
|---|---|---|---|---|
| වැඩසටහන් සඳහා ගාස්තු | | | | |
| පුද්ගල පඩිනඩි | | (1,969,553.26) | | (587,590.39) |
| | 9 | | | |
| සැපයුම් | 10 | (1,886,754.26) | | (3,031,694.22) |
| වෙනත් ගෙවීම් | 11 | (1,138,828.86) | | (772,513.31) |
| මුද්දර ගාස්තු සඳහා ප්‍රතිපාදන | | - | | 475.00 |
| මෙහෙයුම් ක්‍රියාකාරම් මගින් ජනිත වූ මුදල් ප්‍රවාහ | | | (11,169,627.79) | (7,525,122.92) |
| **ශුද්ධ මෙහෙයුම් ක්‍රියාකාරම් මගින් ජනිත වූ මුදල් ප්‍රවාහ** | | | **14,138,6638.38** | **2,804,441.27** |
| **ආයෝජන කටයුතු මගින් ජනිත වූ මුදල් ප්‍රවාහ.** | | | | |
| ස්ථාවර වත්කම් මිළදී ගැනීම | 12 | (395,7571.01) | | (2,636,753.60) |
| පොලී ආදායම නැවත ආයෝජනය කිරීම | | (10,075.33) | **(405,832,.34)** | (11,470.32) **(2,6481,223.92)** |
| ආයෝජන කටයුතු මගින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහ | | | | |
| මුදල් සහ මුදල් සහ සමාන දේවල්වල ශුද්ධ වැඩි වීම / (අඩු වීම) | | | 13,732,831.04 | 156,217.35 |
| කාල පරිච්ජේදය ආරම්භයේ දී මුදල් සහ මුදල් හා සමාන දෑ | | | 156,217.35 | - |
| කාල පරිච්ජේදය අවසානයේ දී මුදල් සහ මුදල් හා සමාන දෑ | | | **13,889,048.39** | **156,217.35** |

# 17. ස්ථාවර වත්කම්.

**2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ ශුද්ධ වත්කම්වල ඇති වූ වෙනස්කම්වල ප්‍රකාශය**

| | දායක ප්‍රාග්ධනය | වෙනත් සංචිත | සමුච්චිත අතිරික්තය /(හිගය) | මුළු මුදල (රුපි.) |
|---|---|---|---|---|
| 2014.01.01 දිනට ශේෂය | - | - | 6,315,212.63 | 6,315,212.63 |
| වසර සඳහා ලැබුණ ප්‍රාග්ධන ප්‍රදාන | - | - | - | - |
| වසර තුළ අතිරික්තය /(හිගය) | | | 12,827,455.45 | 12,827,455.45 |
| 2014.12.31 දිනට ශේෂය | - | - | 19,142,668.08 | 19,142,668.08 |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
# AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. JP/C/SLJI/1/14/03

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 22 October 2015

Secretary,
Sri Lanka Judges' Institute.

**Report of the Auditor General on the Financial Statements of the Sri Lanka Judges' Institute for the year ended 31 December 2014 in terms of Section 14(2)(c) of the Finance Act, No. 38 of 1971**

---

Reference to my letter of even number dated 18 September 2015 on the above subject.

SRI LANKA JUDGES' INST. 29 OCT 2015 COLOMBO 12.

02. The above mentioned report is sent here with.

W.P.C. Wickramaratne
Acting Auditor General.

Copies : 1. Secretary - Ministry of Justice.
2. Secretary - Ministry of Finance.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ජේපී/ සී/එස්එල්ජේඅයි/1/14/03 ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2015 සැප්තැම්බර් 18 දින

අධ්‍යක්ෂ,

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය

**ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1985 අංක 46 දරන ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතන පනතේ 10(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ අධ්‍යක්ෂ වෙත 2015 මාර්තු 17 දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරි වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළවන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රීලංරාගිප්‍ර) අනුකූල නොවීම

ශ්‍රීලංරාගිප්‍ර 1 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම - අස්ථිත්වයක් විසින් වියදම්වල ස්වභාවය හෝ අස්ථිත්වය ඇතුළත ඒවායේ කාර්ය මත පදනම්ව වර්ගීකරණයක් යොදා ගනිමින් විශ්වාසදායී හා වඩාත් අදාළ වන තොරතුරු සැපයෙන වියදම් විශ්ලේෂණයක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ මුහුණත හෝ සටහන්වල හෝ ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ දැක්වෙන වියදම් ඉහත අවශ්‍යතාවයට එකඟ වී නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

සමාලෝචිත වර්ෂයේ හා පෙර වර්ෂයේ වියදම් වාර්තා කිරීමේදී සංගත ගිණුම්කරණ ප්‍රතිපත්තියක් අනුගමනය කර නොතිබුණි. එබැවින් එක් එක් කාල පරිච්ඡේදය සඳහා වියදම සැසඳීමට හා ඒ පිළිබඳ අදහස් දැක්වීමට නොහැකි විය.

#### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රේඛීය අමාත්‍යාංශයෙන් ලැබුණු රු.මිලියන 7 ක ප්‍රාග්ධන ප්‍රදානය සාවද්‍ය ලෙස පුනරාවර්තන ආදායම ලෙස ගිණුම්ගත කර තිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය හා 2014 දෙසැම්බර් 31 දිනට සමුච්චිත අරමුදල පිළිවෙලින් එම මුදලින් වැඩියෙන් හා අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) පෙර වර්ෂ තුනකට අදාළ රු.176,928 ක් වූ විගණන ගාස්තු සමාලෝචිත වර්ෂයේ වියදම ලෙස සාවද්‍යාව ගිණුම්ගත කර තිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා අතිරික්තය එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි.

**2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

2004 ජනවාරි 26 දිනැති අංක 2004 /පුස්ත / 1 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල චක්‍රලේඛයේ 3.1 වගන්තියට අනුව, පුස්තකාල පොත්වලට අදාළ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකළ යුතු නමුත් එම සමීක්ෂණය සිදුකර නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් වලින් වූ ප්‍රතිඵලය රු.12,827,455 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,131,221 ක් වූ හෙයින් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.10,696,234 ක වර්ධනයක් දැක්වුණි. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මුළු ආදායම රු.15,692,275 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්ය සාධනය**

සමාලෝචිත වර්ෂය සඳහා කාර්යසාධන වාර්තාවක් විගණනයට ඉදිරිපත් කර තිබුණද, ආයතනයේ අපේක්ෂිත ඉලක්කයන් දක්වමින් සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ආයතනයේ කාර්යසාධනය අපේක්ෂිත ඉලක්කයන් සමඟ සැසඳිය නොහැකි විය.

**4.2 මූල්‍ය කළමනාකරණය**

සමාලෝචිත වර්ෂයේ අවසාන මාස 11 තුළ රු.මිලියන 3 සිට රු.මිලියන 14 ක මුදලක් ආයතනයේ කාර්යයන් සඳහා උපයෝජනය කිරීමෙන් තොරව ආයතනයේ බැංකු ගිණුමේ පැවතුණි.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**5.1 අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත හා තථ්‍ය ආදායම හා වියදම අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) වත්කම් කළමනාකරණය
(ඇ) සැලසුම් කිරීම
(ඈ) මූල්‍ය කළමනාකරණය

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

**1 වන ඇමුණුම**

## සිවිල් නඩු විධාන සංග්‍රහය සංශෝධනය කිරීම පිණිස ඉදිරිපත් කරන කෙටුම් පත් සංශෝධන

## අධිකරණ නඩු කළමනාකරණය පිළිබඳ සිවිල් නඩු විධාන සංග්‍රහය සංශෝධනය කිරීම පිණිස ඉදිරිපත් කරන අවසානාත්මක කෙටුම් පත් සංශෝධන

**2014 දෙසැම්බර් මස**

**ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තිය සංශෝධනය කිරීම**

**(ශ්‍රී ලංකා විනිශ්වයකාරවරයන්ගේ යෝජනාවන්)**

1. ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තිය 73(1) වශයෙන් නැවත අංක කිරීම සහ ඊට ඉක්බිතිවම නව වගන්තියක් එකතු කිරීම මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**උත්තරය.**

1.1. විත්තිකරු විත්තිකරුට සිතාසි භාර දීමේ දින සිට දින 30 ක් ඇතුළත ලිඛිත උත්තරය, එහි පිටපතක් පැමිණිලිකරුගේ නීතිඥ තැනට භාර දී ඇති බවට සහතිකයක් සහිතව අධිකරණයේ රෙජිස්ට්‍රාර් කාර්යාලයට භාර දිය යුතුය.

එසේ වුව ද, විත්තිකරු දින 30 ක කාලය ඇතුළත ලිඛිත උත්තරය ගොනු කිරීම පැහැර හැරීම කළ විටක දී, ලියවිල්ලකින් වූ මෝසමක්, එම දිනයේ සිතාසි ආපසු කැඳවීම කරන දිනයක් වන අවස්ථාවක දී, ඒ අනෙක් පාර්ශ්වයට ලියවිල්ලකින් හෝ වාචිකව ඒ බවට දැන්වීමක් සහිතව ගරු අධිකරණයේ ගොනු කිරීමෙන් පසුව, විත්තිකරුට එකී ලිඛිත උත්තරය, අධිකරණය විසින් සඳහන් කරනු ලැබිය හැකි වෙනත් දිනයක දී, ඊට බලපෑ හේතු ලිඛිතව වාර්තා කර, ගොනු කිරීමට ඉඩ ලබා දිය යුතු අතර, නමුත් එසේ ගොනු කිරීම, සිතාසි ආපසු කැඳවීමේ දින සිට දින 30 කට වඩා ප්‍රමාද නොවිය යුතුය.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 75 වන වගන්තිය සංශෝධනය කිරීම**

2. ප්‍රධාන ප්‍රඥප්තියේ 75 වන වගන්තිය මෙහි පහත සඳහන් පරිදි නව උප වගන්තියක් එක් කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**අධිකරණ ලේඛන භාරදීම සඳහා වන ලිපිනය**

(අ) විත්තිකරුවෙකු විසින් පෞද්ගලිකව ම පෙනී සිටිමින් ගොනු කරන සෑම උත්තරයක ම. අධිකරණ ලේඛන ඒ විත්තිකරුගේ හෝ ඒ විත්තිකරුගේ උත්තරවාදියා (විත්තිකරු යම් එවැනි උත්තරවාදියෙකු මගින් පෙනී සිටින විටක දී. ) පිළිබඳව ඒ විත්තිකරු හෝ ඔහුගේ උත්තරවාදියා විසින් අත්සන් කරන ප්‍රකාශයක් සමග ඉදිරිපත් කළ යුතුය.

(ආ) එවැනි ලිපිනයක් විත්තිකරු පෞද්ගලිකව ම පෙනී සිටින විටක දී. විත්තිකරුගේ අලුත් ලිපිනයක් ඇතුළත් ප්‍රකාශයක් අධිකරණයේ ගොනු කිරීම මගින් කලින් කලට වෙනස් කිරීම කරනු ලැබිය හැකිය.

(ඇ) ඉහත (අ) උපවගන්තිය යටතේ කරන ප්‍රකාශයකින් ඉදිරිපත් කරන ලිපිනය විත්තිකරුගේ ලේඛනගත ලිපිනය වශයෙන් සඳහන් කළ යුතු අතර. එම ලිපිනය ඉහත කී පරිදි යථා පරිදි වෙනස් කරනු ලබන තෙක් යම් නඩුවක හෝ ඒ නඩුවේ යම් නඩු තීන්දුවක හෝ නියෝගයක අභියාචනාවක් ඉදිරිපත් කිරීමේ දී සහ එය ක්‍රියාත්මක කිරීමේ දී සියලු ම අධිකරණ ලේඛන භාර දීමේ කාර්ය සඳහා එවැනි පාර්ශ්වයක ලිපිනය විය යුතු බවට සැලකිය යුතු වන අතර. ඒ නඩු නිමිත්ත හෝ කාරණය අවසානාත්මක වශයෙන් තීරණයක් කරන තෙක් ඉහත කී පරිදි බලාත්මකව පැවතිය යුතුය.

(ඈ) යම් වෙනත් ලිඛිත නීතියක අඩංගු විධිවිධානවලට යටත්ව. යම් කවර ම අධිකරණ ලේඛනයක් භාර දීම ඒ විත්තිකරු එවැනි ලිපිනයක පදිංචි වී සිටියේ වුව ද. සියලු ම කාර්යන් සඳහා ඒ විත්තිකරුගේ ලේඛනගත ලිපිනයේ දී විත්තිකරු සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරනු ලැබිය හැකිය.

(ඉ) මෙම උපවගන්තිය නිසා යම් අධිකරණ ලේඛනයක් භාර දීම යම් වෙනත් එවැනි ලිපිනයක් ඇත්නම් යම් කවර ම වූ හේතුවක් නිසා එම ලිපිනයට භාර දීම කරන ලෙස ගරු අධිකරණය විසින් සුදුසු යයි සලකන්නේ නම් එසේ කරන ලෙස නියෝග කිරීමෙන් වළක්වනු නොලැබිය යුතුය.

<u>X වන පරිච්ඡේදය</u>

**ප්‍රතිඋත්තරය සහ තවදුරටත් උත්තරවාද**

**ප්‍රධාන ප්‍රඥප්තියේ 79 වන වගන්තිය සංශෝධනය කිරීම**

**3**. ප්‍රධාන ප්‍රඥප්තියේ **73** වන වගන්තිය මෙයින් පරිච්ඡින්න කරන අතර. ඒ වෙනුවට මෙහි පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ.

හරස් ඉල්ලීමක දී. විත්තිකරුවකු විසින් හිමිකම් පෑමක් ඉදිරිපත් කර ඇත්නම් මිස. උත්තරයකට පසු උත්තරවාද. විත්තිකරු මත සිතාසි භාර දීමේ දින සිට දින **30** ක් ඇතුළත උත්තරය ගොනු කර ඇති අවස්ථාවක දී ගරු අධිකරණයේ රෙජිස්ට්‍රාර් කාර්යාලයේ දී උත්තරය ගොනු කිරීමට තදනන්තරව විශේෂ මෝසමක් ගොනු කිරීමට කටයුතු කරන්නේ නම් හෝ ගරු අධිකරණය විසින් සුදුසු යයි සලකන නඩු ගාස්තු සම්බන්ධයෙන් එවැනි කොන්දේසි මත සිතාසි ආපසු කැඳවීමේ දිනට උත්තරය ගොනු කිරීමේ දිනය වන විටක දී. අධිකරණයේ නියෝගය ඇත්නම් මිස ගොනු නොකළ යුතුය.

එසේ වුව ද, එවැනි හරස් ඉල්ලීමක් ගරු අධිකරණයේ ගොනු කිරීමට ඉඩ සලසමින් එවැනි නියෝගයක දින සිට දින 14 ක කාලයක් ඇතුළත ගොනු කළ යුතු අතර, එවැනි දිනයක් නඩු කළමනාකරණ සම්මේලනය පැවැත්වීම පිණිස පළමුව නියම කරන ලද දිනට පෙරාතුව වන දිනයක් විය යුතුය.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන පරිච්ඡේදයට ඉක්බිතිව ම මෙහි පහත සඳහන් අලුත් පරිච්ඡේදය මෙයින් ඇතුළත් කරන අතර, එම පරිච්ඡේදය ප්‍රධාන ප්‍රඥප්තියේ 10(ආ) පරිච්ඡේදය වශයෙන් බලපැවැත්විය යුතුය.

**පූර්ව නඩු විභාග පියවර සඳහා අධිකරණ නඩු කළමණාකරණය සහ**

**ප්‍රතිලේඛනගත සම්මේලන**

**79අ**(1) විත්තිකරුගේ උත්තරය ගොනු කිරීම සඳහා නියම කරන ලද දිනයේ දී, හෝ ප්‍රතිඋත්තරය ගොනු කිරීම සඳහා අවසර ලබා දීම හෝ නොදීම සිදු වන අවස්ථාවක දී, අධිකරණය නඩු කළමනාකරණය සහ ප්‍රතිලේඛනගත සම්මේලනයක් සඳහා දිනයක් නියම කරමින් නියෝගයක් (එක්ස්.1 ආකෘතියෙන් එවැනි නියෝගයක් නිකුත් කිරීමේ දින සිට දින **30** ක දී එකී නියෝගයේ සඳහන් දින **28** ක් ඇතුළත බද්ධ හෝ වෙන් වූ යෝජිත නඩු කටයුතු සැලැස්ම සාකච්ඡා කොට ලියවිල්ලකින් සකස් කොට අධිකරණයේ රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ගොනු කිරීමට නීතිඥ තැනට නියම කරමින් නිකුත් කළ යුතුය. එවැනි සැලැස්මක පහත සඳහන් කරුණු අඩංගු විය යුතුය.

(අ) නඩුව පිළිබඳ කෙටි විස්තරයක් ;

(ආ) ආරවුල් නොකරන සිද්ධිමය හෝ නීතිමය කරුණු ;

(ඇ) ආරවුල් කරන සිද්ධිමය හෝ නීතිමය කරුණු ;

(ඈ) අධිකරණයේ අධිකරණ බලය සඳහා පදනම ;

(ඉ) උත්තරවාද හෝ පාර්ශ්වකරුවන්ගේ සාවද්‍ය එක් කිරීම හෝ නඩු නිමිත්ත සම්බන්ධයෙන් යම් කවර ම වූ අපේක්ෂිත සංශෝධන තිබේද යන වග ;

(ඊ) සොයා ගැනීම, විචාරණ, පරීක්ෂා, ලේඛනවල සැබෑ බව පිළිගැනීම, නඩු භාණ්ඩ, ලේඛන පරීක්ෂා කිරීම සහ මෝසම / ඉල්ලීම් පිළිබඳ යෝජිත උපලේඛනයක් ,

(උ) කොමිපත් සභාව හෝ විශේෂඥයන් සඳහා අපේක්ෂිත අවශ්‍යතාව ,

(ඌ) අපේක්ෂිත සමථයක් සඳහා අවකාශයක් තිබේ ද යන වග සහ පාර්ශ්වකරුවන් විසින් කුමන ආකාරයේ සමථ උත්සාහයන් සිදුකර ඇත්තේ ද යන වග ,

(එ) පූර්ව නඩු විභාගසම්මේලන සහ නඩු විභාග සඳහා යෝජිත දින පිළිබඳ ඒකාබද්ධ ප්‍රකාශයක් ;

(ඒ) නඩු කළමනාකරණ සම්මේලනයේ දී නඩු විභාගය ;

**79අ(2)** නඩු කළමනාකරණ සම්මේලනය සඳහා නියම කරන දිනයේ දී නීතිඥ තැනගේ සහ / හෝ පාර්ශ්වකරුවන්ගේ සහයෝගය ඇතිව පූර්ව නඩු විභාග පියවර සඳහා සැලසුම් කරන ලද දින නියම කළ යුතු අතර, එක්ස් **2** ආකෘතියෙන් ප්‍රතිලේඛනගත නියෝගයක් (සිද්ධි කළමණාකරණ සැලස්මේ නියෝගය) නිකුත් කළ යුතුය.

**නඩු කළමනාකරණ සම්මේලනයේ පොදු බලතල**

**79අ(3)** නඩු කළමනාකරණ සම්මේලණයේ දී පුද්ගලිකව ම හෝ දූරකථනයෙන් හෝ ස්කයිප් මාධ්‍ය ඔස්සේ හෝ වීඩියෝ සම්මේලන මාධ්‍ය හෝ ඊට සමාන වෙනත් යම් සන්නිවේදන මාධ්‍යයක් හරහා පාර්ශ්වකරුවන් හෝ ඔවුන්ගේ නීතිඥවරුන්ගෙන් ප්‍රශ්න ඇසීමට අධිකරණයට බලය තිබිය යුතු අතර, ඔවුන්ගේ අදාල නඩුකර ප්‍රකාශ කිරීම සඳහා කැඳවීම් කළයුතු අතර, යම් වෙනත් ලිඛිත නීතියක අවසර දී ඇති පරිදි, නියෝගවලට අමතරව නඩු කළමනාකරණ සඳහා පූර්ව නඩු විභාග නියෝග නිකුත් කළ යුතුය.

(අ) උත්තරවාද, පාර්ශ්වකරුවන් එක් කිරීම, සහ සාවද්‍ය එක් කිරීම, නඩු නිමිති, කොම්පත් සහා, අධිකරණය විසින් යම් නිශ්චිත කාල පරාසයක් සඳහා පත් කරන විශේෂඥයන් සම්බන්ධ සංශෝධන සඳහා නියෝග ;

(ආ) අධිකරණ බලය ආශ්‍රිත කාරණා සම්බන්ධ නියෝග ;

(ඇ) ආරවුල්ගත සහ ආරවුල්ගත නොවන සිද්ධිමය සහ නීතිමය කරුණු පිළිබඳ විසඳනාවන් නිශ්චයනය කිරීම ;

(ඈ) විචාරණ සඳහා අපේක්ෂිත සොයා ගැනීම්, අවශ්‍යතා සහ නියෝග, අධික්ෂණ, ලේඛනවල සත්‍ය බව සහ යම් නිශ්චිත කාල පරාසයක් තුළ ඉලෙක්ට්‍රොනික වශයෙන් ගබඩා කර ඇති තොරතුරු, සොයා ගැනීම සහ මෝපත් / ඉල්ලීම් අනාවරණය කිරීම හෝ සොයා ගැනීම ඇතුළුව ලේඛන ඉදිරිපත් කිරීම ;

(ඉ) යම් නිශ්චිත කාල පරාසායක් තුළ මෝසම ඉල්ලීම් සඳහා අවශ්‍යතාව ;

(ඊ) සමථයක් සඳහා අවකාශයක් තිබෙන්නේ ද යන වග නිශ්චය කිරීම සහ සමථයක් සඳහා කවර උත්සාහයන් දරා තිබෙන්නේ ද යන වග සහ ඒ අනුව නියෝග නිකුත් කිරීම ;

(උ) නඩුව සමථකරණය සඳහා සුදුසු වන්නේ ද යන වග නිශ්චයනය කිරීම සහ සමථයක් තිබේ නම් එවැනි සමථකරණයක් සඳහා පාර්ශ්වකරුවන් එකගතාවයට එළඹී ඇතැයි යන කාරණය සම්බන්ධයෙන් ප්‍රකාශයක් සහ ඒ අනුව නියෝග නිකුත් කිරීම ;

(ඌ) යෝජිත අවසානාත්මක පූර්ව නඩු විභාග සම්මේලනය සඳහා දෙපාර්ශ්වයේ ම නීතිඥවරුන්ට එකග විය හැකි යෝජිත වෛකල්පිත දින **03**ක් නියම කිරීම සහ නඩු විභාගය ;

(එ) අදාල අධිකරණයේ හෝ යොමු කරන අධිකරණයේ සමථ වැඩසටහනේ දී සමථයට එකග වීම පිණිස පාර්ශ්වකරුවන් දිරිමත් කිරීම ;

(ඒ) රජයේ නිලධරයෙකු හෝ අර්ධ රාජ්‍ය ව්‍යවස්ථාපිත ආයතනය, පළාත් සභාවක හෝ පළාත්පලාන ආයතනයක භාරයේ තිබෙන යම් කවර ම වූ ලේඛන යම් නිශ්චිත කාල පරාසයක් තුළ නිකුත් කරන ලෙස නියෝග කිරීම.

(ඔ) අදාල නඩුකරය නියම කරන ලද කාල පරාසයක් තුළ වේගවත් අයුරින් විභාග කොට විසදා අවසන් කිරීමේ දී ආධාර විය හැකි සියලු ම වෙනත් පූර්ව නඩු විභාග පියවර ගැනීම සහ නඩුකරය වේගවත්ව සහ වියදම් දැරීමකින් තොරව විභාග කොට විසදා අවසන් කිරීම පිණිස අවශ්‍ය වන හෝ යෝග්‍ය වේ යැයි අධිකරණය විසින් අධිකරණයට පෙනී යන යම් එවැනි ආකාරයේ වෙනත් නියෝග අපේක්ෂා කිරීම සහ නිශ්චය කිරීම ;

**79අ(4)** නඩු කළමනාකරණ සම්මේලනය අවසානයේ දී අධිකරණය විභාගයට ගනු ලැබිය යුතු සෑම පූර්ව නඩු විභාග නියෝගයක් සඳහා ම නිශ්චිත කාලසීමාවක් ද සමග ඉහත කී පූර්ව නඩු විභාග නියෝග නියෝග නිකුත් කළ යුතු අතර, නියම කරන ලද කාලසීමාව තුළ දී පාර්ශ්වකරුවන් එකී නියෝගවලට අවනත විය යුතුය. විශේෂ අවස්ථානුගත තත්ත්වයන් වන බවට තීරණයක් කිරීමෙන් පසුව අධිකරණයට යම් පූර්ව නඩු විභාගයක නියෝගයක කාලසීමාව වෙනස් කිරීම හෝ දීර්ඝ කිරීම සිදු කළ හැකිය.

**79අ(5)** නඩු කළමනාකරණ සම්මේලනනය අවසානයේ දී, අධිකරණය, පාර්ශ්වකරුවන්ගේ සහ ඔවුන්ගේ නීතිඥවරුන්ගේ සහයෝගය ඇතිව ඉන් අනතුරුව පැවැත්වීමට නියමිත පූර්ව නඩු විභාග කිරීමේ සම්මේලනයට දිනයක් නියම කළ යුතුය. එකී දිනය නඩු විභාගයට ගැනීමට නියමිත දිනට පෙර දින 15 නොඅඩු දිනයක් විය යුතුය.

**79අ(6)**පාර්ශ්වකරුවකු හෝ ඔහුගේ නීතිඥවරයෙකු නඩු කළමනාකරණ සම්මේලනයේ දී පෙනී සිටීමට අපොහොසත් වන හෝ ඊට සහභාගී වීමට සූදානමක් නොමැති වන හෝ මනා විශ්වාසයකින් තොරව සම්මේලනයට සහභාගී වන හෝ පූර්ව නඩු විභාග නියෝගවලට අවනත වීමට අපොහොසත් වන හෝ අවස්ථාවක දී, අධිකරණය ඔවුන් නොමැතිව මෝසමක් හෝ අධිකරණය විසින්ම හෝ නඩු කටයුතු ඉදිරියට කරගෙන යා යුතු අතර, යම් ලිඛිත නීතියක් මගින් බලය පවරා ඇති ආකාරයට එකී පාර්ශවයේ හෝ නීතිඥවරයා නොපැමිණීමට හෝ අවනත නොවීමට සාධාරණ හේතු දැක්වීමක් සිදු කර නොමැති අවස්ථාවක දී හෝ නඩු ගාස්තු ප්‍රදානය කිරීම අසාධාරණ වන බවට පෙනෙන තත්වයක දී හැර, එකී නොපැමිණීම හෝ අවනත නොවීම සඳහා ගෙවිය යුතු ගාස්තු ද ඇතුළත් වන යම් සාධාරණ නියෝගයක් නිකුත් කළ යුතුය.

තවදුරටත් විධිවිධාන සළසා ඇති පරිදි, එකී අධිකරණය මගින් නිකුත් කරනු ලැබූ එවැනි නියෝගයකට අමතරව, එලෙස අවනත නොවීමට සාධාරණ හේතු දැක්වීමක් හෝ ගාස්තු අයකිරීම

අසාධාරණ බවට පෙනෙන තත්ත්වයක දී හැර, අධිකරණයට අභිමතය පරිදි එකී පාර්ශ්වකරු හෝ නීතිඥවරයෙකු අවනත නොවීම වෙනුවෙන් අධිකරණය විසින් දරන ලද අමතර ගාස්තු අයකර ගැනීමට නියෝග කළ හැකිය.

79අ(7) යම් පාර්ශ්වකරුවකු නඩු කළමනාකරණ සම්මේලනයට සාධාරණ හේතුවක් ඉදිරිපත් කිරීමකින් තොරව පෙනී සිටීම පැහැර හැරීම හෝ සද්භාවයකින් යුක්තව සහභාගී නොවීම සහ පූර්ව නඩු විභාග නියෝගයකට අවනත වීම පැහැර හැරීමක දී ඒ පාර්ශ්වකරුට පූර්ව නඩු විභාග කිරීමේ පියවර සඳහා තදනන්තරව අයැදුම් කිරීම පිණිස හිමිකම් නොලැබිය යුතු අතර, අන්‍යාකාරයෙන් අධිකරණය විසින් නියෝග කරන්නේ නම් මිස, ඒ පාර්ශ්වකරුවන් නොපැමිණි අවස්ථාවේ දී කරන යම් කවර ම වූ හෝ සියලු ම අධිකරණ නියෝගවලට ඒ පාර්ශ්වකරුවන් අවශ්‍යයෙන් ම බැඳී සිටිය යුතුය.

**සමථකරණය**

79අ(8) නඩු කළමනාකරණ සම්මේලනයේ දී යම් කාරණාවක් සමථකරණය සඳහා යෝග්‍ය වන බවට අධිකරණයේ මතය වන විටක, සහ පාර්ශ්වකරුවන් ඒ සඳහා සිය කැමැත්ත ලබා දී ඇති අවස්ථාවක දී, ඒ පාර්ශ්වකරුවන් විසින් නම් කරනු ලැබූ සමථකරු ඉදිරියේ අවශ්‍යයෙන් ම පෙනී සිටිය යුතු බවට අධිකරණය විසින් ඒ පාර්ශ්වකරුවන්ට නියෝග කළ යුතු අතර, එවැනි නම් කිරීමක් සිදු කර නොමැති අවස්ථාවක දී, අධිකරණයට අධිකරණයේ ස්ථාපිත සමථකරණ වැඩසටහනින් සමථකරුවකු නම් කළ හැකිය.

79අ(9) ඉහත කී පරිදි සමථකරණය සඳහා පත් කරනු ලබන සමථකරු විසින් එකී නඩුවේ ආරවුල්ගත කරුණු සම්බන්ධයෙන් සමථයකට, සමාදානයකට, හෝ එකගතාවයකට (මෙහි මින්මතු "සමථයකට පත්වීම" ලෙස සඳහන් කරනු ලබන.) එළඹීම පිණිස සහාය ලබා දිය යුතුය.

79අ(10)සමථකරණයේ යම් කරුණක දී පාර්ශ්වයක නීතිඥවරයෙකුට හෝ නියෝජිතවරයෙකුට ආරවුල්කරු වෙනුවෙන් පෙනී සිටීම සඳහා හිමිකම හෝ අවසරය ලබා දිය යුතුය.

79ආ(11) සමථකරු ඉදිරියේ පැවැත්වෙන සමථකරණ කටයුතු වල දී ඒ ආරවුලට සම්බන්ධ සියලු ම සහ යම් සමහරක් කාරණා සම්බන්ධයෙන් සමථයකට එළඹ ඇති විටක දී, සමථකරු විසින් ඊට අදාල සමථ කොන්දේසි ලියවිල්ලකට සාරානුකූල කිරීමට සළස්වා, සමථ කොන්දේසිවලට එකග වූ පාර්ශ්වයේ අත්සන ලබා ගැනීමට කටයුතු කළ යුතු අතර, සමථකරු ඊට සිය අනු අත්සන තැබිය යුතුය. එම සමථ කොන්දේසිවල පිටපතක් සමථකරු විසින් අදාල ආරවුලේ පාර්ශ්වකරුවන් වෙත නිකුත් කොට අදාල ආරවුල සමථකරණයට යොමු කළ විනිශ්චයකාරවරයා වෙත යැවිය යුතුය.

79අ(12)එවැනි සමථයක කොන්දේසිවලට එකග වූ පාර්ශ්වකරුවන් ඒ සමථ කොන්දේසිවලින් බැඳී සිටිය යුතු අතර, එම සමථයට එකග නොවූ පාර්ශ්වකරුවන්ගේ අයිතිවාසිකම්වලට අගතියක් නොවන ආකාරයෙන් එකී සමථය එකී එකග වූ පාර්ශ්වයන් සම්බන්ධයෙන් අධිකරණය විසින් බලාත්මක කළ යුතුය.

## සමථකරු විසින් රහස්‍යභාවවය ආරක්ෂා කිරීම

**79අ(13)** සමථයකට පත් කිරීමේ අරමුණ සාක්ෂාත් කර ගැනීම පිණිස පාර්ශ්වකරුවන් හෝ ඉන් කිහිප දෙනෙකුට හැකි වන ලෙස යෝග්‍ය යැයි සමථකරු විසින් සලකන යම් කවර ම වූ කාර්ය පටිපාටියක් සමථකරුට යොදා ගත හැකිය. ඒ අනුව ඔහු විසින් නඩුවෙහි ඇතුළත් සිද්ධිමය සහ නීතිමය ගැටළු සහ ඒ හා සම්බන්ධ සමස්ථ කාරණාවන් සියලු ම පාර්ශ්වකරුවන් සමග පෞද්ගලික වශයෙන් සහ / හෝ ඔවුන්ගේ නීතිඥවරුන් හෝ නියෝජිතයින් සමග වෙන වෙන ම හෝ එක් එක් පාර්ශ්වය හෝ ඊට වැඩි පාර්ශ්වකරුවන් ගණනක් සමග ඔවුන්ගේ නීතිඥවරුන් ඉදිරියේ හෝ නොමැතිව සාකච්ඡා කළ හැකිය. එක් පාර්ශ්වයක් හෝ ඊට වැඩි පාර්ශ්වකරුවන් ගණනක් සමථයකට එළඹීමට කැමැත්තක් දක්වන නියමයන් ඔහු විසින් නිශ්චිතව දැක්විය හැකිය. එසේ ඔහුට එළිදරව් කරගත හැකි වූ හෝ ඔහු සමග සාකච්ඡා කරනු ලැබූ කාරණා හෝ නියමයන් අදාළ පාර්ශ්වකරුවන්ගේ අවසරයකින් තොරව වෙනත් යම් කවර ම වූ පාර්ශ්වයකට එළිදරව් නොකරන්නේ ය යන අවබෝධතාව සහිතව ඔහු විසින් එසේ කළ යුතුය.

**79අ(14)**ඉදිරිපත් කර ඇති ලේඛන සහ සමථකරණ සැසිවාර පවත්වන අතරතුර දී එළිදරව් වන සහ සාකච්ඡා කරනු ලබන අනෙකුත් සියලු ම කරුණු සම්බන්ධයෙන් රහස්‍යභාවය ආරක්ෂා කිරීම සෑම පාර්ශ්වකරුවකුගේ ම සහ සෑම සමථකරුවකුගේ ම වගකීම විය යුතුය.

**79අ(15)**සමථකරණය සම්බන්ධ තොරතුරුවල රහස්‍යභාවය පාර්ශ්වකරුවකුට සමථකරු සහ සමථකරණය පැවැත්වීම සඳහා සහභාගී වන වෙනත් තැනැත්තන් විසින් -

(අ) සියලු ම පාර්ශ්වකරුවන් එළිදරව් කිරීමට එකගව සිටින විටක: සහ එය සමථකරු සම්බන්ධ තොරතුරක් නම්, එය එළිදරව් කිරීමට සමථකරු එකගතාව පළකර ඇති විටක :

(ආ) එවැනි එළිදරව් කිරීමක් නීතිය මගින් නියම කරන විටක:

(ඇ සමථයකට එළඹීමේ ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා හෝ බලාත්මක කිරීම සඳහා එවැනි එළිදරව් කිරීමක් අවශ්‍ය වන විටක:

(ඈ) විෂමාචාරයක් සිදු කිරීමට ප්‍රතිචාර දැක්වීම සඳහා සමථකරුට එවැනි එළිදරව් කිරීමක් අවශ්‍ය වන විටක:

හැර ආරක්ෂා කළ යුතුය

එසේ වුව ද, ඉහත සඳහන් විධිවිධානය -

(i) තොරතුරු ප්‍රසිද්ධියේ ලබා ගැනීමට අවස්ථාවක් තිබෙන විටක :

(ii) පාර්ශ්වකරුවන් ස්වකීය ක්‍රියාකලාපය තුළින් ඒ තොරතුරු රහස්‍ය වන තොරතුරු යයි නොසලකන විටක:

(iii) මෙම රීතිය යටතේ නියම කරන එළිදරව් කිරීමක් සිදු කිරීමට සමථකරු අපොහොසත් වූ අවස්ථාවක දී, තීරණයක් ගැනීම සඳහා අදාළ වන විටක:

අදාළ නොවිය යුතුය.

**සමථකරණ සැසිවාරයක දී ඉදිරිපත් කරන තොරතුරුවල හෝ ප්‍රකාශවල ආවේශ්‍යතාව**

**79අ(16)**සමථකරණ සැසිවාරයක දී යම් පාර්ශ්වකරුවකු විසින් එළිදරව් කළ තොරතුරු හෝ සිදු කරන ලද ප්‍රකාශයක් යම් අධිකරණ හෝ පරිපාලන නීති කෘත්‍යයක දී සාක්ෂි වශයෙන් සොයා ගැනීම හෝ ආවේශ්‍ය කිරීම නොකළ යුතු අතර, ඊට -

(අ) වාණිජ ආරවුලක් සමථ කිරීම සඳහා යම් පාර්ශ්වකරුවකුට ආරාධනා කිරීම, ආරවුල සමථ කිරීම සඳහා පාර්ශ්වකරුවකුගේ කැමැත්ත ප්‍රකාශ කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම, සමථකරණය ආරම්භ කිරීමට පෙර දෙපාර්ශ්වය අතර හුවමාරු වූ තොරතුරු සහ ආරවුල සමථ කිරීම සඳහා යම් එකගතාවක් ;

(ආ) සමථකරණය සිදු කිරීමේ අරමුණින් ම සකස් කරනු ලැබූ ලියවිල්ලක් ;

(ඇ) සමථකරණය අතරතුර දී ආරවුල සමථයකට පත් කරගත හැකි අයුරු සම්බන්ධයෙන් පාර්ශ්වකරුවන් විසින් ප්‍රකාශ කරනු ලබන අදහස් හෝ ඉදිරිපත් කරන යෝජනා ;

(ඈ) සමථකරණය අතරතුර දී පාර්ශ්වකරුවන් විසින් සිදු කරනු ලබන ප්‍රකාශ සහ පිළිගැනීම් ;

(ඉ) සමථයක් සඳහා සමථකරු විසින් සිදු කරනු ලබන ප්‍රකාශ සහ යෝජනා ;

(ඊ) සමථකරු විසින් ඉදිරිපත් කරනු ලැබූ සමථයකට එළඹීමේ යෝජනාව පිළිගැනීම සඳහා එක් පාර්ශ්වකරුවකු විසින් කැමැත්ත දැක්වීම පිළිබඳ කාරණය ;

(උ) සමථකරු හෝ පාර්ශ්වකරුවකු සමථකරණය අවසාන කළ බව යන කාරණය ඇතුළත් වේ.

**79අ(17)** ඉහත **79(16)** සඳහන් තොරතුරු -

(අ) නීතිය මගින් ;

(ආ) සමථ එකගතාව සිදු කිරීමට හෝ බලාත්මක කිරීමේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ;

(ඇ) විෂමාචාර ක්‍රියාවක් සිදු කිරීම සම්බන්ධයෙන් සමථකරුට ප්‍රතිචාර දැක්වීමක් සඳහා ;

(ඈ) සියලු ම පාර්ශ්වකරුවන් සමථකරණයට කැමැත්තක් දක්වන්නේ නම් සමථකරු සම්බන්ධ තොරතුරු නම් සමථකරු කැමැත්තක් දක්වන්නේ නම් ;

එපමණට සාක්ෂි ලෙස පිළිගත හැකිය.

## සමථකරණය නිසා අධිකරණ නීති කෘත්‍ය කල් දැමීම හෝ අත්හිටුවීම නොකිරීම

**79අ(18)**යම් සමථකරණ නීති කෘත්‍යයක් ආරම්භ කිරීම, නඩු කළමනාකරණ, පූර්ව - නඩු විභාග පියවර සහ පූර්ව - නඩු විභාග පියවර සම්මන්ත්‍රණය ඇතුළුව අධිකරණ නීති කෘත්‍ය අවහිර කිරීමක් හෝ කල් දැමීමක් ලෙස නොසැලකිය යුතු අතර, යම් සමථකරණ නීති කෘත්‍යයක් හේතුවෙන් අධිකරණ නීති කෘත්‍යයක් නතර කිරීම හෝ කල් දැමීමට අධිකරණය විසින් යම් කවර ම වූ නියෝගයක් නිකුත් නොකළ යුතුය.

## නඩු විභාග කිරීම කළමනාකරණය කිරීම සඳහා පූර්ව නඩු විභාග සම්මේලනය

**79අ(19)** පූර්ව නඩු විභාගසම්මේලන පැවැත්වීමට නියම කරන දිනයේ දී, අධිකරණය විසින් පූර්ව නඩු විභාග සම්මේලන එකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් පැවැත්විය යුතු අතර, ඊට නඩුවෙහි යම් පාර්ශ්වකරුවෙකු හෝ ඔහුගේ / ඇයගේ නීතිඥවරුන් හෝ නියෝජනයක් නොමැති යම් පාර්ශ්වකරුවකුට පෙනී සිටිය හැකිය. කෙසේ වුව ද, අධිකරණය විසින් නීතිඥවරයාට පෞද්ගලිකව හෝ දුරකථන, ස්කයිප් හෝ වීඩියෝ සම්මේලන හෝ වෙනත් ඒ හා සමාන සන්නිවේදන මාධ්‍යයක් මගින් පෙනී සිටීමට අවසර ලබාදිය හැකිය.

**79අ(20)** පූර්ව නඩු විභාගකිරීමේ සම්මේලනයේ දී අධිකරණය පහත සඳහන් අරමුණු එනම් -

(1) නඩු විභාග ඉක්මනින් අවසන් කිරීම ;

(2) කළමනාකරණයේ දුර්වලතා හේතුවෙන් නඩු කටයුතු කල් ගත නොවන බවට වගබලා ගැනීම පිණිස නඩු විභාගයේ මුල් අදියරේ සිට ම අඛණ්ඩ සහ කල්වේලා ඇතිව පාලනයක් සහිතව කටයුතු කිරීම ;

(3) ඵල රහිත පූර්ව නඩු විභාග ක්‍රියාකාරකම් අධෛර්යමත් කිරීම ;

(4) වඩාත් හොඳින් සූදානම් වීම මගින් නඩු විභාගයේ ගුණාත්මක තත්වය වැඩිදියුණු කිරීම ; සහ

(5) නඩු දිනය, නඩුව සඳහා ගත වන කාලය තහවුරු කිරීම සහ නඩු දින නිශ්චිත වන බව සහ සියලු ම සාක්ෂිකරුවන්ට පැමිණීමට හැකි වන පරිදි වගබලා ගැනීම සඳහා නඩුව අවසානය දක්වා ම බාධාවකින් තොරව පවත්වාගෙන යාම නැවත නැවතත් අවධාරණය කිරීම ;

යනාදිය සාක්ෂාත් කර ගැනීම පිණිස නියෝග නිකුත් කළ යුතුය.

## පූර්ව නඩු විභාග සම්මේලනයේ දී සැලකිල්ලට ලක් වන කරුණු

**79ආ(21)**අධිකරණය විසින් සාක්ෂි පිළිගැනීම සහ නඩු කටයුතු වේගවත් ලෙස අවසන් කිරීම පහසු කරන සැළසුම් ඇතුළු නඩු විභාග කිරීමේ සැළැස්මක් සකස් කිරීම සඳහා පූර්ව නඩු විභාග සම්මේලනයක් පැවැත්විය යුතුය. එවැනි සම්මේලනයකට නඩු විභාගය පවත්වනු ලබන නීතිඥවරයා හෝ ඔහුගේ සහායකයා හෝ නියෝජනයක් නොමැති යම් පාර්ශ්වයන් පැමිණිය හැකිය.

**79අ(22)** අධිකරණය විසින් අධිකරණය වෙත මෙම වගන්තිය මගින් පවරා ඇති බලය, පූර්ව නඩු විභාග සම්මේලනයේ දී ක්‍රියාත්මක කළ හැකි අතර, තත්කාර්ය සඳහා අධිකරණය විසින් සුදුසු යයි සළකන මෙහි පහත සඳහන් උපලේඛනගත නියෝග එනම්-

(අ) අධිකරණ බලසීමාව පිළිබඳ විසඳනාවන් නිශ්චිතව දැක්වීම :

(ආ) විසඳනාවන් සකස් කිරීම සරල කිරීම සහ පිඩාකාරි ඉල්ලීම් සහ විත්තිවාචක ඉවත් කිරීම :

(ඇ) පිළිගැනීම් සහ විසඳනාවන් තීරණය කිරීම සහ වාර්තා කිරීම :

(ඈ) අනවශ්‍ය ඔප්පු කිරීම් සහ සම්මුච්චිත සාක්ෂි බැහැර කිරීම :

(ඉ) විභාගවෙමින් පවතින නඩු දෙකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් ඒකාබද්ධ කිරීම :

(ඊ) දිව්රුම් ප්‍රකාශ සහ ලේඛන හුවමාරු කිරීම සම්බන්ධයෙන් දින නියම කිරීම :

(උ) පාර්ශ්වකරුවන්ට සහ ඔවුන්ගේ නීතිඥවරුන්ට යෝග්‍ය වන පරිදි නඩු විභාග කිරීමේ දින නියම කිරීම :

(ඌ) කැඳවනු ලබන සාක්ෂිකරුවන් සංඛ්‍යාව ඉදිරිපත් කරනු ලබන ලේඛන සහ ඒ සම්බන්ධ විරෝධතා හඳුනා ගැනීම සහ පූර්ව නඩු විභාගවල නඩු වාර්තා ගොනු කිරීම හා හුවමාරු කිරීම උපලේඛනගත කිරීම :

(එ) සාක්ෂිකරුවන් කැඳවීම සඳහා කාලසීමා නිර්ණය කිරීම :

(ඒ) විභාගයට ගැනීමට නියමිත මෝසම අවසාන කිරීම :

(ඔ) සාක්ෂිකරුවන්ගෙන් සාක්ෂි විමසීම සහ හරස් ප්‍රශ්න ඇසීමේ කාලසීමාවන්ට එකඟ වීම:

(ඕ) පිළිගැනීම් වාර්තා කිරීම සඳහා විශේෂඥයින් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් පත්කිරීම :

(ක) පාර්ශ්වකරුවන් විසින් පත්කරන හෝ අධිකරණය විසින් පත්කරන විශේෂඥවරුන්ගේ වාර්තාවක් මගින් යම් කරුණක් සම්බන්ධයෙන් තීරණ ගැනීම සඳහා නියෝග සකස් කිරීම :

(ග) එකම නඩුවක දී සිද්ධිමය සහ නීතිමය විසඳනාවන් පැන නගින අවස්ථාවක දී පළමුවෙන් ම නීතිමය විසඳනාවන් විභාග කිරීම :

(ච) නඩුව උද්ගත වන සම්පූර්ණ කාරණාවට හෝ එහි යම් කොටසක් සම්බන්ධයෙන් පාර්ශ්වකරුවන්ගේ එකඟතාවන් සළකා බැලීම :

(ජ) නඩුව වේගවත්ව සහ අඩු වියදමකින් විසඳා ගැනීමට අවශ්‍ය වන බවට හා යෝග්‍ය වන බවට පෙනී යන වෙනත් කාරණාවන් නිශ්චය කිරීම සහ වෙනත් යම් කවර ම වූ පියවර ගැනීම :

(ට) යුක්ති සහගත, වේගවත් සහ අඩු වියදම් සහිතව නඩුව විභාග කොට අවසන් කිරීමේ වෙනත් ක්‍රම සඳහා පහසුකම් සැලසීම ;

(ඩ) (i) යම් කවර ම වූ ආකාරයකට හෝ පාර්ශ්වකරුවන් අතර එකග විය හැකි ආකාරයට විනිශ්චයකාරවරයා එළඹෙන යම් තීරණයක් හෝ තීන්දුවක් සහ එවැනි තීරණයකට හෝ තීන්දුවකට අනුව ඇතුළත් කරන නඩු තීන්දුවක්,

(ii) සිද්ධිමය හෝ නීතිමය වශයෙන් වන සියලු ම හෝ යම් කවර ම වූ විසඳනාවන් සම්බන්ධයෙන් විනිසුරුවරුන්ගේ යම් තීරණයක් හෝ තීන්දු කිරීමක් සහ එවැනි තීරණයක් හෝ තීන්දු කිරීමක් ප්‍රකාරව සුදුසු අදියරයක දී ඇතුළත් කරන නඩු තීන්දුවක්,

පිළිගෙන බැඳී සිටින පාර්ශ්වකරුවන්ගේ එකගතාව ඇතුළත් යම් නඩුකරයක කාරණයක් සම්බන්ධයෙන් සමථයක කොටසක් වශයෙන් පාර්ශ්වකරුවන්ගේ එකගතාවන් ;

සකස් කළ යුතු අතර,

(ණ) (i) සහ (ii) අනුඡේදවල දැක්වෙන පරිදි තීරණය හෝ තීන්දු කිරීම සියලු ම කාරණාවන් සඳහා එවැනි පාර්ශ්වකරුවන් අතර සම්පූර්ණ සහ අවසානාත්මක තීරණයක් හෝ තීන්දු කිරීමක් විය යුතුය.

එසේ වුව ද, ඉහත (ඩ) උපවගන්තිය යටතේ සඳහන් වන පාර්ශ්වකරුවන් විසින් එකගතාවක් වාර්තා කරන විටක දී අධිකරණය විසින් ඒ එකගතාවයේ ප්‍රතිඵල පාර්ශ්වකරුවන්ට කියවා තේරුම් කර දිය යුතු අතර, එකී එකගතාව සහ එහි ප්‍රතිඵලය පාර්ශ්වකරුවන් විසින් අවබෝධ කර ගත් බවට වාර්තා කළ යුතුය.

**ප්‍රත්‍යක්ෂ යුක්තිය ප්‍රතිඵල වන්නේ නම් මිස, උත්තරවාද සංශෝධනය නොකිරීම, අලුත් විසඳනාවන් ඉදිරිපත් කිරීම**

**79අ(23)** අධිකරණය විසින්, නඩුවේ නඩු විභාගය කරගෙන යන විසඳනාවන් සමථයකට පත් කරන විටක දී, යම් සුවිශේෂී හේතු හැර, සහ එවැනි සංශෝධනයකට ඉඩ දීම ප්‍රතික්ෂේප කිරීමක්, සංශෝධනයට අදාළ කර ගන්නා පාර්ශ්වය සම්බන්ධ ප්‍රත්‍යක්ෂ යුක්තිය ප්‍රතිඵලය වන බවට අධිකරණය සෑහීමකට පත් වන්නේ නම් මිස, ඊට සංශෝධන ඉදිරිපත් නොකළ යුතුය.

**79අ(24)** නඩු විභාගය සිදු කෙරෙමින් පවතින අතරතුර තීරණය කිරීම සඳහා සාක්ෂි මගින් නව විසඳනාවන් පැන නගින බවට එළිදරව් වන විටක, ප්‍රත්‍යක්ෂ යුක්තිය අන්‍යාකාරයෙන් ප්‍රතිඵල ඇති කරන බවට අධිකරණය සෑහීමකට පත් කරන අවස්ථාවක දී අතිරේක විසඳනාවන් ගොනු කළ හැකිය.

## අවසාන පූර්ව නඩු විභාග කිරීමේ නියෝග

**79අ(25)** පූර්ව නඩු විභාගසම්මේලනයෙන් පසුව අධිකරණය විසින් X.3 ආකෘතිය පරිදි ගන්නා නඩු විභාගය සඳහන් කරමින් සහ එකී අවසානාත්මක පූර්ව නඩු විභාග නියෝග මගින් නඩු විභාග ක්‍රියාවලිය පාලනය කරන නියෝග අධිකරණය විසින් එය වෙනස් කොට ඒ වෙනුවට උත්තරවාද ඇතුලත් කරන්නේ නම් මිස, අධිකරණය විසින් නිකුත් කරනු ලැබිය යුතුය.

**79අ(26)** සියලු ම පාර්ශ්වකරුවන් සඳහා පෙනී සිටින උපදේශක නීතිඥවරුන් අවසාන පූර්ව නඩු විභාග කිරීම ඇසීමට දින 14 කට පෙර හමු විය යුතු අතර, **79අ(22)** උපවගන්තියේ ලැයිස්තුගත විසඳනාවන් සියල්ල ආවරණය වන පරිදි පූර්ව නඩු විභාග නියෝග සඳහන් කෙටුම් පතක් සකස් කළ යුතුය.

**79අ(27)** නඩු විභාගය සඳහා පළමුවෙන් නියම කළ දින හෝ එදිනට පසුව පූර්ව නඩු විභාග පියවර සඳහා අවසර ලබා නොදෙන්නේ නම්, එමගින් බරපතල පිරිමැසිය නොහැකි සහ අප්‍රතිකාර්ය අයුක්තියක් සිදු විය හැකි බවට අධිකරණය සෑහීමකට පත් වන ආකාරයේ හේතූන් අධිකරණය මගින් වාර්තා කරන්නේ නම් මිස, පූර්ව නඩු විභාග කිරීමේ පියවර සඳහා කරනු ලබන ඉල්ලීම් කිසිවකට ඉඩ ලබා නොදීම නොකළ යුතුය. එවැනි අවස්ථාවක දී එකී ඉල්ලීම සිදු කළ පාර්ශ්වකරුට එරෙහිව අධිකරණය විසින් සුදුසු යයි සළකන නඩු ගාස්තු සම්බන්ධයෙන් නියමයන් පැන වීම කළ හැකිය.

## පාර්ශ්වකරුවන් පෙනී සිටීම පැහැර හැරීම.

**79ආ(28)** පාර්ශ්වකරුවෙක් හෝ ඔහුගේ නීතිඥවරයා පූර්ව නඩු විභාග සම්මේලනයේ පෙනී සිටීමට අපොහොසත් වුයේ නම් හෝ, සහභාගී වීමට ප්‍රමාණවත් සූදානමකින් තොරව සිටි නම්, හෝ සද්භාවයෙන් යුක්තව සම්මේලනයට සහභාගී නොවුයේ නම් හෝ අවසාන පූර්ව නඩු විභාග කිරීමේ නියෝගයට අවනත වීමට අපොහොසත් වුයේ නම් ඔවුන්ගේ පෙනී සිටීම නොමැතිව අධිකරණය එකී නඩු කටයුතු මෝසමක් මගින් හෝ නොමැතිව කරගෙන යා යුතු අතර, පැහැර හැරීම කළ පාර්ශ්වයට එරෙහිව සහ එලෙස අවනත නොවීම සම්බන්ධයෙන් ඒ පාර්ශ්වකරු හෝ නීතිඥවරයා විසින් ඒ පෙනී නොසිටීම ඇතුලත් කළ දින සිට දින 14 ක් ඇතුලත නඩු ගාස්තු ගෙවිය යුතු බවට සඳහන් කරමින් සිවිල් නඩු විධාන සංග්‍රහයෙන් බලය පැවරී ඇති යුක්ති සහගත නියෝග නිකුත් කරනු ලබන අතර, අවනත නොවීම සාධාරණීයකරණය කළ යුත්තේ මන්දැයි සඳහන් කරමින් වරදකාර පාර්ශ්වය පෙනී නොසිටිය දී කළ නඩු තීන්දුව ඉවත් කිරීමට ඒ පාර්ශ්වය විසින් මෝසමක් ගොනු කළ හැකිය.

තවදුරටත් විධිවිධාන සළසා ඇති පරිදි, එකී අධිකරණය මගින් නිකුත් කරනු ලැබූ එවැනි නියෝගයකට අමතරව, එලෙස අවනත නොවීමට සාධාරණ හේතු දැක්වීමක් හෝ ගාස්තු අයකිරීම අසාධාරණ බවට පෙනෙන තත්ත්වයක දී හැර, අධිකරණයට අභිමතය පරිදි එකී පාර්ශ්වකරු හෝ නීතිඥවරයෙකු අවනත නොවීම වෙනුවෙන් අධිකරණය විසින් දරන ලද අමතර ගාස්තු අයකර ගැනීමට නියෝග කළ හැකි අතර, අධිකරණය විසින් අන්‍යාකාරයෙන් නියම කර ඇත්නම් මිස, ඒ

පාර්ශ්වකරුවන්ගේ පෙනී නොසිටීමක දී කළ යම් කවර ම වූ හෝ සියපු ම නියෝග මගින් බැඳී සිටීමට අවනත විය යුතුය.

## XI වන පරිච්ඡේදය

## නඩු විභාග කිරීමේ දිනය

(5) ප්‍රධාන ප්‍රඥප්තියේ 80 වන වගන්තිය මෙයින් පරිච්ජින්න කර ඒ වෙනුවට පහත සඳහන් වගන්තිය ආදේශ කරනු ලැබේ.

පූර්ව නඩු විභාග සම්මේලනය අවසානයේ දී, අධිකරණය විසින් අවසාන පූර්ව නඩු විභාග නියෝගවලට අනුකූල වන ආකාරයට නඩුකරයේ නඩු විභාගය සඳහා දිනය / දින නියම කළ යුතු අතර, නඩු විභාගය අවසානය දක්වා ම නීති කෘත්‍යය අඛණ්ඩව පවත්වාගෙන යා යුතුය.

## ප්‍රධාන ප්‍රඥප්තියේ 146, 147, 148 සහ 149 යන වගන්ති පරිච්ජින්න කිරීම

(6) ප්‍රධාන ප්‍රඥප්තියේ 146, 147, 148 සහ 149 වන වගන්ති මෙයින් පරිච්ජින්න කරනු ලැබේ.

## වාචික සාක්ෂි විභාගය සඳහා ආදේශ කළ හැකි දිව්රුම් ප්‍රකාශය

## (අමාත්‍යාංශයේ යෝජනා)

**(7)** ප්‍රධාන ප්‍රඥප්තියේ 151 වන වගන්තියට ඉක්බිතිව පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ආදේශ කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 151 (ආ) වගන්තිය යනුවෙන් බලාත්මක විය යුතුය.

**151 (ආ) (1)**අධිකරණය ස්වකීය අභිමතය පරිදි, ප්‍රධාන සාක්ෂිකරුගේ මූලික වාචික සාක්ෂි විභාගය වෙනුවට දිව්රුම් ප්‍රකාශයක් ආදේශ කළ හැකි වන ලෙසට නියෝගයක් කළ හැකි අතර, එකී සාක්ෂිකරු කැඳවන පාර්ශ්වයට අධිකරණය විසින් නියම කරනු ලැබූ දිනයට එම දිව්රුම් ප්‍රකාශය ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබාදිය හැකි අතර, එකී දිනය නඩුව විභාග කරනු ලබන දින සිට අවම වශයෙන් දින ........................... කලින් දිනයක් විය යුතුය.

**151 (ආ) (2)**යම් පාර්ශ්වයක් 11.1 උප වගන්තිය යටතේ දිව්රුම් ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම සඳහා කළ යම් නියෝගයකට අනුකූල වන ලෙස ක්‍රියා කිරීම හිතමතාම පැහැර හැරීම කළ අවස්ථාවක දී ඒ පාර්ශ්වය පැමිණිලිකරු වන්නේ නම්, දිව්රුම් ප්‍රකාශය ඉදිරිපත් නොකිරීම නිසා ඔහුගේ නඩුව නිෂ්ප්‍රභ වීම සිදු විය යුතු අතර, ඒ පාර්ශ්වය විත්තිකරු වන්නේ නම්, විත්තිවාචකයක් වෙතොත්, ඒ විත්තිවාචකය අවලංගු කර අධිකරණයේ පෙනී නොසිට උත්තරයක් ඉදිරිපත් නොකළ තත්වයෙන් සැළකිය යුතුය.

එසේ **වුව ද**, යම් පාර්ශ්වයක් විසින් සාධාරණ කාලයක් තුළ දී එනම්, එය නිෂ්ප්‍රභ කිරීම හෝ උත්තරය අවලංගු කිරීම සිදු කළ දින සිට දින 10 ක් තුළ දී දිව්රුම් ප්‍රකාශයක් මගින් තහවුරු කරන මෝසමක් ඉදිරිපත් කරමින් ඒ නිෂ්ප්‍රභ කිරීම හෝ උත්තරය අවලංගු කිරීම ඉවත දමන ලෙස ඉල්ලීමක් කළ විටක දී, සහ ඒ පැහැර හැරීම පිළිබඳව අධිකරණය විසින් සෑහීමකට පත් වූ විටක දී, ඒ නිෂ්ප්‍රභ

කිරීම හෝ උත්තරය අවලංගු කිරීම ඉවත දමමින් නියෝගයක් කර අධිකරණය විසින් සුදුසු යයි සලකන පාර්ශ්වකරුවන්ගේ නඩු කටයුතු සහ සැලකිය යුතු තරමට නඩු ගාස්තු පිළිබඳ නියමයක් මත දිව්රුම් ප්‍රකාශයක් ගොනු කරන ලෙස ඒ පාර්ශ්වයට ඉඩ දීම කළ යුතුය.

**151 (ආ) (3)**ඉහත 15.1 උප වගන්තිය යටතේ අධිකරණය විසින් නියෝගයක් කර ඇති අවස්ථාවක දී, අධිකරණය විසින් එකී සාක්ෂිකරු කැඳවනු ලබන පාර්ශ්වයට දිව්රුම් ප්‍රකාශය සහ එහි සඳහන් සියලු ම ලියවිලි ඒවායේ පිටපතක් විරුද්ධ පාර්ශ්වයට හෝ ඔවුන්ගේ නීතිඥවරයාට භාර දුන් බවට ඔප්පු කිරීමක් සහිතව අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාට ඉදිරිපත් කරන ලෙස නියම කළ යුතුය.

**151 (ආ) (4)**නඩු විභාග කරන දිනයේ දී, දිව්රුම් ප්‍රකාශය ඉදිරිපත් කරනු ලබන පාර්ශ්වය, දිව්රුම් ප්‍රකාශ සාක්ෂිකරුවන් මගින් ඉදිරිපත් කළ යුතු අතර, එකී සාක්ෂිකරු දිව්රුම් පිට හෝ ප්‍රතිඥා පිට ඔහුගේ දිව්රුම් ප්‍රකාශයේ පිටපතක් ඔහුට ලබා දී එය සත්‍ය වන බවට තහවුරු කරන ලෙස විමසා ඔහු / ඇය එකී දිව්රුම් ප්‍රකාශයට යමක් එකතු කිරීමට අපේක්ෂා කරන්නේ නම්, අධිකරණය විසින් එය වාර්තා කර ගත යුතු අතර, ඔහු / ඇය අනෙක් පාර්ශ්වය මගින් අසනු ලබන වාචික හරස් ප්‍රශ්නවලට උත්තර දීමට ඉඩ දී අවශ්‍ය වෙතොත් නැවත ප්‍රශ්නවලටද භාජනය කළ යුතුය.

එසේ වුව ද, එකී දිව්රුම් ප්‍රකාශය ලැබීම ප්‍රකාරව දිව්රුම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමට අයැද සිටින විටක දී, ඒ ලැබීමට එරෙහිව විරුද්ධ පාර්ශ්වය එහි සාක්ෂි හෝ ඉන් කොටසක අනාවේශ්‍යතාව හෝ එකී දිව්රුම් ප්‍රකාශයට අමුණා ඇති ලියවිලිවල අනාවේශ්‍යතාව හෝ ඒවායේ සත්‍යායනය පිළිබඳව විරෝධතා ගොනු කිරීමේ හිමිකම ඇත්තේය. එවැනි අවස්ථාවකදී, විරුද්ධ පාර්ශ්වය විසින් සාක්ෂිකරු හරස් ප්‍රශ්න වලට ලක් කිරීමට පෙර අධිකරණයට ඒ විරෝධතාව සම්බන්ධයෙන් නියෝගයක් නිකුත් කළ හැකිය.

**151 (ආ) (5)**ඉදිරිපත් කළ දිව්රුම් ප්‍රකාශයෙහි ශ්‍රැතිමාත්‍ර හෝ මතභේදයකට තුඩු දුන් කාරණා හෝ වෙනත් අපවාද කාරණාවන් ඇතුළත් වන්නේ නම් සහ අධිකරණය විසින් එකී කාරණා ඉවත් කිරීමට සහ ශේෂව ඇති කාරණා සමග තවදුරටත් නඩු විභාග කටයුතු කිරීමට නියෝග කිරීම හෝ එකී දිව්රුම් ප්‍රකාශය ගොනු කළ පාර්ශ්වය විසින් ආවේශ්‍ය වන අලුත් දිව්රුම් ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම පැහැර හැරීම හා එවැනි අනාවේශ්‍යතාව දිව්රුම් ප්‍රකාශය ගොනු කළ පාර්ශ්වයට නඩු ගාස්තු ගෙවීමේ වගකීමට බැඳී සිටින බවට නියෝග කිරීම අධිකරණය විසින් කළ හැකිය.

**151 (ආ) (6)**යුක්තිය ඉටු කිරීම පිණිස නඩුකරයේ පාර්ශ්වකරුවකු නොවන වෙනත් තැනැත්තකු කැඳවා සාක්ෂි විභාග කිරීමට අධිකරණයට තිබෙන අයිතිය ඉහත කී වගන්තියෙන් යම් කවරම වූ විටකදී ලබා නොගත යුතු අතර, සිවිල් නඩු විධාන සංග්‍රහයේ **134** සහ **135** වන වගන්ති වල විධිවිධාන වලට යටත්ව ඒ තැනැත්තා නඩුකරයේ පාර්ශ්වකරුවකු විසින් සාක්ෂිකරුවකු ලෙස නම් නොකළ යුතුය.

**151 (ආ) (7)**යම් විශේෂ කරුණක් හෝ කරුණු කොමිසමක් මත ලබා ගන්නා සාක්ෂි මගින් ඔප්පු කළ යුතු බවට නියෝග කිරීම පිණිස අධිකරණයට ඇති අයිතිය ඉහත කී වගන්තියෙන් යම් කවරම විටක දී

වුව ද, ලබා නොගත යුතු අතර, එය කොමිසමක් මත ලබා ගන්නා සාක්ෂි සම්බන්ධයෙන් සිවිල් නඩු විධාන සංග්‍රහයේ 179 සිට 180 වගන්තිය මගින් දක්වා ඇති විධිවිධාන එකී සාක්ෂියට අදාළ කර ගත යුතුය.

## උපලේඛනය

නඩු කළමනාකරණ සම්මේලනයේ පිළිවෙල සකස් කිරීම (X1 ආකෘතිය) - 79 A (1) වගන්තිය

බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණයේ දී ය. / දිසා අධිකරණයේ දී ය.

නඩු අංකය...............................

.......................................................

පැමිණිලිකරු

.......................................................

විත්තිකරු

නඩු විභාගයේ වගකීම දරන අධිනීතිඥවරයා සහ එක් එක් පාර්ශ්වය හෝ පාර්ශ්වයේ නියෝජිතයින්, නීතිඥවරයා නඩු කළමනාකරණ සම්මේලනයේ දී ගරු විනිශ්චයකාරතුමා ඉදිරියේ ........................ අංක දරන අධිකරණයේ ........................ මාසයේ ........................ දින පෙ.ව. ........................ ට පෙනී සිටිය යුතු බවට මෙයින් නියෝග කරනු ලැබේ.

නඩු කළමනාකරණ සම්මේලනයට සූදානම් වීමේ දී, මෙහි පහත සඳහන් පරිදි නියම කරනු ලැබේ.

1. නඩු කළමනාකරණ සම්මේලනයට පූර්වයෙන් සතියකට නොඅඩු කාලයක දී, පර්ශ්වකරුවන් වෙනුවෙන් පෙනී සිටින අධිනීතිඥවරු හමු වී සාකච්ඡා කළ යුතු අතර, පහත සඳහන් තොරතුරු, අංක යොදා වෙන් වෙන් ඡේදවල දක්වමින් ඒකාබද්ධ ප්‍රකාශයක් ලියවිල්ලක් මගින් අධිකරණයට ඉදිරිපත් කළ යුතුය.

(අ) සමථයකට එළඹීමේ යම් ප්‍රගතියක් තිබේ ද යන වග සහ නඩු විභාගයට පෙර එකී කාරණාව සමථයකට පත් කිරීම පිණිස දරා ඇති හෝ දැරීමට අපේක්ෂිත ප්‍රයත්න කවරේ ද යන වග ;

(ආ) සමථකරණය සඳහා මෙම නඩුව යෝග්‍ය වන්නේ ද යන වග සහ එසේ නම් එය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රකාශයක් ;

(ඇ) ප්‍රකාශය සැකසීම සඳහා මුණගැසී කතා කළ අධිනීතිඥවරුන්ගේ නම් ;

(ඇ) නඩුව පිළිබඳ කෙටි විස්තරයක් ;

(ඉ) ආරවුලට හේතු වූ ගැටළුව ;

(ඊ) අධිකරණයේ අධිකරණ බලය සඳහා පදනම ;

(උ) උත්තරවාද හෝ පාර්ශ්වකරුවන් සම්බන්ධ කිරීම හෝ නඩු නිමිත්ත සඳහා අපේක්ෂිත සංශෝධන තිබේ ද යන වග ;

(ඌ) ඉලෙක්ට්‍රොනිකව ගබඩා කිරීම් සිදු කර ඇති තොරතුරු ආදියත් සමග ප්‍රශ්න කිරීම්, නඩු භාණ්ඩ, පරීක්ෂා කිරීම් සහ ලේඛනවල සත්‍යාසත්‍යතාව ඇතුළුව නඩු විභාගය සඳහා සොයා ගත යුතු හෝ එළිදරවු කර ගත යුතු සාක්ෂි කවරේ ද යන වග ;

(එ) කොම්පත් සහා හෝ ප්‍රවීනයන් සඳහා ඇති අපේක්ෂිත අවශ්‍යතා සහ එය කවර ආකාරයක ද යන වග ;

(ඒ) ඉලෙක්ට්‍රොනිකව ගබඩා කර ඇති තොරතුරු සොයා ගැනීම ඇතුළුව සාක්ෂි අනාවරණය කර ගැනීම හෝ ඉල්ලීම් පිළිබඳ සොයා ගැනීම සඳහා යෝජිත උපලේඛනයක් ;

(ඔ) පූර්ව නඩු විභාග සම්මේලනය සඳහා බද්ධ එකගතාවයකින් යුක්ත යෝජිත දින තුන සහ උපලේඛනගත නඩු කළමනාකරණ සම්මේලනය සඳහා මාස 8ක් ඇතුළත නඩු විභාග කිරීම පිණිස සඳහා දින ;

(ඕ) නඩු විභාගය ආරම්භ වීමෙන් අනතුරුව ඒ සඳහා කිසිදු බාධාවක් ඇති නොවිය යුතු බවත්, නඩු විභාගය අවසාන වන තෙක් ම පැවැත්විය යුතු බවත්, නඩු විභාගයට බාධා වන ආකාරයේ කිසිදු දිනයක් සඳහා අනුමැතිය නොලැබෙන බවත් සලකා බලමින් නඩු විභාගය සඳහා ගත වන කාලය පිළිබඳ ඇස්තමේන්තුවක් ; සහ

(ක) ඉදිරිපත් වී ඇති ගැටළු පිළිබඳව දන්නා සාක්ෂිකරුවන්ගේ සහ ඔවුන්ගේ පෞද්ගලික විස්තර ඇතුළත් ලැයිස්තුවක්.

(2) නඩු කළමනාකරණ සම්මේලනයේ දී, නඩු විභාග කිරීමේ ස්ථිර දිනයක් සහ නඩු විභාගයට දින 15ට පෙර පැවැත්විය යුතු පූර්ව නඩු විභාග සම්මේලනය සඳහා දිනයක් ඇතුළුව, නඩු විභාගය මගින් නඩුව ඇසීමේ උපලේඛනයක් නීතිඥවරුන්ගේ උපදෙස් ලබාගෙන අධිකරණය විසින් නියම කළ යුතුය. පාර්ශ්වකරුවන් නියම කරනු ලැබූ උපලේඛනයට අවනත විය යුතු අතර, පාර්ශ්වකරුවන් සහ නීතිඥවරුන් විසින් නඩු විභාගය මගින් ඉක්මන් විසඳුමකට ළගා වීමට බාධා වන අනවශ්‍ය ප්‍රමාදයන් සිදු වීම වළක්වා ගැනීම පිණිස සහයෝගිතාව දැක්විය යුතුය.

**(3)** නඩු කළමනාකරණ සම්මේලනයට පසුව, අධිකරණය උපලේඛනගත පිළිවෙලක් ඉදිරිපත් කරන අතර, එකී පිළිවෙළ තුළ අතුළත් අවසාන දින සම්පූර්ණයෙන් ම බලාත්මකව පැවතිම අපේක්ෂා කරනු ලැබේ. නීතිඥවරුන් සහ පාර්ශ්වකරුවන් ස්වකීය නඩු පැවරීමේ කටයුතු ඒ අනුව සැළසුම් කළ යුතුය. මීට අමතරව, නඩුවට අදාල කාරණාව අනවශ්‍ය ගාස්තු සහ නඩු විභාගයට යාමේ අවදානම මග හරවා ගැනීම පිණිස හැකි ඉක්මනින් ම විසදා ගැනීම පිණිස උත්සුක වීම සඳහා දිරි ගන්වනු ලැබේ.

**20**.......................... වර්ෂයේ ................. මාසයේ...................... දින දී ය.

.......................................................................................

<u>වාණිජ මහාධිකරණ විනිසුරු / දිසා විනිසුරු.</u>

---

උපලේඛනගත පිළිවෙළ (නඩු කළමනාකරණ පිළිවෙල)

( X2 ආකෘතිය) - **79** A (2) වගන්තිය

බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණයේ දී ය./ ...............................දිසා අධිකරණයේ දී ය.

නඩු අංකය:.....................................

...............................................

පැමිණිලිකරු

...............................................

විත්තිකරු

නඩු කළමනාකරණ සැලැස්ම සකස් කිරීම සඳහා මෙකී කාරණය හා සම්බන්ධ අවස්ථා උපලේඛනගත කිරීමේ අරමුණින් **20**........... වර්ෂයේ ...................... මාසයේ ........................... දින නඩු කළමනාකරණ සම්මේලනයේ දී, පාර්ශ්වකරුවන් ස්වකීය නීතිඥවරුන් සමග අධිකරණය හමුවේ පෙනී සිටි අතර, අධිකරණය විසින් එකී පාර්ශ්වයන් විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු නියමාකාරයෙන් සලකා බැලීමෙන් ඇනතුරුව,

පහත සඳහන් උපලේඛනගත පිළිවෙල මෙමගින් ඇතුළත් කරනු ලැබේ.

1. උත්තරවාදවල සංශෝධනයක් හෝ පාර්ශ්කරුවන් එකතු කිරීම සඳහා කෙරෙන යම් ඉල්ලීමක් මෙම නියෝගයට පසුව දින ..........................................කට නොඅඩු කාලයක දී යම් විරුද්ධ පාර්ශ්වයක සහ සියලු ම විරුද්ධ පාර්ශ්වකරුවන් වෙත බාර දීමක් සහිතව අධිකරණ කාර්යාලය වෙත ලියවිල්ලකින් ඉදිරිපත් කළ යුතුය. එකී යම් ඉල්ලීමක් ඉදිරිපත් කරන විට, යෝජිත සංශෝධන සහිත පැමිණිල්ල ද ඊට අමුණා තිබිය යුතුය.

2. කවර හෝ පාර්ශ්වයක හිමිකම් පෑමට හෝ ආරක්ෂාවට උපකාරී වන සියලු ම ලේඛන, වාර්තා, කොම්පත් සභා සහ වෙනත් සාක්ෂි සොයා ගැනීම, හෙළිදරව් කිරීම, පරීක්ෂා කිරීම සහ හුවමාරු කිරීම මෙම නියෝගයේ සඳහන් දිනයේ සිට මාස 4ට නොඅඩු කාලයක දී සම්පූර්ණ කළ යුතුය.

3. යම් විශේෂඥයකුගේ අනන්‍යතාවන්, මත අනාවරණය කිරීමේ අවසාන දිනය මෙම නියෝගයේ සඳහන් දිනයේ සිට.......................................... වේ.

4. පූර්ව නඩු විභාග සම්මේලනය නඩු විභාගයට පෙර පෙ.ව/ ප.ව. ..........................................ට මෙම අධිකරණය .............................. හමුවේ පැවැත්වීම සඳහා මෙමගින් උපලේඛනගත කෙරේ.

5. මෙම කාරණාව සම්බන්ධ නඩු විභාගය 20.................. වර්ෂයේ ......................මාසයේ .............................. වෙනි සඳුදා දින පෙ.ව./ ප.ව. ..............................ට ආරම්භ කර, බාධාවකින් තොරව අඛණ්ඩව පවත්වාගෙන යා යුතුය. මෙම දිනය ස්ථාවර දිනයක් වන අතර, එම දිනයට පෙනී සිටීම සඳහා සියලු ම සාක්ෂිකරුවන් කැඳවීමට නීතිඥවරයා උපදෙස් ලබා දෙනු ඇත.

6. සියලු ම පාර්ශ්වකරුවන් නඩු විභාගයේ දී කැඳවීමට නියමිත සාක්ෂිකරුවන්ගේ ලැයිස්තු හුවමාරු කරගත යුතු අතර, ලේඛන ලැයිස්තුව නඩු විභාගයට නියමිත දිනයට පෙර .............................. දිනවල ඉදිරිපත් කළ යුතුය.

7. පාර්ශ්වකරුවන් සමථකරණයට එකඟ වන අවස්ථාවක දී, අධිකරණය විසින් පත්කරනු ලබන සමථකරුවෙකු හෝ අධිකරණය නම් කරන කොළඹ සමථකරණ මධ්‍යස්ථානයේ සමථකරුවෙකු ලබාගැනීමට එම පාර්ශ්වකරුවන් එකඟ නොවන්නේ නම්, ඔවුන් දුරකථන මාර්ගයෙන් ස්වකීය කාරණාව සමථයකට පත්කර ගැනීම පිණිස සමථකරුවෙකු තෝරා ගැනීම සඳහා සාකච්ඡා කළ යුතුය.

8. සමථකරණයෙන් එකඟතාවයකට එළඹීමක දී, පාර්ශ්වකරුවන් ඔවුන් විසින් ම නම් කරනු ලැබූ සමථකරුවෙකු හමුවේ පෙනී සිටීමට අවශ්‍ය අතර, එවැනි නම් කිරීමක් නොමැති අවස්ථාවක දී, සමථයකට එළඹීම

සඳහා අධිකරණ මගින් යෝජනා කරනු ලබන සමථකරුවෙකු හමුවේ හෝ කොළඹ, සමථකරණ මධ්‍යස්ථානයේ හෝ ................................ දින පෙ.ව./ ප.ව. ..............................ට පෙනී සිටිය යුතුය.

9. නඩු විභාග කරන දිනය කල් දැමීම සඳහා ඇති යම් ඉල්ලීමක් නඩු විභාගයට පූර්වයෙන් මාස ............................ ට නොඅඩු කාලයක දී ලියවිල්ලක් මගින් ගොනු කළ යුතු අතර, අභියාචනාධිකරණයේ (අභියාචනා කර්යපටිපාටිය) 1990 නීතිවල 6 වන නීතියේ V වන කොටස මගින් විධිවිධාන සළසා ඇති පරිදි යෝග්‍ය, නිත්‍යානුකූල සහ ලේඛනගත හේතු ඉදිරිපත් කළයුතු අතර, කල් දැමීමක් හෝ සියලූ ම කල් දැමීම් අධිකරණයේ අභිමතය අනුව සිදුවේ.

10. ශ්‍රවණ දුබලතාවක් හෝ භාෂා නොහැකියාවක් හෝ ශාරීරික දුබලතාවක්, චලනය වීමේ නොහැකියාවක් හෝ දුෂ්කරතාවක් හේතුවෙන් යම් පාර්ශ්යවයකට භාෂණ පරිවර්තකයෙකුගේ සේවය ලබා ගැනීමට අවශ්‍ය වන අවස්ථාවක දී, නඩුව ඇසීමට හෝ නඩු විභාගයට පෙර අධිකරණ රෙජිස්ට්‍රාර් ඇමතිම සඳහා මෙමගින් එකග වී ඇති අතර, එමගින් යෝග්‍ය පහසුකම සලසා ගත හැකිය.

11. සියලූ ම පාර්ශ්වකරුවන් මෙම උපලේඛනගත පිළිවෙලෙහි ඇතුළත් අවසාන දිනයන්ට අවනත විය යුතුය.

20...................................වර්ෂයේ............................ මාසයේ.................................. දින දී ය.

..................................................................................................................

වාණිජ මහාධිකරණ විනිසුරු / දිසා විනිසුරු

---

X3 ආකෘතිය

අවසාන පූර්ව - නඩු විභාග පිළිවෙළ - 79 A (25) වගන්තිය.

බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණයේ දී ය. / දිසා අධිකරණයේ දී ය.

නඩු අංකය:..............................

.............................................

පැමිණිලිකරු

.............................................

විත්තිකරු

පාර්ශ්වකරුවන් ස්වකීය නීතිඥවරුන් සමග නඩු විභාගය සඳහා මෙම කාරණාව සම්බන්ධ අවස්ථා උපලේඛනගත කිරීමේ අරමුණින් 20.................... වර්ෂයේ ..........................මාසයේ, .................................... වන දින පූර්ව නඩු විභාග සම්මේලනයේ දී අධිකරණය හමුවේ පෙනී සිටීමෙන් අනතුරුව, මෙම කාරණාවට අදාළ නඩු විභාගය වාණිජ මහාධිකරණයේ දී / දිසා අධිකරණයේ දී පෙ.ව .............. ට වර්තමානයේ නියම කරන ලදුව, පාර්ශ්වකරුවන් විසින් පහත සඳහන් දෑ අධිකරණය වෙත ඉදිරිපත් කළ පසුව, එසේ ඉදිරිපත් කළ තොරතුරු අධිකරණය විසින් මනාව සලකා බැලීම කරන ලදුව,

මෙයින් මෙසේ නියම කරනු ලැබේ.

## (1) පාර්ශ්වයන් සහ නීතිඥවරුන්

පාර්ශ්වයන් සහ ඔවුන්ගේ නීතිඥවරුන් පහත සඳහන් වේ.

..........................................................................................................................................................................................................

..........................................................................................................................................................................................................

## (2) පිළිගැනීම්.

පාර්ශ්වකරුවන් විසින් පහත සදහන් දෑ පිළිගැනීම් ලෙස පිළිගෙන ඇත.

## (3) විවාද කරන කාරණා සහ නෛතික ගැටළු

පහත සදහන් කරුණු වනාහි මෙම නඩුවේ විවාද කරන කාරණා වශයෙන් පැමිණිලිකරු විසින් ඉදිරිපත් කරයි.

.................................................................................................................................................................

.........................................................................................................................................................

පහත සදහන් කරුණු වනාහි මෙම නඩුවේ කාරණා මගින් විද්‍යමාන වන නෛතික ගැටළු වශයෙන් පැමිණිලිකරු විසින් ඉදිරිපත් කරයි.

.................................................................................................................................................................

පහත සදහන් කරුණු වනාහි මෙම නඩුවේ විවාද කරන කාරණා වශයෙන් විත්තිකරු විසින් ඉදිරිපත් කරයි.

.................................................................................................................................................................

.................................................................................................................................................................

පහත සදහන් කරුණු වනාහි මෙම නඩුවේ කාරණා මගින් විද්‍යමාන වන නෛතික ගැටළු වශයෙන් විත්තිකරු විසින් ඉදිරිපත් කරයි.

.................................................................................................................................................................

## (4) ලේඛන ඔප්පු කිරීම නිදහස් වීම

පහත සදහන් ලේඛන තවදුරටත් ඔප්පු කිරීම හෝ සත්‍යායනය කිරීම අවශ්‍ය නොවන බවට පාර්ශ්වකරුවන් විසින් නියම කර ඇත.

## (5) සාක්ෂිකරුවන්

පැමිණිලිකරු විසින් නඩු විභාගය සදහා පහත සදහන් තැනැත්තන් සාක්ෂිකරුවන් වශයෙන් කැදවනු ලැබිය හැකිය.

........................................................................................................................................................................................................................................................................

........................................................................................................................................................................................................................................................................

විත්තිකරු විසින් නඩු විභාගය සඳහා පහත සඳහන් තැනැත්තන් සාක්ෂිකරුවන් වශයෙන් කැඳවනු ලැබිය හැකිය.

........................................................................................................................................................................................................................................................................

........................................................................................................................................................................................................................................................................

## (6) ලේඛන

නඩු විභාගයේ දී පැමිණිලිකරුට පහත සඳහන් ලියවිලි ඉදිරිපත් කළ හැකිය.

........................................................................................................................................................................................................................................................................

........................................................................................................................................................................................................................................................................

නඩු විභාගයේ දී විත්තිකරුට පහත සඳහන් ලියවිලි ඉදිරිපත් කළ හැකිය.

........................................................................................................................................................................................................................................................................

........................................................................................................................................................................................................................................................................

## (7) දිවුරුම් ප්‍රකාශ හුවමාරු කිරීම

සාක්ෂිකරුවන් ද ඇතුළුව අදාල පාර්ශ්වකරුවන්ගේ දිවුරුම් ප්‍රකාශ ඉහත 6 අයිතමයෙහි දක්වන ලද ආධාරක ලියවිලි ද සමග නඩු විභාග කරනු ලබන දිනයට පෙර ............................................ දිනවල දී හෝ ............................................ දිනවල දී අනෙක් පාර්ශ්වකරුවන්ට ද දැන්වීමක් සහිතව අධිකරණයේ ගොනු කිරීම සඳහා පාර්ශ්වකරුවන් එකග විය යුතුය.

## (8) විශේෂඥ සාක්ෂිකරුවන්

පැමිණිලිකරු විසින් නඩු විභාගය සඳහා පහත සඳහන් විශේෂඥ සාක්ෂිකරුවන් කැඳවනු ලැබිය හැකිය.

........................................................................................................................................................................................................................................................................

........................................................................................................................................................................................................................................................................

විත්තිකරු විසින් නඩු විභාගය සඳහා පහත සඳහන් විශේෂඥ සාක්ෂිකරුවන් කැඳවනු ලැබිය හැකිය.

.....................................................................................................................................................................................................................................

.....................................................................................................................................................................................................................................

(9) නඩු විභාගය සහ ඇස්තමේන්තු

පැමිණිලිකරු ස්වකීය සාක්ෂිකරුවන් කැඳවීම සඳහා දින............................ ක් ගත වන බව ඇස්තමේන්තු කරයි.

විත්තිකරු ස්වකීය සාක්ෂිකරුවන් කැඳවීම සඳහා දින............................ ක් ගත වන බව ඇස්තමේන්තු කරයි.

10. කියවීම / වීඩියෝ පට පෙන්වීම

පහත සඳහන් වන්නේ නඩු විභාගය අතරතුර කියවීමට / පෙන්වීමට නියමිත සාක්ෂි / වීඩියෝ පට සාක්ෂි ලැයිස්තුව සහ එලෙස කියවීමට / පෙන්වීමට නියමිත සාක්ෂි / වීඩියෝ පට සාක්ෂි ලැයිස්තුව එලෙස කියවීමට / පෙන්වීමට ගතවන ඇස්තමේන්තු ගත කාලයයි.

පැමිණිලිකරු :..............................

විත්තිකරු :...................................

............................................ ......................  ....................................................

පැමිණිලිකරුගේ නීතිඥ  විත්තිකරුගේ නීතිඥ

20....................... වර්ෂයේ ...................... මාසයේ .................... වන දින අනුමත කොට පිළිවෙලින් ගොනු කරන ලදි.

..............................................................................................................................

වාණිජ මහාධිකරණ විනිසුරු / දිසා විනිසුරු

## ඇමුණුම 2- සමථකරණ නීති කෙටුම්පත - 2015

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ (අති විශේෂ) ගැසට් නිවේදනයේ පළ කරන ලදි.

**2015 ජනවාරි................................ අංක........................**

සමථකරණ රීති 2015

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 136 වන ව්‍යවස්ථාව යටතේ අග්‍ර විනිශ්චයකාරවරයා සහ ඔහු විසින් එකී ව්‍යවස්ථාව යටතේ නම් කරනු ලැබූ වෙනත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරයන් විසින් සකස් කරනු ලැබූ රීති

1.

2.

3.

4.

5.

2015 වර්ෂයේ ................. මාසයේ........................ දින දී ය.

1. මෙම රීති 2015 වර්ෂයේ සමථකරණ රීති වශයෙන් හැඳින්වෙන අතර, එම රීති අග්‍ර විනිශ්චයකාරවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරන දැන්වීමක් මගින් නියම කරනු ලබන දිනයක දී ක්‍රියාත්මක විය යුතුය.

**1 වන රීතිය - නාමය**

මෙකී රීති 2015 සමථකරණ රීති ලෙස හැඳින්විය යුතුය.

## 2 වන රීතිය : අදාල කර ගැනීම

මෙම රීති (i) 1996 අංක 10 දරන පලාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනතේ පළමු වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති සියලු ම නඩුකර, ඉල්ලීම් සහ නීති කෘත්‍යයන් සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ගව්‍යවස්ථාව මගින් පිහිටුවනු ලැබූ බස්නාහිර පලාතේ පලාත්බද වානිජ මහාධිකරණය ඉදිරියේ ; හෝ (ii) අධිකරණ සංවිධාන පනතේ IV වන පරිච්ජේදය යටතේ හෝ යÈ වෙනත් නීතියක දක්වා ඇති යÈ කාරණාවක් සම්බන්ධයෙන් යÈ නඩු කටයුතු දිසා අධිකරණයක දී විභාග කළ යුතු බවට විශේෂයෙන් ම විධිවිධාන සලසන එවැනි නීතියක දක්වා ඇති යÈ කාරණාවක් සම්බන්ධයෙන් අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමට එම පනත යටතේ පිහිටුවා ඇති දිසා අධිකරණයක් ඉදිරියේ ; හෝ විභාග වෙමින් පවතින යÈ නඩුවක් හෝ වෙනත් නීති කෘත්‍යයක් සම්බන්ධයෙන් ඇති සියලු ම සමථකරණ කටයුතු සඳහා අදාල වේ.

## 3 වන රීතිය: සමථකරුවෙකු පත් කිරීම

(අ) නඩු කටයුත්තකට හෝ වෙනත් නීති කෘත්‍යයකට සම්බන්ධ පාර්ශ්වකරුන් ඔවුන් අතර සමථකරණය සඳහා 3 වන රීතියේ දැක්වෙන සමථකරුවන්ගේ මඩුල්ලෙන් එක් සමථකරුවෙකුගේ නමකට පමණක් එකග විය හැකි අතර, එකී නඩු කටයුත්ත හෝ නීති කෘත්‍යය අධිකරණය විසින් සුදුසු යයි සලකන පරිදි සමථකරණ මධ්‍යස්ථානයට යොමු කළ යුතුය. හෝ

(ආ) අදාල පාර්ශ්වකරුවන් දෙකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවකට එක් සමථකරුවෙකු සම්බන්ධයෙන් එකගතාවයට පැමිණීමට නොහැකි අවස්ථාවක දී, ඔවුන් අතර සමථකරණය සඳහා අධිකරණය විසින් 3 වන රීතිය මගින් දක්වා ඇති පරිදි සමථකරුවන්ගේ මඩුල්ලෙන් එක් සමථකරුවකු නÈ කළ හැකි අතර, එකී නඩු කටයුත්ත හෝ නීති කෘත්‍යය අධිකරණය විසින් සුදුසු යයි සලකන පරිදි සමථකරණ මධ්‍යස්ථානයට යොමු කළ යුතුය. හෝ

(ඇ) පාර්ශ්වකරුවන් විසින් (අ) යටතේ එක් සමථකරුවෙකු තෝරා ගැනීමට එකගව පවතින අවස්ථාවක දී හෝ අධිකරණය විසින් (ආ) යටතේ සමථකරුවෙකු නම් කරනු ලැබ ඇති අවස්ථාවක දී, එකී සමථකරුට 4 වන රීතිය මගින් දක්වා ඇති සුදුසුකම් අනිවාර්යයෙන් ම තිබිය යුතු අතර, 5 වන රීතිය මගින් දක්වා ඇති නුසුදුසුකම්වලින් යුක්ත තැනැත්තෙකු නොවිය යුතුය.

## 4 වන රීතිය: සමථකරුවන් මඩුල්ල

(අ) නඩු කටයුත්තක හෝ නීති කෘත්‍යයක පාර්ශ්වකරුන් අතර සමථකරුවෙකු පත් කිරීමේ කාර්ය සඳහා, යෝග්‍ය පුහුණු මධ්‍යස්ථානයක පුහුණුව ලැබීමෙන් අනතුරුව, අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලියාපිදංචි වී සිටින සමථකරුවන් අතුරින් අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින්, සමථකරුවන් මඩුල්ලක් සකස් කරනු ලැබිය යුතු අතර, සමථකරුවන් මඩුල්ල

අග්‍ර විනිශ්චයකාරවරයාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය. සමථකරුවන් මඬුල්ල වෙනස් කිරීම් සහිතව හෝ රහිතව අග්‍රවිනිශ්චයකාරවරයා විසින් අනුමත කිරීමෙන් පසු, එකී සමථකරුවන් මඬුල්ලේ නම් සෑම අධිකරණ කලාපයක ම පළාත් මහාධිකරණ විනිසුරුවරයා වෙත යොමු කළ යුතු අතර, පළාත් මහාධිකරණ විනිසුරුවරයා විසින් සමථකරුවන් මඬුල්ලේ නම් දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කර පිටපත් මහාධිකරණ නීතිඥ සංගමය/ දිසා අධිකරණ නීතිඥ සංගමය/ මහෙස්ත්‍රාත් අධිකරණ නීතිඥ සංගමයට සහ ශ්‍රී ලංකා නීතිඥ සංගමයට ද යැවිය යුතුය.

(ආ) සමථකරුවන් මඬුල්ලේ නම්, විස්තර, සුදුසුකම්, විවිධ ක්ෂේත්‍රවලින් ඔවුන් ලද නෛතික හෝ වෘත්තිමය හෝ විද්‍යාත්මක හෝ තාක්ෂණික පළපුරුද්ද සහ යෝග්‍ය පුහුණු මධ්‍යස්ථානයකින් ලබා ගත් සමථකරණ පුහුණුව පිළිබඳ විස්තර සහිත ඇමුණුමක් ඇතුළත් විය යුතුය.

(ඇ) (අ) සහ (ආ) වගන්ති යටතේ පත්කරනු ලබනු සමථකරුවන්ගේ : (i) සේවා කාලය සාමාන්‍යයෙන් පත්වීම ලැබූ දින සිට අවුරුදු තුනක කාලයක් වන අතර, සමථකරුවන් මඬුල්ල හෝ සමථකරුවෙකු සම්බන්ධයෙන් සේවා දිගුවක් ලබාදීම අග්‍ර විනිශ්චයකාරවරයාගේ පූර්ව අනුමැතිය සහිතව අධිකරණ සේවා කොමිෂන් සභාවේ අභිමතය මත අවස්ථාවෝචිත පරිදි සිදු කළ යුතුය.

**5 වන රීතිය : 3 වන රීතිය යටතේ මඬුල්ලට ඇතුළත් වීම පිණිස තැනැත්තකු සතු විය යුතු සුදුසුකම්**

පහත සඳහන් තැනැත්තන් සමථකරුවන්ගේ මඬුල්ලට බඳවා ගත හැකිය.

1. ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විශ්‍රාමික විනිසුරුවරුන් : හෝ

2. විශ්‍රාමික මහාධිකරණ විනිසුරුවරුන් : හෝ

3. විනිසුරුවරයෙකු ලෙස අවම වශයෙන අවුරුදු 15ක පළපුරුද්ද සහිත විශ්‍රාමික දිසා විනිසුරුවරුන් හෝ මහෙස්ත්‍රාත්වරුන් : හෝ

4. කම්කරු විනිශ්චයාධිකාරයක සභාපතිවරයෙකු වශයෙන් අවම වශයෙන් අවුරුදු 15 ක පළපුරුද්ද සහිත විශ්‍රාමික කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන් : හෝ

5. ශ්‍රේෂ්ඨාධිකරණය හෝ අභියාචනාධිකරණය හෝ මහාධිකරණය හෝ දිසා අධිකරණයක පෙනී සිටිමින් යටත් පිරිසෙයින් වසර 15 ක නීතිඥ වෘත්තියේ නියැලීමෙන් ලත් පළපුරුද්දක් සහිත නීතිඥවරයන් වීම :

6. ස්වකීය ක්ෂේත්‍රය පිළිබඳව යටත් පිරිසෙයින් වසර 15ක පළපුරුද්දක් සහිත විශේෂඥයන් හෝ වෙනත් වෘත්තිකයන් වීම :

සහ

7. ඉහත සඳහන් කවර ම හෝ තැනැත්තෙකු යෝග්‍ය පුහුණු මධ්‍යස්ථානයක් මගින් පවත්වනු ලබන අනිවාර්ය සමථකරණ පුහුණුව සාර්ථකව අවසාන් කර, සුදුසුකම්ලත් සමථකරුවෙකු වශයෙන් අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලියාපදිංචි විය යුතුය.

## 6 වන රීතිය සුදුසුකම් නොලත් තැනැත්තන්

සමථකරුවන් වශයෙන් බඳවා ගැනීමේ දී පහත සඳහන් තැනැත්තන් සුදුසුකම් නොලත් තැනැත්තන් ලෙස සැලකිය යුතුය.

(අ) බුන්වත්භාවයට පත් වූ තැනැත්තෙකු වශයෙන් විනිශ්චයකට භාජනය කරනු ලැබ ඇති යම් කවර ම වූ තැනැත්තෙන් ; හෝ

(ආ) අශීලාචාර හැසිරීමකට සම්බන්ධ අපරාධ චෝදනා අපරාධ අධිකරණ බලය ක්‍රියාත්මක කරන අධිකරණයක් විසින් ඉදිරිපත් කර ඇති හෝ එවැනි චෝදනා විභාග වෙමින් පවතින යම් කවර ම වූ තැනැත්තන් ; හෝ

(ඇ) අශීලාචාර හැසිරීම පිළිබඳ යම් අපරාධ වරදකට අපරාධ අධිකරණයක් මගින් වරදකරුවන් කර ඇති යම් තැනැත්තන් ; හෝ

(ඈ) නිසි විනය බලධරයකු විසින් විනයානුකූල ක්‍රියාමාර්ග ආරම්භ කර ඇති, හෝ එවැනි විනය ක්‍රියාමාර්ග විභාග වෙමින් පවතින හෝ එවැනි විනය ක්‍රියාමාර්ගයකට වරදකරු වී දඬුවම් ලබා ඇති යම් තැනැත්තන් ; හෝ

(ඉ) සියලු ම පාර්ශ්වකරුවන් විසින් තත්කාර්ය සඳහා වන විරෝධතාව ලියවිල්ලකින් ඉවත් කරගෙන ඇත්තම් මිස, යම් ආරවුලක හෝ ආරවුල්වල විෂය වස්තුවට උනන්දුවක් දක්වන හෝ ඊට සම්බන්ධ වී සිටින හෝ ඒ ආරවුල් නියෝජනය කරන පාර්ශ්වකරුවන්ට හෝ තැනැත්තන්ට සම්බන්ධතාවයක් දක්වන යම් තැනැත්තන් ; හෝ

(ඊ) යම් නඩුවක දී හෝ වෙනත් නීති කෘත්‍යයක දී හෝ නීති කෘතයන්වල දී යම් පාර්ශ්වකරුවන් වෙනුවෙන් පෙනී ඇති හෝ පෙනී සිටින යම් කවර ම වූ නීතිඥවරුන් ;

හෝ

(උ) අග්‍ර විනිශ්චයකාරවරයාගේ අනුමැතිය සහිතව අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් දැනුම් දෙනු ලබන එවැනි යම් කවර ම වූ ඝණවලට අයත් වෙනත් යම් කවර ම වූ තැනැත්තන් ;

**7 වන රීතියඃ සමථ මඩුල්ලට එක් කිරීම හෝ සමථ මඩුල්ලෙන් ඉවත් කිරීම**

අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයාට, අග්‍ර විනිශ්චයකාරවරයාගේ පූර්ව අනුමැතිය සහිතව කලින් කලට ස්වකීය අභිමතය පරිදි යම් තැනැත්තකු සමථකරුවනගේ මඩුල්ලට එක් කිරීම, ඉන් ඉවත් කිරීම සිදු කළ හැකිය.

**8 වන රීතිය : ප්‍රමුඛතාවය.**

අධිකරණය විසින් **3** වන රීතිය යටතේ සමථකරුවන්ගේ මඩුල්ලෙන් එක් තැනැත්තෙකු නම් කරන විට, ආරවුල් සමථයකට පත් කිරීම සඳහා එම තැනැත්තාගේ යෝග්‍යතාව සළකා බැලිය යුතු අතර, සමථකරණ මඩුල්ලේ තොරතුරු පිලිබඳ ඇමුණුමෙහි ඇතුළත් සුදුසුකම් පිලිබඳ සළකා බැලීමෙන් පසුව, සමථකරණයෙහි සාර්ථකව නියැලෙන බවට වාර්තා ඇති හෝ සමථකරණය පිලිබඳ විශේෂ සුදුසුකම් හෝ පළපුරුද්දක් ලබා ඇති සමථ මඩුල්ලේ සමථකරුවන්ට ප්‍රමුඛතාවය ලබා දිය යුතුය.

**9 වන රීතියඃ ඇතැම් කාරණා හෙළිදරවු කිරීම පිණිස සමථකරුගේ වගකීම**

(අ) සමථකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ යෝජිත පත්වීම සම්බන්ධයෙන් ඒ සමථකරුට යම් ප්‍රවේශයක් තිබෙන විටක දී, ඔහුගේ ස්වාධීනත්වය හෝ අපක්ෂපාතීත්වය සම්බන්ධයෙන් සාධාරණ සැකයකට තුඩු දිය හැකි යම් කවර ම අවස්ථානුගත තත්වයක් ඔහු විසින් අනාවරණය කළ යුතුය.

(ආ) සෑම සමථකරුවෙක්ම, ස්වකීය පත්වීම ලැබුණු දින සිට කලින් කළට මෙන් ම සමථකරණ කෘත්‍යය සිදු වන කාලය පුරාම, (අ) වගන්තියේ සඳහන් වන යම් කවර ම වූ අවස්ථානුගත තත්වයන්වල පැවැත්ම ප්‍රමාදයකින් තොරව අනෙක් පාර්ශ්වකරුවන්ට හෙළිදරවු කළ යුතුය.

**10 වන රීතියඃ පත්වීම ඉවත් කරගැනීම**

**9** වන රීතිය යටතේ සමථකරු විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු හෝ පාර්ශ්වකරුවන් සහ වෙනත් තැනැත්තන්ගෙන් ලැබෙන තොරතුරු මත, එම තොරතුරු නිසා සමථකරුගේ ස්වාධීනත්වය හෝ අපක්ෂපාතීත්වය පිලිබඳව සාධාරණ සැකයක් මතු වන බවට නඩුව හෝ නඩු කටයුතු කෙරෙමින් පවතින අධිකරණය සෑහීමකට පත් වන අවස්ථාවක දී, එකී පත්වීම ඉවත් කර සමථකරුවන්ගේ මඩුල්ලේ සිටින වෙනත් සමථකරුවෙකු ඒ සමථකරු වෙනුවට පත් කළ හැකිය.

## 11 වන රීතිය : සමථකරණ කාර්ය පටිපාටිය

(අ) සමථකරණ කටයුතු පැවැත්වීමේ දී, සමථකරු විසින් අනුගමනය කළ යුතු කර්ය පටිපාටියට පාර්ශ්වකරුවන් එකග විය යුතුය.

(ආ) සමථකරුවන් විසින් අනුගමනය කළ යුතු යම් විශේෂ කර්ය පටිපාටියකට එකග නොවන අවස්ථාවක දී, සමථකරු විසින් මෙහි මින් මතු දැක්වෙන කර්ය පටිපාටිය අනුගමනය කළ යුතුය.

(i) සියලු ම පාර්ශ්වකරුවන්ගේ පැමිණීම අවශ්‍ය වන විටක දී, සමථකරු විසින් පාර්ශ්වකරුවන් සමග සාකච්ඡා කිරීමෙන් පසුව, සෑම සමථකරණ සැසිවාරයක් ම පැවැත්විය යුතු කාල උපලේඛන, දින සහ වේලාවන් නියම කර ගත යුතුය.

(ii) සමථකරු විසින් මහාධිකරණය හෝ දිසා අධිකරණය මගින් නියම කරනු ලබන ස්ථානයක දී හෝ පාර්ශ්වකරුවන් හා සමථකරු එකග වන ස්ථානයක දී සමථකරණ කටයුතු පැවැත්විය යුතුය.

(iii) සමථකරු විසින් පාර්ශ්වකරුවන් සමග හවුල් රැස්වීම් හෝ වෙන් වූ රැස්වීම් හෝ පෞද්ගලික රැස්වීම් පැවැත්විය හැකිය.

(iv) එක් එක් පාර්ශ්වකරු, සැසිවාරයකට දින දහයකට පෙර, එක් එක් පාර්ශ්වකරු විසින් සමථයකට පත් කර ගතයුතු ගැටළු, එකී ගැටළු සම්බන්ධ එක් එක් පාර්ශ්වකරුගේ ස්ථාවරය සහ එකී ගැටළු පිළිබඳව අවබෝධ කරගැනීමට සාධාරණ වශයෙන් එක් එක් පාර්ශ්වකරු විසින් අවශ්‍ය සියලු ම තොරතුරු ඇතුළත් කෙටි සංදේශයක් සැපයිය යුතු අතර, එකී කෙටි සංදේශය පාර්ශ්වකරුවන් අතර අන්‍යෝන්‍ය වශයෙන් හුවමාරු කර ගත යුතුය.

එසේ වුව ද, සමථකරුගේ අභිමතය පරිදි දින දහයක කාල පරිච්ඡේදය ඇතැම් නඩුවලට යෝග්‍ය වන ආකාරයට කෙටි කළ හැකිය.

(v) සමථයකට පත් කළ හැකි ගැටළු සම්බන්ධයෙන් එක් එක් පාර්ශ්වකරුට අවශ්‍ය විය හැකි වෙනත් තොරතුරු එක් එක් පාර්ශ්වකරු විසින් සමථකරුට ඉදිරිපත් කළ යුතුය.

## 12 වන රීතිය : සමථකරු සාක්ෂි ආඥාපනතින් හෝ සිවිල් නඩු විධාන සංග්‍රහයෙන් බැඳී නොසිටීම

සමථකරු සාක්ෂි ආඥාපනතින් හෝ සිවිල් නඩු විධාන සංග්‍රහයෙන් බැඳී නොසිටින නමුත් පාර්ශ්වකරුවන්ගේ අයිතිවාසිකම් සහ බැඳීම්, වෙළඳාÈ භාවිතයන් යොදා ගැනීමක් ඇත්නම් ඒ

සම්බන්ධයෙන් සහ ආරවුල / ආරවුල් අවස්ථා පිළිබඳ සාධාරණත්වය සහ යුක්තිය පිළිබඳ මූලධර්ම මගින් මාර්ගෝපදේශ ලබා ගත යුතුය.

## 13 වන රීතිය : පාර්ශ්වකරුවන් නියෝජනය කිරීම

සමථකරු විසින් දැනුම් දෙනු ලැබූ සැසිවාර හෝ රැස්වීම්වල දී පාර්ශ්වකරුවන් සාමාන්‍යයෙන් පෞද්ගලිකව හෝ ඔවුන්ගේ නියෝජිතයින් මගින් හෝ නීතියෙන් පත් කරනු ලැබූ නීතිඥවරයෙකු මගින් ඉදිරිපත් විය යුතුය. එසේ වුව ද, එකී සැසිවාර හෝ රැස්වීම්වල දී, නීතිඥයකු මගින් පෙනී සිටීමට ඔවුන්ට හිමිකම් තිබිය යුතුය.

## 14 වන රීතිය : රැස්වීම් හෝ සැසිවාරවලට පාර්ශ්වයන් නියමිත දිනට සහභාගී නොවීමේ ප්‍රතිඵල

සමථකරු විසින් දැනුම් දෙනු ලැබූ සැසිවාරයකට  හෝ රැස්වීමකට පාර්ශ්වකරුවකු හිතමතාම හෝ කැමැත්තෙන් සහභාගී වීම පැහැර හරින අවස්ථාවක දී, අනෙක් පාර්ශ්වයට හෝ සමථකරුට නඩුව හෝ නඩුව විභාග වෙමින් තිබෙන අධිකරණය වෙත ඒ පිළිබඳව ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකි අතර, එවැනි අවස්ථාවක දී අධිකරණය විසින් ආරවුලට හේතු වූ කාරණා හෝ තත්ත්වයන් පිළිබඳව සලකා යෝග්‍ය උපදෙස් නිකුත් කරනු ලැබිය හැකිය.

## 15 වන රීතිය :පරිපාලන සහාය

නාමෝද්දිෂ්ට සමථකරණ මධ්‍යස්ථානය, සමථකරණ කෘත්‍යය පැවැත්වීම පහසු කිරීම පිණිස සියලු ම පරිපාලන කටයුතු සකස් කරනු ලැබිය යුතු අතර, නාමෝද්දිෂ්ට සමථකරණ මධ්‍යස්ථානය නොමැති විටක දී, සමථකරුට පාර්ශ්වකරුවන්ගේ ද කැමැත්ත ඇතිව අදාළ ආයතනයකින් හෝ තැනැත්තෙකුගෙන් පරිපාලන සහාය ලබා ගැනීමට සැළසුම් කළ හැකිය.

## 16 වන රීතිය: සමථකරුගේ භූමිකාව

(අ) පාර්ශ්වකරුවන්ට ආරවුල නිරාකරණය කර ගැනීම පිණිස ස්වේච්ඡාවෙන් ම සමථයකට එළඹීම පහසු කිරීම සඳහා සමථකරු උත්සාහ දැරිය යුතු අතර, එක් පාර්ශ්වයක අදහස අනෙක් පාර්ශ්වයට සන්නිවේදනය කරමින් තමන්ට බලපාන තීරණ ගැනීම පාර්ශ්වයන්හි වගකීම බව අවධාරණය කරමින් ගැටළු හඳුනා ගැනීමට, වරදවා වටහා ගැනීÈ අඩු කර ගැනීමට, ප්‍රමුඛතා පැහැදිලි කර ගැනීමට, එකගතාවයකට ඒමට ඇති අවස්ථා සොයා බැලීමට සහ ආරවුල විසඳා ගැනීමට උත්සාහ කිරීම සඳහා විකල්ප ඇති කිරීමට සහාය විය යුතු අතර, ඔහු විසින් පාර්ශ්වකරුවන් සමථයක පත් කරවීමේ කිසිදු නියමයක් ඉදිරිපත් නොකළ යුතුය.

(ආ) සමථකරු විසින් =

(i) සමථයකට එළඹීම පිණිස පාර්ශ්වකරුවන්ට මග පෙන්වමන් පහසුකම් සළසන්නෙකු ලෙස ක්‍රියා කිරීම ;

(ii) පාර්ශ්වකරුවන් සමඟ එක්ව, වෙන වෙන ම හෝ වෙනත් ආකාරයකට හමුවීම හෝ සන්නිවේදනය කිරීම ;

(iii) ආරවුල නිරාකරණය කර ගැනීම පිණිස සමථකරණයේ යÈ කවර ම හෝ අදියරක දී යොජනා ඉදිරිපත් කිරීම ;

කළ හැකිය.

(ඇ) සමථකරුට =

(i) සමථකරණ ක්‍රියාවලියේ යÈ කවර ම අදියරක දී, එකී සමථකරණයේ ප්‍රතිඵලය තීරණය කිරීමේ බලය නොතිබිය යුතුය.

(ii) සමථකරු විසින් ආරවුලේ තත්ත්වය පිලිබඳව අවධානය යොමු කරමින් සමථකරණ ක්‍රියාවලිය පුරාම දෙපාර්ශ්වයට ම සාධාරණව සැලකිය යුතුය.

**17 වන රීතිය : තීරණ ගැනීම සඳහා පාර්ශ්වකරුවන් තනිව ම වගකීම දැරීම**

සමථකරු වනාහි ආරවුල නිරාකරණය කර තීරණයකට එළඹීම පහසු කරන්නෙකු පමණක් වන බවටත්, සමථකරු වනාහි යම් සමථයක් පැනවීම සහ පැනවීම කළ හැකි තැනැත්තකු හෝ සමථකරණ ක්‍රියාවලියේ අවසානය සමථයක් ඇති වන බවට තහවුරු කරන්නකු නොවන බවටත්, පාර්ශ්වකරවන්ට අවබෝධ කර දිය යුතුය. සමථකරු විසින් පාර්ශ්වයන් මත කිසිදු තීරණයක් නොපැනවිය යුතුයි.

**18 වන රීතිය-සමථකරණය අවසන් කිරීමේ කාලසීමා සීමා කිරීම්**

පාර්ශ්වකරුවන් සමථකරුවන් හමුවේ ප්‍රථම වරට පෙනී සිටීමට නියම කරගත් දිනයේ සිට දින 90 ක් ඇතුළත සමථකරණය අවසන් කළ යුතු අතර, පාර්ශ්වකරුවන් ප්‍රථම වරට සමථකරු හමුවේ පෙනී සිටීමට නියම කරගත් දින සිට දින 90 ක් අවසන් වූ පසුව සියලු ම පාර්ශ්වකරුවන්ට ඇහුන්කන් දීමෙන් පසුව පාර්ශ්වකරුවන්ගේ ඉල්ලීම මත කාලය දීර්ඝ කිරීම අවශ්‍ය සහ ප්‍රයෝජනවත් වන බවට අදාළ කාරණය යොමු කළ අධිකරණයේ මතය වන්නේ නම් මිස, සමථකරණය අවසාන වන නමුත්, එපරිදි කාලය දීර්ඝ කිරීමක් දින 30 ක කාලයක් නොඉක්මවිය යුතුය.

**19 වන රීතිය -සමථකරු විසින් ආරක්ෂා කළ යුතු රහස්‍යභාවය**

**(අ)** සමථයකට එළඹීම පිණිස පාර්ශ්වකරුවන් හෝ පාර්ශ්වකරුවන් කිහිප දෙනෙකුට හැකි වීම පිණිස සමථකරු විසින් සුදුසු යයි සලකන යම් කවර ම වූ හෝ කාර්ය පටිපාටියක් සමථකරු විසින් යොදා ගනු ලැබිය හැකිය. ඒ අනුව, සමථකරු විසින් නඩුවට සම්බන්ධ සිද්ධිමය සහ නීතිමය ගැටළු, ඒ හා සම්බන්ධ සියලු ම කාරණා සියලු ම පාර්ශ්වකරුවන් පුද්ගලිකව සහ / හෝ ඒ පාර්ශ්වකරුවන්ගේ නීතිඥවරුන් සමග හෝ ඒ එක් එක් පාර්ශ්වකරුවන් හෝ ඊට වැඩි පාර්ශ්වකරුවන්ගේ නියෝජිතයන් සමග ඔවුන්ගේ නීතිඥයන් සමග හෝ ඔවුන් නොමැතිව සාකච්ඡා කළ යුතුය. එක් පාර්ශ්වකරුවකු හෝ ඊට වැඩි පාර්ශ්වකරුවන් සංඛ්‍යාවක් සමථයකට පත් වීම සඳහා කැමැත්තක් දක්වන නියමයන් සමථකරුට නිශ්චිතවම හඳුනා ගත හැකිය. සමථකරුට එළිදරව් කළ හෝ සමථකරු හා සාකච්ඡා කරනු ලැබූ නියමයන් පාර්ශ්වකරුවන්ගේ අනුමැතියකින් තොරව වෙනත් යම් කවර ම වූ පාර්ශ්වයකට එළිදරව් නොකරන්නේ ය යන අවබෝධතාවය මත සමථකරු විසින් එසේ කළ හැකිය.

(ආ) සමථකරණ කටයුතුවල දී ශ්‍රව්‍ය හෝ දෘෂ්‍ය පටිගත කිරීම් නොතිබිය යුතුය.

(ඇ) පාර්ශ්වකරුවන්ගේ හෝ සාක්ෂිකරුවන්ගේ කිසිදු ප්‍රකාශයක් සමථකරු විසින් වාර්තා නොකළ යුතුය.

**20 වන රීතිය - පාර්ශ්වකරුවන් විසින් ආරක්ෂා කළ යුතු රහස්‍යභාවය**

(අ) ඉදිරිපත් කර ඇති ලේඛන සහ සමථකරණ සැසිවාර පවත්වන අතරතුර දී එළිදරව් වන සහ සාකච්ඡා කරනු ලබන අනෙකුත් සියලු ම කරුණු සම්බන්ධයෙන් රහස්‍යභාවය ආරක්ෂා කිරීම සෑම පාර්ශ්වකරුවකුගේ ම සහ සෑම සමථකරුවකුගේ ම වගකීම විය යුතුය.

(ආ) සමථකරණය සම්බන්ධ තොරතුරුවල රහස්‍යභාවය පාර්ශ්වකරුවකුට සමථකරු සහ සමථකරණය පැවැත්වීම සඳහා සහභාගී වන වෙනත් තැනැත්තන් විසින් =

(i) සියලු ම පාර්ශ්වකරුවන් එළිදරව් කිරීමට එකගව සිටින විටක; සහ එය සමථකරු සම්බන්ධ තොරතුරක් නම්, එය එළිදරව් කිරීමට සමථකරු එකගතාව පළකර ඇති විටක ;

(ii) එවැනි එළිදරව් කිරීමක් නීතිය මගින් නියම කරන විටක ;

(iii) සමථයකට එළඹීමේ ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා හෝ බලාත්මක කිරීම සඳහා එවැනි එළිදරව් කිරීමක් අවශ්‍ය වන විටක ;

(iv) විෂමාචාරයක් සිදු කිරීමට ප්‍රතිචාර දැක්වීම සඳහා සමථකරුට එවැනි එළිදරව් කිරීමක් අවශ්‍ය වන විටක ;

හැර ආරක්ෂා කළ යුතුය

එසේ වුව ද, ඉහත සඳහන් විධිවිධානය -

(i) තොරතුරු ප්‍රසිද්ධියේ ලබා ගැනීමට අවස්ථාවක් තිබෙන විටක ;

(ii) පාර්ශ්වකරුවන් ස්වකීය ක්‍රියාකලාපය තුළින් ඒ තොරතුරු රහස්‍ය වන තොරතුරු යයි නොසලකන විටක:

(iii) මෙම රීතිය යටතේ නියම කරන එළිදරව් කිරීමක් සිදු කිරීමට සමථකරු අපොහොසත් වූ අවස්ථාවක දී, තීරණයක් ගැනීම සඳහා අදාළ වන විටක ;

අදාළ නොවිය යුතුය.

**21 වන රීතිය - සමථකරණ සැසිවාරයක දී ඉදිරිපත් කරන තොරතුරුවල හෝ ප්‍රකාශවල ආවේශ්‍යතාව**

**(අ)** සමථකරණ සැසිවාරයක දී යම් පාර්ශ්වකරුවකු විසින් එළිදරව් කළ තොරතුරු හෝ සිදු කරන ලද ප්‍රකාශයක් යම් අධිකරණ හෝ පරිපාලන නීති කෘත්‍යයක දී සාක්ෂි වශයෙන් සොයා ගැනීම හෝ ආවේශ්‍ය කිරීම නොකළ යුතු අතර, ඊට -

(i) වාණිජ ආරවුලක් සමථ කිරීම සඳහා යම් පාර්ශ්වකරුවකුට ආරාධනා කිරීම, ආරවුල සමථ කිරීම සඳහා පාර්ශ්වකරුවකුගේ කැමැත්ත ප්‍රකාශ කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම, සමථකරණය ආරම්භ කිරීමට පෙර දෙපාර්ශ්වය අතර හුවමාරු වූ තොරතුරු සහ ආරවුල සමථ කිරීම සඳහා යම් එකගතාවක් ;

(ii) සමථකරණය සිදු කිරීමේ අරමුණින් ම සකස් කරනු ලැබූ ලියවිල්ලක් ;

(iii) සමථකරණය අතරතුර දී ආරවුල සමථයකට පත් කරගත හැකි අයුරු සම්බන්ධයෙන් පාර්ශ්වකරුවන් විසින් ප්‍රකාශ කරනු ලබන අදහස් හෝ ඉදිරිපත් කරන යෝජනා ;

(iv) සමථකරණය අතරතුර දී පාර්ශ්වකරුවන් විසින් සිදු කරනු ලබන ප්‍රකාශ සහ පිළිගැනීම් ;

(v) සමථයක් සඳහා සමථකරු විසින් සිදු කරනු ලබන ප්‍රකාශ සහ යෝජනා ;

(vi) සමථකරු විසින් ඉදිරිපත් කරනු ලැබූ සමථයකට එළඹීමේ යෝජනාව පිළිගැනීම සඳහා එක් පාර්ශ්වකරුවකු විසින් කැමැත්ත දැක්වීම පිළිබඳ කාරණය ;

(vii) සමථකරු හෝ පාර්ශ්වකරුවකු සමථකරණය අවසාන කළ බව යන කාරණය ;

ඇතුළත් වේ.

(ආ) ඉහත 6.8.1 සඳහන් තොරතුරු -

(i) නීතිය මගින් ;

(ii) සමථ එකගතාව සිදු කිරීමට හෝ බලාත්මක කිරීමේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ;

(iii) විෂමාචාර ක්‍රියාවක් සිදු කිරීම සම්බන්ධයෙන් සමථකරුට ප්‍රතිචාර දැක්වීමක් සඳහා ;

(iv) සියලු ම පාර්ශ්වකරුවන් සමථකරණයට කැමැත්තක් දක්වන්නේ නම් සමථකරු සම්බන්ධ තොරතුරු නම් සමථකරු කැමැත්තක් දක්වන්නේ නම් :

එපමණට සාක්ෂි ලෙස පිළිගත හැකිය.

**22 වන රීතිය = සමථකරණ සැසිවාරයක දී ප්‍රකාශ ඉදිරිපත් කරන තැනැත්තන්ගේ වරප්‍රසාද**

සමථකරණ සැසිවාරයක දී ප්‍රකාශයක් ඉදිරිපත් කරන සෑම තැනැත්තකුට ම අධිකරණයක් හමුවේ සාක්ෂි ලබා දෙන සාක්ෂිකරුවකුට එම සාක්ෂි සම්බන්ධයෙන් හිමි වන වරප්‍රසාද සියල්ලට ම මෙන් ම ඒ ප්‍රකාශය ඉදිරිපත් කරන තැනැත්තාට ද එකී ප්‍රකාශය සම්බන්ධයෙන් සියලු ම වරප්‍රසාදවලට හිමිකම ලැබෙනු ඇත.

**23 වන රීතිය - සමථකරණය නිසා අධිකරණ නීති කෘත්‍ය කල් දැමීම හෝ අත්හිටුවීම නොකිරීම**

යම් සමථකරණ නීති කෘත්‍යයක් ආරම්භ කිරීම, නඩු කළමනාකරණ, පූර්ව - නඩු විභාග පියවර සහ පූර්ව - නඩු විභාග පියවර සම්මේලනය ඇතුළුව අධිකරණ නීති කෘත්‍ය අවහිර කිරීමක් හෝ කල් දැමීමක් ලෙස නොසැලකිය යුතු අතර, යම් සමථකරණ නීති කෘත්‍යයක් හේතුවෙන් අධිකරණ නීති කෘත්‍යයක් නතර කිරීම හෝ කල් දැමීමට අධිකරණය විසින් යම් කවර ම වූ නියෝගයක් නිකුත් නොකළ යුතුය.

**24 වන රීතිය - සමථකරු / සමථ සහනකරු විසින් අනුගමනය කළ යුතු ආචාර ධර්ම පද්ධතිය**

සමථකරු විසින් -

(1) මෙම රීති තරයේ ම සහ නිසි අනලස්භාවයකින් සහ උද්යෝගයකින් යුක්තව අනුගමනය කොට පිළිපැදිය යුතුය.

(2) සමථකරුවකුගේ / සමථ සහනකරුවකුගේ ක්‍රියාකලාපයට උචිත නොවන සහ නොගැළපෙන බවට සාධාරණ යයි සළකන ක්‍රියාවක හෝ පැවැත්මක නොයෙදිය යුතුය.

(3) සමථකරණය / සමථ සහන සැලසීමේ ක්‍රියාවලියේ දී අවංකභාවය මෙන් ම සාධාරණත්වය පවත්වා ගැනීම කළ යුතුය.

(4) සාධාරණය / සමථ සහන සැලසීමේ ක්‍රියාවලියට සහභාගී වන පාර්ශ්වකරුවන්ට ඒ පිළිබඳ සාධාරණ දැනුම් දීමක් කළ යුතු අතර, ක්‍රියාවලියේ කාර්ය පටිපාටිමය අංශ පිළිබඳව ප්‍රමාණවත් අවබෝධයක් ඇති බව තහවුරු කළ යුතුය.

(5) පැවරෙන කාර්ය සහ කර්තව්‍ය භාර ගෙන වෘත්තිමය ආකාරයෙන් ඉටු කොට සම්පූර්ණ කිරීම පිණිස තමා ලබා ඇති සුදුසුකම් පිළිබඳව සෑහීමකට පත් විය යුතුය.

(6) අපක්ෂපාතීත්වයට බලපෑමක් ඇති කරන ආකාරයේ සම්බන්ධතාවයක් හෝ ඥාතීත්වයක් හෝ පක්ෂපාතී හෝ පක්ෂග්‍රාහී බවක් හෝ අභිනතියක් හෝ නැඹුරුවක් පිළිබඳ දෘෂ්‍යමාන තත්වයක් එළිදරව් කළ යුතුය.

(7) පාර්ශ්වකරුවන් සමග සන්නිවේදනය කරන විට අශෝභන සහ අශීලාචාර හෝ අශෝභන ලෙස හෝ අශිලාචාර ලෙස පෙනෙන සන්නිවේදනය මග හැරීමට කටයුතු කළ යුතුය.

(8) සමථකරු / සමථ සහනකරු තනතුරට පනවා ඇති විශ්වසනියභාවයේ සහ රහස්‍යභාවයේ සම්බන්ධතාව පිළිබඳව හිතෛෂි විය යුතුය.

(9) ආරවුල විසඳීමේ දී අදාළ නීතියට අනුව පාදක සියලු ම නීති කෘත්‍ය පැවැත්විය යුතුය.

(10) සමථකරණ / සමථ සහන සැලසීමේ ක්‍රියාවලිය පාර්ශ්වකරුවන්ගේ ස්වයං තීරණ ගැනීමේ ප්‍රතිපත්තිය මත රඳා පවතින අතර, එනම් සමථයට / සමථ සහන සැලසීමේ ක්‍රියාවලියට සම්බන්ධ පාර්ශ්වකරුවන්ගේ ස්වේච්ඡාවෙන් ම සහ එළිදරව් නොවූ එකගතාවයකට එළඹීමේ හැකියාව මත රඳා පවතින බව හඳුනාගත යුතුය.

(11) විශ්වසනියභාවය සුරැකීම සම්බන්ධයෙන් පාර්ශ්වකරුවන් විසින් සාධාරණ වූ අපේක්ෂාවන් පවත්වා ගැනීම කළ යුතු අතර, ප්‍රතිඵල පිළිබඳ පොරොන්දු දීමෙන් සහ ඊට සහතික වීමෙන් වැළකී සිටිය යුතුය.

**25 වන රීතිය = මුක්තිය**

සමථකරු සිවිල් හෝ අපරාධ නඩුවක සමථකරණ නඩු කටයුතු අතරතුර දී සද්භාවයෙන් කරන ලද හෝ නොකර අත්හරින ලද කිසිදු ක්‍රියාවක් සම්බන්ධයෙන් වගකීම නොදැරිය යුතු අතර, සමථකරණ ක්‍රියාවලිය තුළ දී ඔහු විසින් ලබාගත් තොරතුරු, ගනු ලැබූ ක්‍රියාමාර්ග හෝ ඔහු විසින් පිළියෙල කරනු ලැබූ කෙටුම් පත් හෝ සටහන් සහ වාර්තා සම්බන්ධයෙන් යම් පාර්ශ්වයක් විසින් නඩු පැවරීමක් හෝ අධිකරණයේ පෙනී සිටීමට සිදු වන නඩුකරයක් හෝ නඩු කටයුත්තක් පැවරීම සිදු නොකළ යුතුය.

**26 වන රීතිය - සමථකරු සහ අධිකරණය අතර සන්නිවේදනය**

(අ) අධිකරණය තුළ දී පාර්ශ්වකරුවන් දක්වන විශ්වාසය සහ සමථකරුගේ අපක්ෂපාතීත්වය ආරක්ෂා කිරීමේ අරමුණින් මෙම රීතියේ (ආ) සහ (ඇ) යන වගන්තිවල දක්වා ඇති අවස්ථාවල දී හැර, සමථකරු සහ අධිකරණය අතර කිසිදු සන්නිවේදනයක් සිදු නොවිය යුතුය.

(ආ) සමථකරු සහ අධිකරණය අතර සන්නිවේදනය අත්‍යවශ්‍ය වන්නේ නම්, එය ලියවිල්ලක් මගින් සිදු කළ යුතු අතර, එම ලියවිල්ලේ පිටපතක් පාර්ශ්වකරුවන්ට හෝ නීතිය ප්‍රකාරව පත් කරනු ලැබ ඇති නීතිඥවරයා හෝ උපදේශක නීතිඥවරයා වෙත ලබා දිය යුතුය.

(ඇ) සමථකරු සහ අධිකරණය අතර සන්නිවේදනය සමථකරු විසින් සීමා කරගත යුතුය.

## 27 වන රීතිය - සමථයකට එළඹීම සඳහා පාර්ශ්වකරුවන්ට තිබෙන අවස්ථාව

(අ) තඩුවේ යම් කවර ම වූ පාර්ශ්වකරුවකු "අගති විරහිතව" සමථ ක්‍රියාවලියේ ඕනෑම අදියරයක දී සමථකරුට / සමථ සහනකරුට දැන්වීමක් භාර දී සමථයකට එළඹීම පිණිස අවස්ථාවක් ඒ අනෙක් පාර්ශ්වකරුට ලබා දිය යුතුය.

(ආ) තඩුවේ යම් කවර ම වූ පාර්ශ්වකරුවකු "අගති සහිතව" සමථ ක්‍රියාවලියේ ඕනෑම අදියරයක දී සමථකරුට / සමථ සහනකරුට දැන්වීමක් භාර දී සමථයකට එළඹීම පිණිස අවස්ථාවක් ඒ අනෙක් පාර්ශ්වකරුට ලබා දිය යුතුය.

## 28 වන රීතිය - සමථ ගිවිසුම

(අ) තඩුවට හෝ තඩු කටයුතුවලට හේතු වූ සියලු ම විසඳනාවන් හෝ ඒ විසඳනාවන් කිහිපයක් සම්බන්ධයෙන් පාර්ශ්වකරුවන් අතර එකගතාවක් පවතින අවස්ථාවක දී, එය පාර්ශ්වකරුවන්ගේ සහ ඔවුන් වෙනුවෙන් පත් කරනු ලැබූ නීතිඥවරුන්ගේ අත්සනින් යුක්ත ලියවිල්ලකින් ඉදිරිපත් කළ යුතුය. උපදේශක නීතිඥවරයෙකු පාර්ශ්වකරුවන් නියෝජනය කරන අවස්ථාවක දී සමථකරු විසින් සමථ එකගතාවයට ඔහුගේ අත්සන ලබා ගත හැකිය.

(1) එසේ අත්සන් තබනු ලැබූ පාර්ශ්වකරුවන් අතර එකගතාව සමථකරුට ඉදිරිපත් කළ යුතු අතර, ඔහු සිය අත්සන යෙදූ ආවරණ ලිපියක් ද සමග තඩුකරය හෝ තඩු කටයුතු විභාග වෙමින් පවතින අධිකරණය වෙත යොමු කළ යුතුය.

(2) 18 වන රීතියේ සඳහන් කාලසීමාවට පෙර පාර්ශ්වකරුවන් අතර එකගතාවක් ඇති නොවූ අවස්ථාවක දී, හෝ සමථයකට පත් කළ නොහැකි බව සමථකරුගේ මතය වන විටක දී, ඒ බව සමථකරු විසින් ලියවිල්ලකින් අධිකරණය වෙත ඉදිරිපත් කළ යුතුය.

(ආ) අධිකරණයක් මගින් යොමු කරනු ලැබූ යම් ආරවුලක් සම්බන්ධයෙන් සමථයක් ඇති අවස්ථාවක දී, සමථකරුවා විසින් ඒ සමථයේ පිටපතක් අධිකරණයට යොමු කළ යුතු අතර, අධිකරණය විසින් පාර්ශ්වකරුවන්ට ඒ සමථය දැනුම් දීමෙන් පසුව, එම සමථය ප්‍රකාරව තීන්දු ප්‍රකාශය ඇතුළත් කළ යුතුය.

(ඇ) සමථකරුවා, සමථ එකගතාවට අදාල අතිරේක පිටපතක් සමථකරණ ක්‍රියාවලිය අවසානයේ සිට යටත් පිරිසෙයින් වසර 03ක කාලයක්වත් තමා භාරයෙහි ආරක්ෂා සහිතව තබා ගැනීම කළ යුතුය.

## 29 වන රීතිය - තිරවුල් නොකිරීමේ සහතිකය

(අ) ආරවුලට සම්බන්ධ පාර්ශ්වකරුවන් සමථයකට එළඹීම සඳහා එකගතාව පළ නොකරන අවස්ථාවක දී, අදාල ආරවුල සම්බන්ධ සමථකරණ ක්‍රියාවලිය මෙහෙයවන සමථකරු හෝ සමථකරුවන් විසින් එකී ආරවුල සමථකරණය මගින් සමථයකට පත් කළ නොහැකි බව සඳහන් කර, සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතුය. එකී සෑම සහතිකයක් ම සමථකරුවා හෝ සමථකරුවන් විසින් අවස්ථාවෝචිත පරිදි අත්සන් කර තිබිය යුතුය.

(ආ) 1 වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ සහතිකයක්, අධිකරණයේ පවරා ඇති නඩුවක හෝ නීති කෘත්‍යයක සාක්ෂි වශයෙන් ඉදිරිපත් කළ හැකි අතර, එකී සහතිකය ඔප්පු කිරීම සඳහා එකී තැනැත්තන් අධිකරණය වෙත සාක්ෂි වශයෙන් කැඳවීම අවශ්‍ය නොවිය යුතුය.

(ඇ) යම් ආරවුලක් සම්බන්ධයෙන් වන යම් නීති කෘත්‍යයක සාක්ෂිකරුවන් වශයෙන් සමථකරු හෝ සමථකරු පත් කිරීමේ බලධරයා කැඳවීම ද නොකළ යුතුය.

(ඇ) ආරවුල සමථයකට පත් කළ නොහැකි බවට නිකුත් කරනු ලබන නිරවුල් නොකිරීමේ සහතිකයේ ඇති සමථකරුගේ අත්සන, අධිකරණය විසින් සැබෑ අත්සනක් ලෙසට පිළිගන්නා අතර, ඊට අත්සන් තබන සමථකරුට ඒ සඳහා බලය පැවරී තිබෙන බවට සැලකිය යුතුය.

එසේ වුව ද, යම් නඩුවක දී, හේතුන් සටහන් කිරීම පිණිස අදාල අධිකරණය හමුවේ සමථකරුගේ පෙනී සිටීම අත්‍යවශ්‍ය වන බවට යම් පාර්ශ්වකරුවකු විසින් හෝ අන්‍යාකාරයෙන් ඉදිරිපත් කළ ඉල්ලීමක් නිසා, අධිකරණයේ මතය වන අවස්ථාවක දී, එම සහතිකය අත්සන් කිරීම සම්බන්ධයෙන් සාක්ෂි ලබා ගැනීම සඳහා පමණක් එම සමථකරු අධිකරණය හමුවේ සාක්ෂිකරුවකු ලෙස කැඳවිය යුතුය.

**30 වන රීතිය - සමථකරණය මගින් ආරවුලක් තීරණය කිරීම**

සමථකරණ එකගතාවක් යටතේ සමථකරණයට යොමු කිරීම සඳහා පාර්ශ්වකරුවන් එකග වූ යම් ආරවුලක් සමථකරණ එකගතාවකට එළඹ තිබෙන එම කාරණය හුදෙක් රාජ්‍ය ප්‍රතිපත්තිවලට පටහැනි වන බවට හෝ සමථකරණය මගින් තීරණය කිරීමට නොහැකි කාරණා වන බවට සලකන්නේ නම් මිස, සමථකරණය මගින් තීරණය කළ හැකිය.

**31 වන රීතිය - අවසාන කිරීම**

සමථකරණය -

(අ) පාර්ශ්වකරුවන් සමථකරණ එකගතාවකට එළඹී ඇති දිනයේ දී ;

(ආ) සමථකරණය අවසාන කළ බව පාර්ශ්වකරුවන් විසින් එක්ව සමථකරුට ප්‍රකාශ කර සිටින දිනයේ දී ;

(ඇ) සමථකරුවා පාර්ශ්වකරුවන් සමග සාකච්ඡා කර සමථකරණයෙන් විසඳීම පිණිස තවදුරටත් ප්‍රයත්න දැරීම නිශ්ඵල වන බැවින්, සමථකරණය අවසාන කළ බව ප්‍රකාශ කර සිටින දිනයේ දී අවසාන වේ.

**32 වන රීතිය - කාලාවරෝධය**

(අ) යම් නඩු නිමිත්තක් සම්බන්ධයෙන් කාලසීමාව ගණනය කිරීමේ දී -

(i) නඩු නිමිත්තක් උපචිත වාණිජ ආරවුල සමථකරණයෙන් විසඳීම පිණිස මධ්‍යස්ථානයට ඉල්ලීමක් යොමු කළ දින ආරම්භ වී,

(ii) එකී වාණිජ ආරවුලට අදාල සමථකරණ ක්‍රියාවලිය අවසාන කරන දිනෙන් අවසන් වන,

කාලසීමාව යම් වෙනත් නීතියක් මගින් ඊට පටහැනිව කුමක් සඳහන් වුව ද, පාර්ශ්වකරුවන් අතර ගිවිසුමක් අවසන් කිරීමක් නොතකා, නොසැළකිය යුතුය.

(ආ) යම් අධිකරණයක පවරන නඩු කටයුත්තක දී, ඒ නඩුකරයට පාදක වන නඩු නිමිත්ත කාලාවරෝධ වන බවට ගැටළුවක් උද්ගත වූ විටක දී,

(i) ඒ නඩු නිමිත්ත සංයුක්ත ආරවුල සමථකරණයෙන් විසඳීම සඳහා සමථකරුවාට හෝ නිසි මධ්‍යස්ථානයට නඩුකරය හෝ නඩු කටයුතු ලැබුණු බවට,

(ii) ඒ ආරවුල විසඳීම සඳහා වන නඩු කටයුතු පාර්ශ්වකරුවන් අතර එකගතාවයෙන් අවසන් කිරීමකින් නොතකා, අවසන් කරන ලද බවට,

පිළිවෙලින් දින සඳහන් කරමින් සමථකරු විසින් අත්සන් තබන සහතිකයක් ඒ අත්සන ඔප්පු කිරීමකින් තොරව සාක්ෂි වල දී ආවේශ්‍ය විය යුතු අතර, ඒ සහතිකයේ සඳහන් කරුණුවලට සාක්ෂි විය යුතුය.

ඇමුණුම

<u>ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථාන පනත.</u>

**............... අංක ................. දරන ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථාන පනත**

**වාණිජ ආරවුල් විසඳීම පිණිස සමථකරණය භාවිත කිරීමට පහසුකම් සැලසීම සඳහා ද, සමථකරණ කටයුතු පවත්වාගෙන යාම සඳහා ද, ඒ හා සම්බන්ධ සහ ඊට ආනුෂංගික කරුණු සඳහා ද, විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ.

**ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.**

1. මෙම පනත 2013 අංක ............... දරන ශ්‍රී ලංකා සිවිල් හා වාණිජ සමථ මධ්‍යස්ථාන පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් ආමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක දී එය ක්‍රියාත්මක විය යුතුය. (මෙහි මින්මතු ඇතැම් තැනක **ක්‍රියාත්මක වීමේ දිනය** වශයෙන් හඳුන්වනු ලබන.)

**1 වන කොටස**

**පූර්විකාව**

**පරමාර්ථය**

2. මෙම පනතේ පරමාර්ථය වන්නේ අධිකරණයේ නඩු පැවරීමකින් තොරව වාණිජ ආරවුල් විසඳීම පිණිස සමථකරණය භාවිත කිරීමට පහසුකම් සැලැස්වීමයි.

**අදාල කරගැනීම.**

**3** (1) මෙම පනතේ විධිවිධාන ............. වන වගන්තියේ විධිවිධානවලට යටත්ව ක්‍රියාත්මක වීමේ දිනයට පෙර හෝ පසුව ඒ සමථකරණ කටයුතු සම්බන්ධයෙන් ගිවිසුමකට එළඹී තිබුණ ද, නොතිබුණ ද, ක්‍රියාත්මක වීමේ දිනයට පසුව ශ්‍රී ලංකාව තුළ ආරම්භ වන සියලූ ම වාණිජ සමථකරණ කටයුතුවලට අදාල කරගත යුතුය.

(2) මෙම පනත, මෙම පනත ක්‍රියාත්මක වන දිනට හෝ පසුව වාණිජ සමථකරණය ආරම්භ වන විටක දී, සමථකරණය මගින් විසඳීම සඳහා ගිවිසුම්ගතව හෝ අන්‍යාකාරයෙන් වාණිජ ආරවුල් සම්බන්ධයෙන් පාර්ශ්වකරුවන් අතර උද්ගත විය හැකි සියලූ ම හෝ යම් කවර ම වූ ආරවුල් සඳහා අදාල කරගනු ලැබේ.

(3) රජය සමථකරණය සඳහා වගන්තියක් ඇතුළත් යම් කවර ම වූ සමථ ගිවිසුමක හෝ ආරවුල සමථකරණය සඳහා යොමු කිරීමට පාර්ශ්වකරුවන් විසින් එකග වී ඇති වෙන් වූ ගිවිසුමක පාර්ශ්වකරුවන් වන විටක ද, රජය මෙම ගිවිසුමේ විධිවිධාන මගින් බැඳී සිටියි.

(4) මෙම ගිවිසුම -

(අ) සාමූහික ගිවිසුමක් සකස් කිරීම යටතේ හෝ සම්බන්ධයෙන් වන සමථකරණයක් සඳහා ;

(ආ) සමථකරුවකු වශයෙන් තනි පුද්ගලයෙකු සමග සමථකරණය පවත්වන පරිගණකගත හෝ වෙනත් ආකාරයේ සමථකරණයක් සඳහා ;

(ඇ) නඩු කටයුතුවල විෂය පථය වන වාණිජ ආරවුලක් විසදීම ප්‍රවර්ධනය කිරීම පිණිස අධිකරණමය හෝ බේරුම්කාර නීති කෘත්‍යයක දී, විනිශ්චයකාරවරයෙකු හෝ බේරුම්කරුවකු විසින් ගන්නා ක්‍රියාමාර්ග සඳහා ;

(ඈ) සිවිල් නඩු කාර්ය පටිපාටියේ විධිවිධානවල දී කාර්යපටිපාටිය නියම කරන සමථකරණයක් සඳහා ;

(ඉ) පළමු උපලේඛනයේ සඳහන් නඩු නිමිත්තක් වන අධිකරණයක දී නඩුනිමිත්තකට තුඩුදෙන ආරවුලක් සඳහා ;

(ඊ) වාණිජ ආරවුල -

(අ) යම් වෙනත් පනතක නියමයන් හෝ යම් වෙනත් පනතකින් කරන රෙගුලාසියක් සමග මෙම පනත ගැටෙන හෝ අනනකුල වන විටක ද,

(ආ) මෙම පනත අදාල කර ගැනීම යම් වෙනත් පනතකින් කරන යම් රෙගුලාසියක් මගින් බැහැර කරන හෝ වෙනස් කරන විටක දී,

ඒ වාණිජ ආරවුල සම්බන්ධ සමථකරණයක් සඳහා ;

(උ) 1988 අංක 72 දරන ප්‍රජා සමථ මධ්‍යස්ථාන පනත යටතේ ප්‍රජා සමථ මණ්ඩලයට යොමු කර ඇති යම් ආරවුලක් සඳහා ;

(ඌ) සේවක ආරවුල් හෝ පවුල් ආරවුල් සඳහා ;

අදාල කර නොගත යුතුය.

**අර්ථ නිරූපණය.**

4. මෙම පනතේ කාර්ය සඳහා -

**වාණිජ ආරවුල්** යන්නෙන් භාණ්ඩ හෝ සේවා සැපයීම හෝ හුවමාරු කර ගැනීම සඳහා වෙළඳ ගණුදෙනු, බෙදාහැරීමේ ගිවිසුම්, වාණිජ නියෝජනය හෝ නියෝජිතායතනය, කොමිස් වෙළදාම, කල්බදු, ගොඩනැගිලි ඉදිකිරීම් වැඩ, උපදේශන සේවා, ඉංජිනේරුමය වැඩ, බලපත්‍ර ලබාදීම, ආයෝජන, මූදල්, බැංකු කටයුතු, බුද්ධිමය දේපළ අයිතිවාසිකම්, රක්ෂණ කටයුතු, උපයෝජන ගිවිසුම් සහ සහන, සමාගම් ආරවුල්, බද්ධ ව්‍යාපාර, වෙනත් යම් කවර ම වූ ආකාරයේ කාර්මික හෝ ව්‍යාපාර සහයෝගීතාවන් හෝ භාණ්ඩ සහ සේවා ප්‍රවාහනය වැනි ගිවිසුම්ගත හෝ ගිවිසුම්ගත නොවන වාණිජ මුහුණුවරක් සහ ස්වභාවයක් ගන්නා කාරණාවන් සම්බන්ධයෙන් පාර්ශ්වකරුවන් අතර හටගන්නා ආරවුල් අදහස් වේ.

සමථකරණය යන්නෙන් සහයෝගී ක්‍රියාවලියක් අදහස් වන අතර, එහි දී -

(අ) වාණිජ ආරවුලේ පාර්ශ්වකරුවන්ගේ ආරවුල සම්බන්ධයෙන් සමථකරණයකට එළඹීම පිණිස එකී පාර්ශ්වකරුවන් විසින් ගන්නා උත්සාහයක දී ඒ පාර්ශ්වකරුවන්ට සහාය ලබාදීමට සමථකරුවකු වශයෙන් හඳුන්වනු ලබන මධ්‍යස්ථ තැනැත්තෙකුට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට වාණිජ ආරවුලෙන් එකඟවන අතර,

(ආ) පාර්ශ්වකරුවන්ගේ ආරවුල සම්බන්ධයෙන් විසඳුමක් පැනවීමට සමථකරුට බලයක් නොමැත.

**II වනකොටස.**

**ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය**

**ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය පිහිටුවීම**

**6** (1) ( මෙහි මින් මතු **මධ්‍යස්ථානය** යනුවෙන් සඳහන් කරනු ලබන, ) ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය වශයෙන් හඳුන්වනු ලබන්නා වූ මධ්‍යස්ථානයක් පිහිටුවනු ලැබිය යුතුය.

**(2)** මධ්‍යස්ථානය, (1) වන උපවගන්තියෙන් ඊට දී ඇති නාමයෙන් අවිච්ජින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් එය විසින් නඩු පැවරීම ද, එයට විරුද්ධ ව නඩු පවරනු ලැබීම ද කරනු ලැබිය හැකිය.

**(3)** මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යාලය කොළඹ පිහිටා තිබිය යුතුය. මධ්‍යස්ථානයේ කළමනාකරණ මණ්ඩලය විසින් සුදුසු යයි තීරණය කරනු ලැබිය හැකි ශාඛා කාර්යාල සංඛ්‍යාවක් ශ්‍රී ලංකාව තුළ කොළඹින් පිට ස්ථානවල පිහිටුවනු ලැබිය හැකිය.

**මධ්‍යස්ථානයේ කර්තව්‍ය**

7. පහත සඳහන් කර්තව්‍ය මධ්‍යස්ථානයේ කර්තව්‍ය වන්නේය.

(අ) වාණිජ ආරවුල් විසඳීම හා බේරුම් කිරීම සඳහා සමථ කිරීම හා සමගි කිරීම පුළුල් ලෙස පිළිගැනීම සහ ප්‍රවර්ධනය කිරීම ;

(ආ) සමථ කිරීම සහ සමගි කිරීම මගින් වාණිජ ආරවුල් විසදා ගැනීම සඳහා පාර්ශ්වයන් දිරි ගැන්වීම ;

(ඇ) සමථ කිරීම සහ සමගි කිරීම මගින්. -

(i) වාණිජ ආරවුල් බේරුම් කිරීම;

(ii) වාණිජ කාරණාවල දී පාර්ශ්වකරුවන් අතර පැන නගින මත භේදයන් තුරන් කිරීම සඳහා නඩු කටයුතු පැවැත්වීම සහ එහිලා පහසුකම් සැලසීම ;

**මධ්‍යස්ථානයේ බලතල.**

8. මධ්‍යස්ථානයට පහත සඳහන් බලතල ඇත්තේය.

(අ) යම් නිශ්චල හා චංචල යන දෙවර්ගයේ ම දේපළ අත්කර ගැනීම හා දැරීම සහ ඒ දේපළ ඔඩපනය කිරීම හෝ විකිණීම, උකස් කිරීම, බදුදීම හෝ කුලියට දීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

(ආ) ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත සිටින තැනැත්තන්ගෙන් හෝ පුද්ගල මණ්ඩලවලින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග භාරගැනීම ;

(ඇ) මධ්‍යස්ථානයේ කර්තව්‍ය ඉටුකිරීමේ කාර්ය සඳහා අවශ්‍ය සියලු කොන්ත්‍රාත්තුවලට සහ ගිවිසුම්වලට ඇතුළත් වී ඒවා ක්‍රියාත්මක කිරීම ;

(ඈ) ස්වකීය කර්තව්‍ය ඉටුකිරීම සඳහා අවශ්‍ය විය හැකි නිලධරයන් සහ සේවකයන් පත්කිරීම සහ එකී නිලධරයන් සහ සේවකයන් විෂයෙහි විනය පාලනය කිරීම සහ ඔවුන් සේවයෙන් පහ කිරීම ;

(ඉ) එම නිලධරයන් හා සේවකයන්හට ගෙවිය යුතු පාරිශ්‍රමික හා ඔවුන්ගේ සේවා කොන්දේසි සහ නියමයන් නිශ්චය කිරීම ;

(ඊ) මධ්‍යස්ථානය විසින් සපයනු ලබන සේවා සහ පහසුකම් සඳහා ගාස්තු අයකිරීම ;

(උ) ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ මුදල් උපයා ගැනීම ;

(ඌ) බැංකු ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යාම සහ වසා දැමීම ;

(එ) ස්වකීය කර්තව්‍ය ඉටු කිරීම සඳහා පුහුණු පාඨමාලා සහ වැඩමුළු පැවත්වීම ;

(ඒ) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකගත්වය ඇතිව අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබිය හැකි සුරැකුම්පත්වල ප්‍රයෝජනයට නොගත් මුදල් ආයෝජනය කිරීම ; සහ

(ඔ) ස්වකීය කර්තව්‍ය නිසි පරිදි ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි හෝ ආනුෂංගික වන වෙනත් සියලු ක්‍රියා කිරීම ;

**කළමනාකරණ මණ්ඩලය.**

9. (1) මධ්‍යස්ථානයේ කටයුතු පරිපාලනය සහ කළමණාකරණය කිරීම අමාත්‍යාවරයා විසින් පත් කරනු ලබන ඉහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත වන්නා වූ (මෙහි මින් මතු මණ්ඩලය යනුවෙන් සඳහන් කරනු ලබන, ) කළමනාකරණ මණ්ඩලයක් වෙත පවරනු ලැබිය යුතුය.

(අ) (289 වන අධිකාරය වූ ) වාණිජ මණ්ඩල ආඥාපනත මගින් සංස්ථාපනය කරනු ලැබූ, ලංකා වාණිජ මණ්ඩලය විසින් නම් කරන ලද එක් සාමාජිකයකු ;

(ආ) ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය විසින් නම් කරනු ලබන එක් සාමාජිකයකු ;

(ඇ) ශ්‍රී ලංකා වාණිජ සහ කර්මාන්ත මණ්ඩල සම්මේලනය විසින් නම් කරනු ලබන එක් සාමාජිකයකු ;

(ඈ) 1969 අංක 10 දරන ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලය විසින් සංස්ථාගත කරනු ලැබූ, ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලය විසින් නම් කරනු ලබන එක් සාමාජිකයෙකු ;

(ඉ) අධිකරණ විෂයය භාර අමාත්‍යාවරයා විසින් නම් කරනු ලබන එක් සාමාජිකයකු ;

(2) තත්කාර්යය සඳහා අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් මණ්ඩලයේ සාමාජිකයෙකුට කවර හෝ අවස්ථාවක ධුරයෙන් ඉල්ලා අස්විය හැකිය.

(3) අමාත්‍යවරයා විසින් හේතු දක්වා මණ්ඩලයේ සාමාජිකයකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකිය.

(4) මණ්ඩලයේ සාමාජිකයකු මියගිය විටක, ඉල්ලා අස්වූ විටක හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබූ අවස්ථාවක, අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් ඔහු හෝ ඇය වෙනුවට වෙනත් සාමාජිකයෙකු පත් කරනු ලැබිය හැකිය. එසේ පත් කරනු ලබන සාමාජිකයා ඔහු හෝ ඇය කලින් මිය ගියහොත්, ධුරයෙන් ඉල්ලා අස්වුවහොත් හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, ඔහු හෝ ඇය අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති මුළු කාලය සඳහා ධුරය දැරිය යුතුය.

(5) (2) වන, (3) වන හා 4 වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, මණ්ඩලයේ සාමාජිකයකුගේ ධුර කාලය අවුරුදු **3** ක් විය යුතුය.

(6) කාලය ඉකුත් වීම නිසා ධුරය හිස් කරනු ලබන සාමාජිකයකු නැවත පත් කිරීම සඳහා සුදුසුකම් ලබන්නේය.

(7) 7 වන උපවගන්තියේ සඳහන් කර ඇති පරිදි වාණිජ නියෝජනයන් මණ්ඩලයේ නියෝජනය කිරීම පිණිස එකී 1 වන උපවගන්තියේ (අ), (ඇ) සහ (ඈ) ජේද යටතේ කළමනාකරණ මණ්ඩලයට පත්

කරන සාමාජිකයෙකු, ඔහු නියෝජනය කරන වාණිජ මණ්ඩලයේ සාමාජිකයෙකු වීම නතර වන විටක දී, කලමනාකරණ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීම නතර විය යුතුය.

**කලමනාකරණ මණ්ඩලයේ සභාපතිවරයා**

10 (1) මණ්ඩලයේ සාමාජිකයන් විසින් ඔවුන් අතරින් මණ්ඩලයේ සභාපතිවරයා තෝරාගත යුතුය.

(2) (මෙහි මින් මතු **සභාපතිවරයා** යනුවෙන් සඳහන් කරනු ලබන.) මණ්ඩලයේ සභාපතිවරයා විසින් තත්කාර්ය සඳහා මණ්ඩලය අමතා යවනු ලබන ලිපියක් මගින් සභාපති ධුරයෙන් ඉල්ලා අස්විය හැකිය.

(3) මණ්ඩලය විසින්, මණ්ඩලයේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් 1/2 කට නොඅඩු සාමාජික සංඛ්‍යාවක් විසින් සහයෝගය දෙනු ලබන යෝජනා සම්මතයක් මගින්, සභාපතිවරයා සභාපති ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකිය.

(4) (2) වන හා (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව සභාපතිවරයාගේ ධුරය කාලය ඔහු මණ්ඩලයේ සාමාජිකත්වය දරන කාලසීමාව විය යුත්තේය.

**මණ්ඩලයේ රැස්වීම්**

11 (1) මණ්ඩලයේ රැස්වීමක දී සභාපතිවරයා පැමිණ සිටි වේලාවේ, ඔහු හෝ ඇය එහි මූලසුන දැරිය යුතුය. මණ්ඩලයේ යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොසිටි විට, පැමිණ සිටින සාමාජිකයන් විසින් ඔවුන් අතරින් සභාපතිවරයකු එම රැස්වීම සඳහා තෝරා පත් කරගත යුතුය.

(2) මණ්ඩලයේ රැස්වීමක් සඳහා ගණපූරණය තිදෙනකු විය යුතුය.

(3) මණ්ඩලයේ රැස්වීමක දී තීරණය කරනු ලැබීමට ඇති යම් කාරණයක් පිළිබඳව ඡන්ද සමානව ඇති අවස්ථාවක දී, සභාපතිවරයාට හෝ ඒ රැස්වීමේ මූලසුන දරන සාමාජිකයාට ඔහුගේ හෝ ඇයගේ ඡන්දයට අතිරේකව තීරක ඡන්දයක් තිබිය යුතුය.

(4) මේ වගන්තියේ ඉහතින් ම වූ විධිවිධානවලට යටත්ව මණ්ඩලයේ රැස්වීම් පැවැත්වීම සම්බන්ධයෙන් හා එම රැස්වීම්වල කටයුතු කරගෙන යාම සම්බන්ධයෙන් අනුගමනය කළයුතු කාර්ය පටිපාටිය මණ්ඩලය විසින් විධිමත් කරගනු ලැබිය හැකිය.

**මධ්‍යස්ථානයේ මුද්‍රාව.**

12 (1) මධ්‍යස්ථානයේ මුද්‍රාව සභාපතිවරයාගේ හෝ සභාපතිවරයා විසින් බලය පවරනු ලබන මධ්‍යස්ථානයේ යම් නිලධරයකු භාරයේ තිබිය යුතුය.

(2) මධ්‍යස්ථානයේ මුද්‍රාව, මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි වෙනස් කරනු ලැබිය හැකිය.

(3) මධ්‍යස්ථානයේ මුද්‍රාව, මණ්ඩලයේ අවසරය ඇතිව මිස සහ මණ්ඩලයේ සභාපතිවරයා හෝ තත්කාර්ය සඳහා මණ්ඩලය විසින් බලය පවරන ලද මණ්ඩලයේ සාමාජිකයකු ඉදිරියේ දී හැර කිසිදු සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු අතර, ඔහු හෝ ඇය තමන් පැමිණ සිටින බවට සලකුණක් ලෙස ඒ ලේඛනයේ තම නම යොදා අත්සන් කළයුතුය.

## II වන කොටස

## මුදල්

### මධ්‍යස්ථානයේ අරමුදල

13. (1) මධ්‍යස්ථානයට ඊට ම අයත් අරමුදලක් තිබිය යුතුය.

(2) මධ්‍යස්ථානයේ අරමුදලට පහත සඳහන් මුදල් ගෙවනු ලැබිය යුතුය.

(අ) මධ්‍යස්ථානයේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලැබිය හැකි සියලු ම මුදල් ;

(ආ) මේ පනත යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී, කර්තව්‍ය කිරීමේ දී සහ කාර්ය ඉටු කිරීමේ දී, මධ්‍යස්ථානය වෙත ලැබෙන සියලු ම මුදල් ;

(ඇ) ණය, පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් දේශීය හෝ විදේශීය ප්‍රභවයන්ගෙන් ලැබෙන සියලු ම මුදල් ;

(3) මධ්‍යස්ථානයේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී මණ්ඩලය විසින් දරන ලද යම් වියදමක් පියවීම සඳහා අවශ්‍ය විය හැකි සියලු ම මුදල්, මධ්‍යස්ථානයේ අරමුදලින් ගෙවනු ලැබිය හැකිය.

### ගිණුම් විගණනය

14 (1) මධ්‍යස්ථානයේ ආදායම සහ වියදම, වත්කම් හා බැරකම් සහ වෙනත් සියලු ම ගණුදෙනු සම්බන්ධයෙන් නිසි ගිණුම් තැබීමට මණ්ඩලය විසින් කටයුතු සැලැස්විය යුතුය.

(2) මධ්‍යස්ථානයේ ගිණුම් විගණනය සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන අදාළ විය යුතුය.

## III වන කොටස

## පොදු විධිවිධාන

### රීති

15. (1) මේ පනතේ ප්‍රතිපත්ති සහ විධිවිධාන බලාත්මක කිරීමේ කාර්ය සඳහා මණ්ඩලය විසින් රීති සාදනු ලැබිය හැකිය.

(2) (1) වන උපවගන්තිය මගින් මණ්ඩලය වෙත පවරා ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව මණ්ඩලය විසින් පහත දැක්වෙන සියලු ම කරුණු හෝ ඉන් යම් කවර ම වූ කරුණක් සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකිය.

(අ) සමථ කිරීම සහ සමගි කිරීම මගින් වාණිජ ආරවුල් විසදීම සඳහා මධ්‍යස්ථානය වෙත ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කිරීමේ ආකෘතිය සහ ආකාරය ;

(ආ) සමථ කිරීම සහ සමගි කිරීම මගින් වාණිජ ආරවුල් විසදීම සඳහා අනුගමනය කළයුතු කාර්ය පටිපාටිය ;

(ඇ) සමථ කිරීම සහ සමගි කිරීම මගින් වාණිජ ආරවුල් විසදීම සඳහා පත් කරනු ලබන සමථකරුවන් සඳහා වූ චර්යා පද්ධතිය ;

(ඈ) සමථ කිරීම සහ සමගි කිරීම මගින් වාණජ ආරවුල් විසදීම සඳහා වූ නඩු කටයුතු සම්බන්ධයෙන් ගෙවිය යුතු ගාස්තු ;

(3) මේ වගන්තිය යටතේ සාදන ලද රීතියක්, අමාත්‍යාවරයා අනුමත කොට එකී අනුමත කිරීම පිළිබඳ දැන්වීම ගැසට් පත්‍රයේ පළ කරන තුරු බලාත්මක නොවිය යුතුය.

## ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව

16 (1) මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත, මණ්ඩලයේ යම් සාමාජිකයකු හෝ මධ්‍යස්ථානයේ නිලධරයකු, සේවකයකු විසින් සද්භාවයෙන් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් මණ්ඩලයේ ඒ සාමාජිකයාට හෝ මධ්‍යස්ථානයේ ඒ සාමාජිකයාට හෝ ඒ සේවකයාට විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නඩු පවරනු නොලැබිය යුතුය.

(2) මධ්‍යස්ථානයට විරුද්ධව යම් අධිකරණයක් ඉදිරියේ පවරනු ලබන සිවිල් හෝ අපරාධ නඩුවක දී මධ්‍යස්ථානය විසින් දරන යම් වියදමක් මධ්‍යස්ථානයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතුය. එවැනි සිවිල් හෝ අපරාධ නඩුවක දී මධ්‍යස්ථානයට ගෙවනු ලැබූ හෝ මධ්‍යස්ථානය විසින් අයකර ගනු ලැබූ යම් ගාස්තු මධ්‍යස්ථානයේ අරමුදලට බැර කරනු ලැබිය යුතුය.

(3) 1 වන උපවගන්තියේ සඳහන් පරිදි එවැනි යම් සාමාජිකයෙකු විසින් මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය යටතේ කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ තැනැත්තාට එරෙහිව යම් අධිකරණයක් ඉදිරියේ දී පවරන ලද සිවිල් හෝ අපරාධ නඩුවක දී ඒ තැනැත්තා විසින් දරන ලද යම් වියදමක් සද්භාවයෙන් කරන ලදැයි අධිකරණය විසින් තීරණය කරන්නේ නම්, ඒ වියදම ඔහු විසින් ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී දරනු ලැබුවේ නම් මිස, මධ්‍යස්ථානයේ අරමුදලින් ගෙවනු නොලැබිය යුතුය.

**දණ්ඩ නීති සංග්‍රහයේ කාර්ය සඳහා**
**මණ්ඩලයේ සියලු ම සාමාජිකයන් සහ මධ්‍යස්ථානයේ නිලධරයන් සහ සේවකයන්**
**රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු බව.**

**17** මණ්ඩලයේ සියලු ම සාමාජිකයන් සහ මධ්‍යස්ථානයේ නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථය සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සැලකිය යුතුය.

**මධ්‍යස්ථානය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත**
**ආයතනයක් ලෙස සැලකිය යුතු බව**

**18** මධ්‍යස්ථානය, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතුය.

**IV වන කොටස.**
**සමථ ගිවිසුම**

**19.** (1) ගිවිසුම්ගත හෝ අන්‍යාකාරයෙන් වන අර්ථ නිරූපණය කරන නෛතික සම්බන්ධතාවයක් සම්බන්ධයෙන් පාර්ශ්වකරුවන් අතර පැන නැගිය හැකි සියලු ම හෝ යම් කවර ම වූ වාණිජ ආරවුල් සමථකරණය මගින් විසඳීම පිණිස පාර්ශ්වකරුවන් එකඟ වන, සමථකරණ වගන්තියකින් හෝ වෙන් වූ ගිවිසුමකින් සමථකරණ ගිවිසුමක් සකස් විය හැකිය.

(2) සමථකරණ ගිවිසුමක් ලියවිල්ලකින් විය යුතුය. සමථකරණ ගිවිසුමක පාර්ශ්වකරුවන් විසින් අත්සන් තබන ලේඛනයක් අඩංගු වන විටක දී, හෝ එකඟතාවක් පිළිබඳ වාර්තාවක් සපයන ලිපි, ටෙලෙක්ස්, ටෙලිග්‍රෑම්, ඊමේල් හෝ වෙනත් සන්නිවේදන මාධ්‍යයක් හුවමාරු වන විටක දී, ගිවිසුමක් ලියවිල්ලකින් සංයුක්ත වන බවට සැලකිය යුතුය.

**ආරවුලක් සමථකරණයෙන් විසඳීම**

**20** සමථකරණ ගිවිසුමක් යටතේ සමථකරණයට යොමු කිරීමට පාර්ශ්වකරුවන් එකඟ වී ඇති යම් ආරවුලක්, සමථකරණ ගිවිසුමකට එළඹී ඇති ඒ කාරණය රාජ්‍ය ප්‍රතිපත්තියට පටහැනි වන්නේ නම් හෝ සමථකරණයෙන් විසඳීමට නොහැකි වන්නේ නම් මිස සමථකරණයෙන් විසඳීම කළ හැකිය.

යම් තාවකාලික ප්‍රතිකර්මයක් ප්‍රදානය කිරීමට සම්බන්ධ නඩුකර හැර, කිසිදු නඩුකරයක් නිරවුල් නොකිරීමේ සහතිකයක් ඉදිරිපත් කිරීමකින් තොරව පැවරිය නොහැකිය.

**21** (1) මෙම පනත යටතේ යම් කවර ම වූ ආරවුලක් සමථකරණයෙන් විසඳීම පිණිස යොමු කිරීමට යම් සමථකරණ ගිවිසුමක් යටතේ පාර්ශ්වකරුවන් එකඟ වී ඇති විටක දී, යම් කවර ම වූ වෙනත් ලිඛිත නීතියක ඊට පටහැනිව කුමක් සඳහන් වුව ද, නිරවුල් නොකිරීමේ සහතිකයක් සමඟ ඉදිරිපත්

නොකරන්නේ නම් මිස, යම් වාණිජ ආරවුලක් සම්බන්ධ නඩු කටයුතු අධිකරණයේ පැවරීම හෝ අධිකරණය විසින් භාර ගැනීම නොකළ යුතුය.

(2) (1) වන වගන්තියේ විධිවිධාන, සිවිල් නඩු විධාන සංග්‍රහයේ 5 වන කොටස යටතේ යම් කවර ම වූ තාවකාලික ප්‍රතිකර්මයක් සහ යම් එවැනි කාරණයක් සම්බන්ධයෙන් යම් නඩුකරයක් යම් පාර්ශ්වකරුවකු සම්බන්ධයෙන් අධිකරණයක් විසින් භාරගෙන තීරණය කිරීම එවැනි තාවකාලික ප්‍රතිකර්මයක් හා සම්බන්ධ වන තෙක් පමණක් අදාල කර නොගත යුතුය.

**අධිකරණ නඩු කටයුතු ආරම්භ කිරීමෙන් සමථකරණය අවසන් නොවීම.**

**(3)**අධිකරණ නඩු කටයුතුවල පරමාර්ථය සිවිල් නඩු විධාන සංග්‍රහයේ 5 වන කොටස යටතේ යම් කවර ම වූ තාවකාලික ප්‍රතිකර්මයක් සම්බන්ධයෙන් පමණක් සහන අපේක්ෂා කිරීමක් වන විටක දී, අධිකරණ නඩු කටයුතු ආරම්භ කිරීමක්, වාණිජ ආරවුල සමථ කිරීම පිණිස වන ගිවිසුම අවසන් කිරීමක් වශයෙන් හෝ සමථකරණය අවසන් කිරීමක් වශයෙන් සලකනු නොලැබිය යුතුය.

**අධිකරණය විසින් යොමු කිරීම**

22 (1) ගිවිසුම්ගත හෝ අන්‍යාකාරයෙන් වාණිජ ආරවුලක් සම්බන්ධයෙන් සිවිල් නඩුකරයක් පවරනු ලැබූ අවස්ථාවක දී, අධිකරණය විසින් පාර්ශ්වකරුවන්ගේ ලිඛිත කැමැත්ත ඇතිව, ඒ ආරවුල සමථකරණයෙන් නිරවුල් කිරීම පිණිස වාණිජ සමථ මධ්‍යස්ථානය වෙත යොමු කළ යුතුය.

(2) මෙම පනත යටතේ සමථකරණයට යොමු කිරීමට තිබෙන සහ නඩු කටයුතු ආරම්භ කර ඇති නඩු කටයුතු සම්බන්ධ ආරවුලක පාර්ශ්වකරුවකුට, ඒ නඩු කටයුතු පිළිබඳව ඒ අනෙක් පාර්ශ්වයට දැන්වීමක් භාර දීමෙන් පසුව, සමථකරණයෙන් නිරවුල් කරන තෙක් නඩු කටයුතු නතර කරවා ගැනීම පිණිස අදාල අධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකිය.

(3) ආරවුල් විසඳා ගැනීම පිණිස සමථකරණය භාවිතා කරන ලෙස අධිකරණය විසින් පාර්ශ්වකරුවන් වෙත නියම කළ අවස්ථාවක දී, අධිකරණය විසින් නඩු කටයුතු කල් තැබිය හැකි අතර, අධිකරණය විසින් සමථකරණය ඵලදායි ලෙස භාවිත කිරීමට පහසුකම් සැලැස්වීම පිණිස සුදුසු යයි සලකන එවැනි වෙනත් සහ තවදුරටත් නියෝග සිදු කළ හැකිය.

**V වන කොටස.**

**සමථ කටයුතු පැවැත්වීම**

**සමථකරණය ආරම්භ කිරීම**

**23** (1) මෙහි පහත සඳහන් එක් ආකාරයකින් සමථකරණයක් ආරම්භ වේ.

(අ) ගිවිසුමක සමථකරණ වගන්තියක එක් පාර්ශවකරුවෙකු හෝ සියලූ ම පාර්ශ්වකරුවන් ආරවුලක් සමථකරණයට යොමු කරන දිනය :

(ආ) ආරවුල වෙන් වූ ගිවිසුමක් ආකාරයෙන් සමථකරණයට යොමු කිරීමට පාර්ශ්වකරුවන් එකග වන දිනය ;

එසේ වුව ද, සමථකරණයට එලඹෙන ලෙස යම් පාර්ශ්වකරුවෙකු විසින් කරන ආරාධනයේ සඳහන් දිනට දින තිහක් (30ක්) ඇතුළත හෝ ඒ ආරාධනාවේ සඳහන් කාලය ඇතුළත ඒ ආරාධනාව කරන පාර්ශ්වයට ඒ ආරාධනාවට පිළිගැනීමක් නොලැබුණහොත්, ඒ පාර්ශ්වයේ ආරාධනාව ඒ අනෙක් පාර්ශ්වය විසින් ප්‍රතික්ෂේප කර ඇති බවට ඒ ආරාධනාව කරන පාර්ශ්වය විසින් සැලකිය යුතුය.

(ඇ) යම් ආරවුලක පාර්ශ්වයක් විසින් ඒ අනෙක් පාර්ශ්වයට අදාල ආරවුල සමථකරණයට යොමු කිරීම පිළිබඳ ඒ පාර්ශ්වයේ අපේක්ෂාව ඒ අනෙක් පාර්ශ්වයට ලියවිල්ලකින් භාර දිය හැකිය.

(ඈ)පාර්ශ්වකරුවන්ගේ ලිඛිත කැමැත්ත ඇතිව අධිකරණය විසින් ආරවුල සමථ මධ්‍යස්ථානයට යොමු කරන දිනය ;

එසේ වුව ද, මෙම පනත යටතේ සමථකරණයට යොමු කිරීමට තිබෙන සහ නඩු කටයුතු ආරම්භ කර ඇති නඩු කටයුතු සම්බන්ධ ආරවුලක පාර්ශ්වකරුවකුට, ඒ නඩු කටයුතු පිළිබඳව ඒ අනෙක් පාර්ශ්වකරුට දැන්වීමක් භාර දීමෙන් පසුව සමථකරණයෙන් නිරවුල් කරන තෙක් නඩු කටයුතු නතර කරවා ගැනීම පිණිස අදාල අධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකිය.

**අවසන් කිරීම.**

24 (1) සමථකරණය -

(අ) පාර්ශ්වකරුවන් සමථ ගිවිසුමකට එළඹී ඇති දිනයේ දී ;

(ආ) සමථකරණය අවසන් වන බව පාර්ශ්වකරුවන් එක්ව සමථකරුට ප්‍රකාශ කරන දිනයේ දී ;

(ඇ) සමථකරු පාර්ශ්වකරුවන් සමග නිගමනයකට අවතීර්ණ වීමෙන් පසුව සමථකරණය සඳහා වැඩිමනක් ලෙස ගන්නා උත්සාහයන් තවදුරටත් සාධාරණීයකරණය කළ නොහැකි බැවින්, සමථකරණය අවසන් වන බවට ප්‍රකාශ කරන දිනයේ දී ;

(ඈ) සමථකරණය තවදුරටත් පවත්වාගෙන යාමට අවශ්‍ය වන පාර්ශ්වකරුවෙකු සමථකරණය අවසන් වන බවට සමථකරුට සහ වෙනත් පාර්ශ්වකරුවෙකුට හෝ පාර්ශ්වකරුවන්ට ප්‍රකාශ කරන පළමු දිනයේ දී ;

අවසන් කෙරේ.

**සමථකරු පත්කිරීම.**

25 (1) 2 වන උපවගන්තියට යටත්ව පාර්ශ්වකරුවන්ගේ එකගතාව මගින් පත් කරන සමථකරුවෙකු මගින් සමථකරණය පවත්වනු ලැබේ.

(2) පාර්ශ්වකරුවන් විසින් පාර්ශ්වකරුවන්ගේ ලියාපදිංචි සමථකරුවන්ගෙන් සමථකරුවකු නිර්දේශ කිරීම හෝ පත් කිරීම කරන ලෙස මධ්‍යස්ථානයෙන් ඉල්ලා සිටිය හැකි අතර, මධ්‍යස්ථානය විසින් එපරිදි පත් කරන සමථකරුවකු ඔවුන්ගේ පක්ෂපාතිත්වය සහ ස්වාධීනත්වය පිළිබඳව සාධාරණ සැකයක් ඇති වීමට තුඩු දිය හැකි හේතු ප්‍රමාදයකින් තොරව අනාවරණය කළ යුතුය.

(3) සමථකරණයේ නිරත වීම සඳහා සමථකරුට සාධාරණ ගාස්තුවකට සහ සාධාරණ වියදමකට හිමිකම් පැවතිය යුතු අතර, ආරවුල සමථකරණයෙන් විසඳීමට යොමු කළ පාර්ශ්වකරුවන් විසින් සමථකරුගේ ගාස්තු සහ වියදම් එක්ව සහ වෙන් වෙන්ව ගෙවීමට නිත්‍යානුකූලව බැඳී සිටිය යුතුය.

**සමථකරණය පැවැත්වීම**

26 (1) සමථකරණය ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ආකාරය පිළිබඳව එකග වීමට පාර්ශ්වකරුවන්ට නිදහස තිබෙන අතර, පවත්නා රීති සමුදාය අනුගමනය කිරීමට එකග විය හැකිය.

(2) සමථකරණය ක්‍රියාත්මක කළ යුතු ආකාරය පිළිබඳව පාර්ශ්වකරුවන් එකග වී නොමැති ප්‍රමාණයකට, සමථකරු පාර්ශ්වකරුවන් විසින් ඉදිරිපත් කරන ඉල්ලීම් සහ අප්‍රමාද විසඳුමක් සඳහා අවශ්‍යතාව ඇතුළුව සමථකරණයේ අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගනිමින් සමථකරු සුදුසු යයි සලකන පරිදි සමථකරණය පැවැත්විය හැකිය.

(3) සමථකරුට පාර්ශ්වකරුවන් එක්ව හෝ වෙන් වෙන්ව හමු වීම හෝ අදහස් හුවමාරු කර ගැනීම කළ හැකිය.

(4) සමථකරු සමථකරණයේ අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගනිමින් සමථකරණය පුරාම පාර්ශ්වකරුවන්ට සාධාරණ සැලකිල්ල දැක්විය යුතු අතර, සමථකරණයක පාර්ශ්වකරුවන්ට මෙම රීති බැහැර කිරීම හෝ වෙනස් කිරීම කළ නොහැකිය.

**කරුණු දැක්වීම.**

(5) මෙම පනත යටතේ යම් සමථකරණයක දී, යම් කාරණයක යම් කවර ම වූ ආරවුල්කරුවෙකු වෙනුවෙන් පෙනී සිටීමට නීතිඥවරයෙකුට හෝ නියෝජිතයකුට හෝ වෙනත් තැනැත්තකුට හිමිකම තිබිය යුතුය.

**අනාවරණය කිරීමේ වගකීම**

27 (1) සමථකරුවකු වශයෙන් පත් කරන තැනැත්තකු -

(අ) ඔහුට / ඇයට වර්තමානයේ හෝ පැන නැගිය හැකි මත ගැටුමක් තිබෙන අවස්ථාවක දී, හෝ සාධාරණ වශයෙන් සැක කරන අභිනතියකට තුඩු දිය හැකි අවස්ථානුගත තත්වයක් පවතින විටක දී, තීරණයක් කිරීම පිණිස ප්‍රමාණවත් විමසීම් සිදු කිරීම; සහ

(ආ) එවැනි මත ගැටුම් හෝ අවස්ථානුගත කරුණු ප්‍රමාදයකින් තොරව අනාවරණය කිරීම :

කළ යුතුය.

**සමථකරණයේ දී එක සමාන වගකීම නොකඩවා පැවතීම**

(3) 2 (ආ) වගන්තිය යටතේ අනාවරණය කරන සමථකරුවකුගේ වගකීම් සමථකරණය අවසන් වන තෙක් නොකඩවා ම පැවතිය යුතුය.

(4) සමථකරුවකු වශයෙන් ක්‍රියා කිරීමට පෙර හෝ ක්‍රියා කරන අතර තුර 3 (ආ) වගන්තිය යටතේ අනාවරණය කිරීමක් කරන තැනැත්තකු කරුණු සහ අවස්ථානුගත හේතු සම්පූර්ණයෙන් ම අනාවරණය කිරීමෙන් පසුව සියලු ම පාර්ශ්වකරුවන්ගේ කැමැත්ත ඇතිව පමණක් සමථකරුවකු වශයෙන් තදනන්තරව කටයුතු කිරීම හෝ අඛණ්ඩව කටයුතු කිරීම කළ හැකිය.

***පැහැදිලි කිරීම.***

(5) මෙම වගන්තියේ කාර්ය සඳහා යම් තැනැත්තකුට -

(අ) සමථකරණයේ ප්‍රතිඵලයක දී මූල්‍ය හෝ පෞද්ගලික සම්බන්ධතාවයක් ඇති අවස්ථාවක දී ;

(ආ) සමථකරණයට සම්බන්ධ පාර්ශ්වයක් සම්බන්ධයෙන් යම් පාර්ශ්වයක් හෝ තැනැත්තකු සමග දැනට හෝ කලින් සම්බන්ධතාවක් ඇති අවස්ථාවක දී ;

සමථකරණයක් සම්බන්ධයෙන් ඒ තැනැත්තාට මත ගැටුමක් ඇති බවට සැලකිය යුතුය.

**එකගතාවයෙන් සමථකරණය පැවැත්වීම**

26 (1) තත්කාර්ය සඳහා යම් වෙනත් පනතක් යටතේ හෝ මෙම පනත හෝ වෙනත් පනතක් යටතේ තහනම් කර ඇත්නම් මිස, සමථකරණය පවත්වන ආකාරය පිළිබඳ පාර්ශ්වකරුවන් සහ සමථකරු එකග විය හැකි අතර, පවතින රීති සහ කාර්ය පටිපාටි සමුදාය අනුගමනය කිරීමට ද එකග විය හැකිය.

(2) සමථකරණය ක්‍රියාත්මක කළ යුතු ආකාරය පිළිබඳව පාර්ශ්වකරුවන් එකග වී නොමැති ප්‍රමාණයකට, සමථකරු පාර්ශ්වකරුවන් විසින් ඉදිරිපත් කරන ඉල්ලීම් සහ අප්‍රමාද විසඳුමක් සඳහා අවශ්‍යතාව ඇතුළුව සමථකරණයේ අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගනිමින් සමථකරු සුදුසු යයි සලකන පරිදි සමථකරණය පැවැත්විය හැකිය.

**සමථකරුගේ බලය**

27 (1) සමථකරුවකු -

(ආ) සමථයකට එළඹීම පිණිස පාර්ශ්වකරුවන් මෙහෙය වීමේ දී, පහසුකම් සලසන්නකු වශයෙන් ක්‍රියා කිරීම ;

(ආ) පාර්ශ්වකරුවන් සමග එක්ව, වෙන් වෙන්ව, හෝ යම් කවර ම වූ ඒකාබද්ධතාවකින් යුක්තව හමු වීම හෝ අදහස් හුවමාරු කර ගැනීම ;

(ඇ) ආරවුල් විසඳීමේ දී සමථකරණයේ යම් කවර ම වූ අදියරයක දී යෝජනා ඉදිරිපත් කිරීම ;

කළ හැකිය.

(2) සමථකරුවකුට -

(අ) සමථකරණයේ ප්‍රතිඵලය, සමථකරණයේ යම් කවර ම වූ අදියරයක දී තීරණය කිරීමට බලය නොතිබිය යුතුය.

(ආ) ආරවුලේ අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගනිමින් සමථකරණය පුරාම පාර්ශ්වකරුවන්ට සාධාරණ සැලකිල්ල පවත්වා ගැනීම කළ යුතුය.

**පාර්ශ්වකරුවන් අතර තොරතුරු අනාවරණය කිරීම**

28. (1) සමථකරණය සම්බන්ධයෙන් සමථකරුට වෙනත් පාර්ශ්වයකින් ලැබෙන යම් කවර ම වූ තොරතුරු, ඒ තොරතුරු අනාවරණය නොකරන ලෙස ඒ වෙනත් පාර්ශ්වය විසින් සමථකරුට ප්‍රකාශිතව ම දැනුම් දීම කර නොමැති නම්, සමථකරු විසින් යම් පාර්ශ්වයකට අනාවරණය කළ හැකිය.

**රහස්‍යභාවය**

(2) ඉදිරිපත් කර ඇති ලේඛන සම්බන්ධයෙන් සහ සමථකරණ සැසිවාර පැවැත්වීමේ දී එළිදරව් වන ලෙස සාකච්ඡා කරන යම් වෙනත් කාරණාවන් සම්බන්ධයෙන් පහත සඳහන් උප වගන්තිවලට යටත්ව රහස්‍යභාවය පවත්වාගෙන යාම ආරවුලක සෑම පාර්ශ්වයක ම සහ සෑම සමථකරුවකුගේ ම වගකීම විය යුතුය.

(3) සමථකරණය සම්බන්ධ තොරතුරු -

(අ) සියලු ම පාර්ශ්වයන් විසින් තොරතුරු අනාවරණය කිරීම සහ තොරතුරු සමථකරුවකු සම්බන්ධයෙන් වන විටක දී, අනාවරණය කිරීමට සමථකරු එකඟ වීම ;

(ආ) අනාවරණය කිරීමට නීතියෙන් නියම කිරීම ;

(ඇ) අනාවරණය කිරීම සමථ ගිවිසුමක් පවත්වාගෙන යාම හෝ බලාත්මක කිරීමේ කාර්ය සඳහා නියම කිරීම ;

(ඈ) අනාවරණය කිරීම, විෂමාචාරය පිළිබඳ හිමිකම් පෑමකට ප්‍රතිචාර දැක්වීම පිණිස නියම කිරීම ;

(ඉ) අනාවරණය කිරීම යම් තැනැත්තකුගේ සෞඛ්‍ය හෝ ආරක්ෂාව සුරක්ෂිත කිරීම පිණිස නියම කිරීම ;

සිදුකර ඇත්නම් මිස, පාර්ශ්වකරුවන්, සමථකරු හා සමථකරණය පැවැත්වීම සම්බන්ධ යම් වෙනත් තැනැත්තන් විසින් රහස්‍යභාව තබා ගැනීම කළ යුතුය.

එසේ වුව ද, මෙම උපවගන්තිය -

(අ) සමථකරණයට සම්බන්ධ තොරතුරු රහස්‍යභාවයෙන් තබාගැනීමේ අවශ්‍යතාව තොරතුරුවලට අදාල නොවන විටක දී ;

(ආ) පොදුවේ ලබා ගැනීමට තිබෙන විටක දී ;

(ඇ) පාර්ශ්වකරුවන් පාර්ශ්වකරුවන්ගේ ක්‍රියාකලාපයෙන් රහස්‍ය වශයෙන් නොසලකන විටක දී ;

(ඈ) උපවගන්තිය යටතේ නියම කරන ආනාවරණය කිරීමක් සිදු කිරීමට සමථකරු විසින් අපොහොසත් වුවහොත් තීරණය කිරීම සම්බන්ධයෙන් අදාල වන විටක දී;

අදාල නොවිය යුතුය.

**සමථ සැසිවාරයක දී ප්‍රකාශ ඉදිරිපත් කරන තැනැත්තාගේ වරප්‍රසාද**

**29.** සාක්ෂිකරුවකු අධිකරණයක් ඉදිරියේ කරන සාක්ෂි සම්බන්ධයෙන් ඒ සාක්ෂිකරුට හිමිකම් තිබෙන වරප්‍රසාදවලට මෙන් ම සෑම තැනැත්තකුටම සමථකරණ සැසිවාරයක දී ඉදිරිපත් කරන සාක්ෂි සම්බන්ධයෙන් ඒ සෑම තැනැත්තකුට ම සියලූ වරප්‍රසාදවලට හිමිකම් තිබිය යුතුය.

**සමථකරණ සැසිවාරයක දී කරන ප්‍රකාශය හෝ තොරතුරු වල ආවේශ්‍යතාව**

**29** (1) 2 වන සහ 3 වන උපවගන්තිවලට යටත්ව -

(1) වාණිජ ආරවුලක් සමථ කිරීමට පාර්ශ්වකරුවන් විසින් කරන ආරාධනාවක්, ආරවුල සමථ කිරීමට පාර්ශ්වයක කැමැත්ත හෝ ප්‍රතික්ෂේප කිරීම, සමථකරණය ආරම්භ වීමට පෙර පාර්ශ්වකරුවන් අතර හුවමාරු වන තොරතුරු සහ ආරවුල් සමථ කිරීමට ඇති කරගන්නා යම් එකගතාවක් ;

(2) සමථකරණය කිරීමේ කාර්ය සඳහා ම සකස් කරන ලේඛනයක් ;

(3) ආරවුල නිරවුල් කිරීමට තිබිය හැකි අවශ්‍යතාවන් සම්බන්ධයෙන් සමථකරණයේ දී පාර්ශ්වකරුවකු විසින් ප්‍රකාශ කළ හැකි අදහස් හෝ ඉදිරිපත් කළ හැකි යෝජනා ;

(4) සමථකරණයේ දී පාර්ශ්වකරුවකු විසින් කරන ප්‍රකාශ සහ පිළිගැනීම් ;

(5) සමථකරුවකු විසින් කරන ප්‍රකාශ හෝ නිරවුල් කිරීම සඳහා කරන යෝජනා ;

(6) සමථකරුවකු විසින් ඉදිරිපත් කරන නිරවුල් කිරීම සඳහා වන යෝජනාවක් පිළිගැනීමට පාර්ශ්වකරුවන් කැමැත්තක් පෙන්නුම් කරන්නේ ද යන කාරණය ;

ඇතුළුව සමථකරණ සැසිවාර වල දී යම් පාර්ශ්වයක් විසින් අනාවරණය කරන තොරතුරු හෝ ප්‍රකාශ අධිකරණය හෝ පරිපාලනමය නීති කෘත්‍යවල සාක්ෂි වල දී අනාවරණය කළ හැකි හෝ ආවේශ්‍ය නොවිය යුතුය.

(7) යම් පාර්ශ්වයක් හෝ සමථකරුවකු සමථකරණය අවසන් කිරීම.

2010. 16. වන පරිච්ඡේදය, 3 වන උපලේඛනය, 9 (1) වගන්තිය.

(2) 1 වන උපවගන්තියේ සඳහන් තොරතුරු =

(අ) නීතියක් ;

(ආ) යම් ගිවිසුමක් කරගෙන යාම හෝ බලාත්මක කිරීමේ කාර්ය සඳහා ;

(ඇ) හිමිකම් පෑමක් හෝ විෂමාචාරයකට ප්‍රතිචාර දැක්වීම පිණිස සමථකරුවකුට ; හෝ

(ඈ) සමථකරණයේ සියලු ම පාර්ශ්වකරුවන් එකඟ වී ඇති විටක දී සහ අදාල තොරතුරු සමථකරුට සම්බන්ධ වන විටක දී ;

සමථකරුට එකඟ වීමකට නියම කරන ප්‍රමාණයකට සාක්ෂිවල දී පිළිගත හැකිය.

(3) සමථකරණයට අදාල වන ආරවුල අවසානාත්මක වශයෙන් විසඳීමකට පසුව, සමථකරණය සාර්ථක වී නොමැති නිසා, කරගෙන යන ලද සමථකරණයේ හෝ නඩු කටයුතුවල ශාස්ත්‍ර තීරණය කිරීම සඳහා සමථකරණයට සම්බන්ධ පාර්ශ්වයේ පැවැත්ම හෝ සමථකරුගේ පැවැත්ම අනාවරණය කළ හැකිය.

**සමථකරයේ දී භාවිත වන වෙනත් තොරතුරු**

(4) ඉහත උපවගන්තියේ දක්වා ඇති සීමාකිරීම් හැර, සමථකරණයක් සඳහා නොවන කාරණයක් සඳහා ඇති කරන තොරතුරු, ඒ තොරතුරු සමථකරණයේ දී භාවිත කළ නිසා, ආවේශ්‍ය නොවන බවට පත් නොවේ.

**සමථකරුවකු හා බේරුම්කරුවකු වශයෙන් ක්‍රියා කිරීම**

**30.** සමථකරණයට සම්බන්ධ සියලු ම පාර්ශ්වකරුවන් අන්‍යාකාරයෙන් එකඟ වී ඇත්නම් මිස, සමථකරුවකු,

(අ) සමථකරණයට විෂය වන වාණිජ ආරවුලක් හෝ ;

(ආ) එකම ගිවිසුමෙන් හෝ නිතිමය සම්බන්ධතාවයෙන් හෝ පාර්ශ්වකරුවන් අතර ආශ්‍රිත ගිවිසුම හෝ නිතිමය සම්බන්ධතාව කරණ කොටගෙන උද්ගත වන වෙනත් ආරවුලක් ;

සම්බන්ධයෙන් සමථකරුවකු සහ බේරුම්කරුවකු යන දෙදෙනාගේ තත්ත්වයෙන් හෝ සමථකරුවකු වශයෙන් ක්‍රියා කිරීමෙන් පසුව බේරුම්කරුවකු වශයෙන් ක්‍රියා කිරීම නොකළ යුතුය.

**කාලාවරෝධය.**

**31** (1) යම් කවර ම වූ නඩු නිමිත්තක් සම්බන්ධයෙන් කාලාවරෝධයේ කාලසීමාව ගණනය කිරීමේ දී ,

(අ) ඒ නඩු නිමිත්ත සංයුක්ත වන වාණිජ ආරවුල සමථකරණය හා සාමාදානය මගින් විසඳීම පිණිස මධ්‍යස්ථානයට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් ආරම්භ වන කාලය ;

(ආ) එකී වාණිජ ආරවුලට අදාල සමථකරණ කටයුතු පාර්ශ්වකරුවන් අතර ගිවිසුමක් අන්‍යාකාරයෙන් අවසන් වන්නේ නම් මිස, අවසන් කරන දිනයෙන් අවසන් වන කාලය ;

යම් වෙනත් කවර ම වූ නීතියක ඊට පටහැනිව කුමක් සඳහන් වුව ද, නොසැලකිය යුතුය.

(2) යම් අධිකරණයක දී පවරන නඩුකරයක දී ඒ නඩුකරයට පාදක වන නඩු නිමිත්ත කාලාවරෝධ වන බවට යම් ගැටළුවක් උද්ගත වූ විටක දී,

(අ) ඒ නඩු නිමිත්ත සංයුක්ත වන වාණිජ ආරවුල සමථකරණයෙන් හා සාමාදානයෙන් විසදා ගැනීම පිණිස මධ්‍යස්ථානයට ඉල්ලීම කරන ලද ; සහ

(ආ) පාර්ශ්වකරුවන් අතර ගිවිසුමක් අන්‍යාකරයෙන් අවසන් කිරීමක් හැර වාණිජ ආරවුල සමථකරණයෙන් විසදීම පිණිස නඩු කටයුතු අවසන් කරන ලද දින ;

පිළිවෙලින් මණ්ඩලයේ සභාපතිවරයා සඳහන් කරමින් අත්සන් කරන ලද සහතිකයක්, අත්සන ඔප්පු කිරීමකින් තොරව, සාක්ෂිවල දී ආවේශ්‍ය වන අතර, ඒ සහතිකයේ සඳහන් කරුණුවලට සාක්ෂි විය යුතුය.

## IV වන කොටස
## නිරවුල් කිරීම හා නිරවුල් නොකිරීම
## නිරවුල් කිරීමේ ගිවිසුම බන්ධනීය වීම

**32** (1) යම් ආරවුලක පාර්ශ්වකරුවන් සමථයකට එකග වී ඇති අවස්ථාවක, ඒ සමථයේ කොන්දේසි,

(අ) පාර්ශ්වකරුවන් සිටින නිසා ලියවිල්ලකට සාරානුකූල කිරීම ;

(ආ) පාර්ශ්වකරුවන් විසින් අත්සන් කිරීම ;

(ඇ) සියලු ම පාර්ශ්වකරුවන් වෙත ලබා දීම : කළ යුතු අතර,

(ඇ) පාර්ශ්වකරුවන් අතර අනුගම්‍ය සහ වලංගු ගිවිසුමක් වශයෙන් නීතිය අනුව බලාත්මක වීම පිණිස අදාල කරගත යුතුය.

(2) සමථකරුවාගේ ගාස්තුව සහ වියදම් සම්බන්ධයෙන් පාර්ශ්වකරුවන් විසින් අන්‍යාකාරයෙන් එකග වී ඇත්නම් මිස, සමථ ගිවිසුමකින් -

(අ) සමථකරණයේ දී සමථකරු විසින් ඉටු කරන කාර්යභාරය සඳහා සමථකරුට ගාස්තු සහ වියදම් ගෙවීම පිණිස පාර්ශ්වකරුවෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් විසින් පොරොන්දුවකට ඇතුලත් වීම අඩංගු කිරීම ;

(ආ) ගෙවිය යුතු ගාස්තු හා වියදම් වටිනාකම හෝ ගාස්තු සහ වියදම් ගණනය කරන ආකාරය ගිවිසුමේ පාර්ශ්වයන්ගේ සහ වෙනත් ලේඛනවල එකග වී ඇති සියලු ම වටිනාකම් හා වෙනත් විචල්‍ය වටිනාකම් දැක්වීම ;

කළ හැකිය.

(3) 22 වන වගන්තිය යටතේ අධිකරණයක් විසින් යොමු කරන යම් ආරවුලක් සම්බන්ධයෙන් සමථයක් ඇති විටක දී, මධ්‍යස්ථානය විසින් එහි පිටපතක් අධිකරණයට යොමු කළ යුතු අතර, දිසා අධිකරණය විසින් අදාල පාර්ශ්වකරුවන්ට දැන්වීම ලබා දීමෙන් පසුව ඒ සමථය ප්‍රකාරව තීන්දු ප්‍රකාශය ඇතුලත් කළ යුතුය.

(4) සමථකරණය සිදු වන මධ්‍යස්ථානය, සමථ ගිවිසුමේ අතිරේක පිටපතක් ඒ සමථකරණ කටයුතු අවසන් කිරීමෙන් පසුව ගත වන වසර තුනක කාලයක් සිය භාරයේ තබා ගැනීම කළ යුතුය.

(5) සමථයේ පිටපතක් 2 වන වගන්තිය ප්‍රකාරව අධිකරණය වෙත යොමු කරන විටක දී, අධිකරණය අදාල ආරවුල්කරුවන්ට දැන්වීම භාර දීමෙන් පසුව ඒ සමථය අනුව තීන්දු ප්‍රකාශය ඇතුලත් කළ යුතුය.

(6) මෙම වගන්තියේ කාර්ය සඳහා -

"සමථ ගිවිසුම" යන්නෙන් සමථකරණයට අදාල එක් පාර්ශ්වකයකට වඩා වැඩි සංඛ්‍යාවක් විසින් අත්සන් කරන, පාර්ශ්වකරුවන්ගෙන් එක් පාර්ශ්වයකට වඩා අත්සන් කරන, සමථකරණයක දී ආරවුල් සහගත ගැටළුවක් හෝ ගැටළු ගණනාවක් විසදා අවසන් කරන ගිවිසුමක් අදහස් වේ.

**නිරවුල් නොකිරීමේ සහතිකය.**

**33** (1) ආරවුලක පාර්ශ්වකරුවන් යම් සමථයකට එකග නොවන විටක දී, ඒ ආරවුල සම්බන්ධයෙන් සමථකරණ ක්‍රියාවලිය කළමනාකරණය කළයුතු සමථකරුවකු හෝ සමථකරුවන් ඒ ආරවුල සමථකරණයෙන් විසදා ගැනීමට නොහැකි වූ බවට දක්වමින් නිරවුල් නොකිරීමේ සහතිකයක් නිකුත් කළ යුතුය. එවැනි සෑම සහතිකයක් ම අවස්ථාවෝචිත පරිදි සමථකරුවකු හෝ සමථකරුවන් විසින් අත්සන් කළ යුතුය.

(2) (1) වන වගන්තිය යටතේ නිකුත් කරන සහතිකයක් අධිකරණයක පවරන යම් නඩුවක දී හෝ නීති කෘත්‍යයක දී සාක්ෂි ලෙස ඉදිරිපත් කළ හැකි අතර, එය ඔප්පු කිරීම පිණිස එවැනි තැනැත්තකු සාක්ෂිකරුවකු ලෙස කැඳවීම අවශ්‍ය නොවිය යුතුය.

(3) සමථකරුවෙකු හෝ පත්වීම් බලධාරියෙකුගේ යම් නිලධරයකු යම් ආරවුලක් සම්බන්ධ යම් කවර ම වූ නීති කෘත්‍යයක සාක්ෂිකරුවකු වශයෙන් කැඳවීම නොකළ යුතුය.

(4) නිරවුල් නොකිරීමේ සහතිකයක යම් සමථකරුවකුගේ අත්සන, අව්‍යාජ වන බවට හා ඒ සහතිකය අත්සන් කරන සමථකරුට එසේ කිරීමට බලය තිබෙන බවට අධිකරණය විසින් සැලකිය යුතුය.

එසේ වුව ද, යම් පාර්ශ්වයක හෝ අන්‍යාකාරයෙන් වන ඉල්ලීමක් මත සහතිකය වාර්තා කරන හේතු මත යම් සමථකරුවකු අධිකරණයේ පෙනී සිටීම අවශ්‍ය වන බවට අධිකරණයේ මතය වන විටක දී, නිරවුල් නොකිරීමේ සහතිකය අත්සන් කිරීම සම්බන්ධයෙන් පමණක් සාක්ෂි දීමේ කාර්ය සඳහා එවැනි සමථකරුවකු කැඳවිය හැකිය.

34. සමථකරණය මගින් විසඳීම පිණිස මධ්‍යස්ථානය හෝ සමථකරු වෙත යොමු කර ඇති සෑම ආරවුලක් ම සමථකරණ කටයුතු ආරම්භ වීමේ දින සිට දින 90 ක් ඇතුළත අවසන් කිරීම පිණිස මධ්‍යස්ථානය හා සමථකරු සෑම පියවරක් ම ගැනීමට වග බලා ගත යුතුය.

## VII වන කොටස.

## බලාත්මක කිරීම

### සමථය බලාත්මක කිරීම

35 (1) සමථ ගිවිසුමක පාර්ශවකරුවකු සමථ ගිවිසුමේ කොන්දේසිවලට අනුකූල වීම පැහැර හැරීම කළ විටක දී, ඒ ගිවිසුම බලාත්මක කිරීමට කැමැත්තක් දක්වන අනෙක් පාර්ශ්වය ඒ ගිවිසුම අත්සන් කරන ලද සියලු ම පාර්ශ්වකරුවන්ට දැන්වීම ලබා දී -

(අ) එකී ගිවිසුම ප්‍රකාරව සමථ ගිවිසුම ලියාපදිංචි කිරීම, විනිශ්චය කිරීම සහ බලාත්මක කිරීම පිණිස වාණිජ සමථ මධ්‍යස්ථානය තුළ දිසා අධිකරණයට ඉල්ලීමක් ඉදිරිපත් කිරීම ; හෝ

(ආ) සමථ ගිවිසුම බලාත්මක කිරීම සඳහා වන ඉල්ලීමක් ඒ පාර්ශ්වකරුවන්ට භාර දෙන මුල් සමථ ගිවිසුම හෝ අධිකරණය සෑහීමකට පත් වන පරිදි සමථ මධ්‍යස්ථානය විසින් සහතික කරන සමථ ගිවිසුමේ සහතික කළ පිටපතක් ඉදිරිපත් කිරීම ;

කළ යුතුය.

(2) සමථ ගිවිසුම ලියාපදිංචි කිරීම සඳහා බලය ලබා දෙමින් කරන නියෝගයකට පසුව, ඒ සමථ ගිවිසුමේ මුල් පිටපත හෝ සහතික කළ පිටපත දිසා අධිකරණයේ රෙජිස්ට්‍රාර්යා හමුවේ ලියාපදිංචි කිරීමෙන් පසුව, සමථ ගිවිසුම අධිකරණයේ ලියාපදිංචි කරන අතර, එය ලියාපදිංචි කරන ලද දිනයේ දී

නඩු තීන්දුවක් ලබාගෙන දිසා අධිකරණයේ ඇතුළත් කරනු ලැබුවක් සේ සමාන බලයෙන් සහ ප්‍රතිඵලයෙන් පවතියි.

(3) මෙහි පහත සඳහන් කරුණු පෙන්නුම් කරන විටක දී, එනම් -

(අ) යම් ඉල්ලුම්කරුවකු විසින් එකී සමථ ගිවිසුම බලාත්මක කරන ලෙස ඉල්ලා සිටින්නේ යම් පාර්ශ්වයකට එරෙහිව ද, ඒ පාර්ශ්වය විසින් ඒ ඉල්ලුම්කරු විසින් බලාත්මක කරන සමථ ගිවිසුමට අත්සන් නොකිරීම හෝ අන්‍යාකාරයෙන් එය අත්සන් නොකිරීම හෝ අන්‍යාකාරයෙන් එහි අඩංගු නියමවලට එකඟ නොවීම නිසා; හෝ

(ආ) සමථ ගිවිසුම වංචාවෙන් ලබා ගැනීම නිසා; හෝ

(ඇ) සමථ ගිවිසුමේ විෂය වස්තුව වාණිජ ආරවුලක් ආකාරයෙන් සමථකරණයෙන් විසඳා ගැනීම මත ශක්‍යතාවයක් නොතිබීම නිසා; හෝ එය ශ්‍රී ලංකාවේ නීතියට පටහැනි වීම නිසා; හෝ

නඩු තීන්දුවක් ප්‍රදානය නොකළ යුතුය.

(4) අධිකරණයේ නියෝගවලට යටත්ව වලංගු නඩු තීන්දුවේ ප්‍රතිඵලය ප්‍රකාරව ඉහත කී පරිදි සමථ ගිවිසුම අධිකරණය වෙත ඉදිරිපත් කරන විටක දී, ඒ අනුව නඩු තීන්දුව ප්‍රදානය කරන විටක දී, පිස්කල්වරයාට සිවිල් නඩු විධාන සංග්‍රහයේ (101 වන අධිකාරය) **225(3)** වන වගන්තිය ප්‍රකාරව යථා පරිදි නිකුත් කරන ලද රිට් ආඥාවක් ක්‍රියාත්මක කිරීමක් වශයෙන් සැලකිය යුතු අතර, තීන්දු ප්‍රකාශය ක්‍රියාත්මක කිරීම සම්බන්ධ එකී සංග්‍රහයේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව බලාත්මක කිරීමට අදාළ කරගත යුතුය.

එසේ වුව ද, යම් වෙනත් ලිඛිත නීතියකට පටහැනිව කුමක් සඳහන් වුව ද, එය ක්‍රියාත්මක කිරීම නතර කිරීම නොකළ යුතුය.

(5) **3** වන වගන්තියේ සඳහන් රිට් ආඥාව ක්‍රියාත්මක කිරීම සමථ ගිවිසුම කරන ලද දින සිට වසර තුනක (03) කාලයක් වලංගු විය යුතු අතර, රිට් ආඥාව ක්‍රියාත්මක කිරීමට අදාළ සිවිල් නඩු විධාන සංග්‍රහයේ (101) වන අධිකාරය) නියම කර ඇති ආකාරයට එය ක්‍රියාත්මක කිරීම පිස්කල්වරයාගේ වගකීම විය යුතුය.

**අභියාචනා.**

**36** (1) මෙම වගන්තියේ **2** වන උපවගන්තියට යටත්ව, මෙම පනතේ බලාත්මක කිරීමේ කොටස යටතේ දිසා අධිකරණයේ නියෝගයක්, නඩු තීන්දුවක් හෝ තීන්දු ප්‍රකාශයක් හැර, මෙම පනත යටතේ අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමක දී, දිසා අධිකරණයේ යම් නියෝගයක්, තීන්දු ප්‍රකාශයක් සම්බන්ධයෙන් අභියාචනයක් හෝ ප්‍රතිශෝධනයක් නොතිබිය යුතුය.

(2) 1 වන වගන්තියේ සඳහන් දිසා අධිකරණයේ නියෝගයක්, නඩු තීන්දුවක් හෝ තීන්දු ප්‍රකාශයක් සම්බන්ධයෙන් අභියාචනාවක්, නීතියේ ප්‍රශ්නයක් තිබේ නම් සහ සිවිල් අභියාචනා

මහාධිකරණයේ අවසරය පළමුව ලබාගන්නේ නම් පමණක් ඒ සිවිල් අභියාචනා මහාධිකරණයට ඉදිරිපත් කළ යුතුය.

(3) සිවිල් අභියාචනා මහාධිකරණය මෙම වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ සිය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී දිසා අධිකරණයේ නියෝගයක්, නඩු තීන්දුවක් හෝ තීන්දු ප්‍රකාශයක් මෙම පනතේ විධිවිධානවලට යටත්ව ප්‍රතිශෝධනය කිරීම හෝ සුළු වශයෙන් වෙනස් කිරීම කළ හැකිය.

(4) සමථ ගිවිසුමේ පාර්ශ්වකරුවන් සමථ ගිවිසුමක් සම්බන්ධ අභියාචනාවක් කිරීමේ අයිතිය බැහැර කිරීමට ලියවිල්ලකින් එකඟ විය යුතුය.

## III වන කොටස

## පොදු විධිවිධාන

### වෙනත් නීති ප්‍රඥප්ති සමඟ ගැටීම

**37**. මෙම පනත සහ සමථකරණය නියම කරන හෝ ඊට බලය දෙන වෙනත් නීති ප්‍රඥප්තියක් අතර ගැටීමක් ඇති වූ විට ක දී, අනෙකුත් නීති ප්‍රඥප්ති බලාත්මක විය යුතුය.

### සමථකරුවාගේ වගකීම සහ මුක්තිය

**38** (1) සමථකරුගේ තත්ත්වයෙන් සමථකරුවකු විසින් කරන හෝ කිරීම අත්හරින යම් ක්‍රියාවක් සම්බන්ධ නොසැලකිල්ලකට සමථකරු වගකීම නොදැරිය යුතු නමුත්, එම තත්ත්වයෙන් කරන හෝ කිරීම පැහැර හැරීමක් වංචාව පිළිබඳ වගකීමකට යටත් විය යුතුය.

(2) වාණිජ සමථකරණ මධ්‍යස්ථානය හෝ සමථකරුවකු සද්භාවයෙන් නොකරන හෝ කිරීම අත්හරින යම් ක්‍රියාවක් හැර, මෙම පනත යටතේ ආයතනය හෝ සමථකරු සිය කටයුතු ඉටු කිරීමේ දී කරන හෝ කිරීම අත්හරින යම් ක්‍රියාවක් සඳහා සමථකරුට හෝ වාණිජ සමථකරණ මධ්‍යස්ථානයට එරෙහිව යම් කවර ම වූ අධිකරණයක නඩුවක් පැවරීම හෝ පවත්වාගෙන යාම නොකළ යුතුය.

### පාර්ශ්වකරුවකු මිය යාම.

**39**. (1) සමථ ගිවිසුමේ තත්කාර්ය සඳහා පටහැනි අපේක්ෂාවන් ප්‍රකාශ කරන්නේ නම් මිස, යම් ගිවිසුමක සමථ වගන්තියක පාර්ශ්වකරුවකු මිය ගිය විටක ගිවිසුම නිදහස් නොකළ යුතු අතර, සමථකරණය සංයුක්ත වන සමථකරුවන්ගේ මැන්ඩේට් පත්‍රය ඒ පාර්ශ්වකරුගේ මරණය නිසා අවලංගු නොවිය යුතු නමුත් අදාල ගිවිසුම මිය යන අයගේ බූදලයේ නෛතික නියෝජිතයා විසින් හෝ එරෙහිව බලාත්මක කළ යුතුය.

(2) යම් ක්‍රියාත්මක අයිතියක් තැනැත්තකුගේ මිය යාම මගින් අවසන් වන යම් ප්‍රඥප්තියක්, නියෝගක් හෝ රීතියක් ක්‍රියාත්මක කිරීම 1 වන වගන්තියට බලපෑමක් ඇති කිරීමක් ලෙස නොගත යුතුය.

## පරිච්ජින්න කිරීම

40 2000 අංක 44 දරන ශ්‍රී ලංකා වාණිජ සමථකරණ මධ්‍යස්ථාන පනත සහ 2005 අංක 37 දරන ශ්‍රී ලංකා වාණිජ සමථකරණ (සංශෝධන) පනත මෙයින් පරිච්ජින්න කරනු ලැබේ.

## අනනුකූලතාවක් ඇති වූ විටක සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

41. මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර අනනුකූතාවයක් ඇති වූ විටක, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය,
නො80, අධිකරණ මාවත,
කොළඹ 12. ශ්‍රී ලංකාව. දුක :-+94-112541193
ෆැක්ස් :-+94-112541193
ඊ මේල් :- ***info@judgesinstitute.lk***
වෙබ් :- ***www.judgesinstitute.lk***

இலங்கை நீதிபதிகள் நிறுவனம்,
இல.80(5ஆம் மற்றும் 6ஆம் மாடிகள்), அதிகரண மாவத்தை,
கொழும்பு 12, இலங்கை. - தொலைபேசி இலக்கம்: +94-112541193,
பக்ஸ்: +94-112541193,
மின்னஞ்சல் : info@judgesinstitute.lk
இணையத்தளம் :www.judgesinstitute.lk

***Sri Lanka Judges' institu te,***
***No.80, (5th & 6th Floors),Adhikarana Mawatha,***
***Colombo 12,Sri Lanka - Telephone: +94-112541193,***
***Fax: +94-112541193,***
***Email:info@judgesinstitute.lk***
***Web:www.judgesinstitute.lk***